# වාර්ෂික වාර්තාව

# 2017

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව -2017

**පටුන** | **පිටුව**


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | i |
| ඓතිහාසික පසුබිම | ii-vi |
| 2017 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය | vii |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | viii |
| 2017 වර්ෂය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය | ix |
| අධ්‍යක්ෂ මණ්ඩල සංක්ෂිප්ත සටහන | x |
| 2017 විගණන කමිටු වාර්තාව | xi |
| ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම් | xii |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල -2017 | xiii |

| | | |
|---|---|---|
| **01 -කොටස** | **පාලන වාර්තාව** | |
| **පළමුවැනි පරිච්ඡේදය** | **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම** | **(01-07)** |
| | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සංයුතිය හා කර්තව්‍යයන් | 02-03 |
| | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාන්‍ය පරිපාලන ව්‍යුහය | 04 |
| | මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය | 05 |
| | මූලස්ථාන මෙහෙයුම් අංශය | 06 |
| | සැලසුම් හා මෙහෙයුම් අංශය | 06-07 |
| | අභ්‍යන්තර විගණන අංශය | 07 |
| **දෙවැනි පරිච්ඡේදය** | **තාක්ෂණ සේවා අංශය** | **(08-25)** |
| | කාර්යභාරයන් | 08 |
| | ව්‍යාපෘති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම | 08-13 |
| | ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය | 14 |
| | මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය | 14-15 |
| | ජල කළමනාකරණ ලේකම් කාර්යාලය | 15-19 |
| | ඉඩම් පරිහරණ සැලසුම් අංශය | 20-23 |
| | වන හා පරිසර සංරක්ෂණ අංශය | 24-25 |

| | | |
|---|---|---|
| **තුන්වැනි පරිච්ඡේදය** | **සංවර්ධන අංශය** | **(26-52)** |
| | ඉඩම් අංශය | 26-28 |
| | කෘෂිකර්ම සංවර්ධන අංශය | 29-39 |
| | ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය | 40-41 |
| | ආයතන සංවර්ධන අංශය | 42-44 |
| | ව්‍යාපාර සංවර්ධන අංශය | 45-53 |
| **සිව්වැනි පරිච්ඡේදය** | **මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය** | **(54-67)** |
| | මානව සම්පත් කළමනාකරණ අංශය | 54-59 |
| | නීති අංශය | 59 |
| | මුදල් අංශය | 60.-63 |
| | මහවැලි ආරක්ෂක බලකාය | 64 |
| | මහවැලි කේන්ද්‍රය | 64-67 |
| | ප්‍රවාහන අංශය | 68 |
| **පස්වැනි පරිච්ඡේදය** | i කොටස ශ්‍රී ලං.ම.අ.යටතේ පිහිටුවනු ලැබූ සමාගම් | 69-70 |
| | ii කොටස වාර්ෂික ගිණුම් | 71-79 |
| | iii කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව | 80-110 |
| | iv කොටස විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම | 111-144 |
| | vi කොටස ශ්‍රී ලං.ම.අ. සමස්ථ කාර්ය සාධනය | 145-160 |

## දැක්ම

ගංගා නිම්න පදනම්කර ගත් ඒකාබද්ධ තිරසාර සංවර්ධනය කරා යන දකුණු ආසියාවේ විශිෂ්ඨතම ජාතික ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සමෘද්ධිය උදෙසා මහවැලි සහ අනෙකුත් විශේෂිත ප්‍රදේශවල භූමිය, ජලය, සියළුම ස්වාභාවික සම්පත් සහ මානව සම්පත ප්‍රශස්ත ලෙස පරිහරණය සඳහා නව්‍ය වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කිරීමට අනුබල දීම.

## ඓතිහාසික පසුබිම.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ.ටො. මිලියන 1.8ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ.ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ත පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුල සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක බෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංගා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහනයට ගෙන වියළි කලාපය මැදින් මුහුද වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංගාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියළි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම අධ්‍යයනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

## මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

### I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපේ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

## II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

## III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපේ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.

නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

## <u>මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)</u>

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එච් කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එච් කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යැම ප්‍රධාන ගැටළුවක් විය. රට තුල සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක් වූ අතර 31% ක් ආනයනය මත රඳා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී.

විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය.

මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

## මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධන කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙළින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත් , පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවෙට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත් ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී.

1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන ව්‍යාපෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

## මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැළසුම් (තෙවන සංවර්ධන අදියර)

මහවැලි සංවර්ධන වැඩසටහන රටේ සිව් දෙස ව්‍යාප්තවීමේ අදියර ලෙස තෙව සංවර්ධන අදියර හැඳින්විය හැකිය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය හරහා උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ, මධ්‍යම පළාත් වල කුඩා හා මධ්‍ය පරිමාණ වැව් 1200 කට ජලය සැපයීමේ

අරමුණින් මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ඇලහැර ප්‍රදේශයේ කුඹුරුවලට, පොළොන්නරු සියලු ප්‍රධාන ජලාශ වලට හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන ජලාශ වලට වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් ලබා දී නව වගා ඉඩම් හෙක්. 81,000 සඳහා ජලය සම්පාදනය කරමින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීම මගින් දැය ස්වයං පෝෂිත කිරීමට දායකවීමත්, එහි විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙ.වො. 25 ධාරිතාවක් එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවට දායක වීමත් මෙහි මූලික අරමුණු අතර වේ. එමෙන්ම ව්‍යාපෘතිය හරහා අවතැන් වූ ජනතාවට අවශ්‍ය ජනාවාස ඉදිකර දීමෙන් නොනැවතී සියලු යටිතල පහසුකම් සපිරි ලග්ගල නගරය අළුතින්ම ඉදිකර ජනතා අයිතියට පත් කිරීමේ මහඟු මෙහෙවරද මේ වන විට සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මස අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් අතරින් තවත් එක් පියවරක සාර්ථක නිමාවක් දකිනු ඇත.

මහවැලි සංවර්ධන අධිකාරිය තම කර්තව්‍ය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ මගින් උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය වැලිමඩ ප්‍රදේශයේ ඉදිකළ ජලාශ දෙකක එක්රැස් කර, දියවන්නේ ප්‍රථම වරට කි.මී. 15.6 ක දිගින් යුතු උමං මාර්ගයක් ඔස්සේ කිරිඳිඔය ද්‍රෝණියට හරවා යැවේ. එමගින් ආසියාවේ විශාලතම භූගත විදුලිබලාගාරය හරහා වාර්ෂිකව මෙ.වො. 120 ක විදුලි ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවට දායක වීමටත්, අති දුෂ්කර ඌව පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම හා ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම යන තම මූලික අරමුණු කරා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ගමන් කරමින් සිටී. මෙම ව්‍යාපෘතිය 2019 අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සක්‍රිය ජල කළමනාකරණ ව්‍යුහයට අන්තර්ගතවනු ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත ජලාශ හා අනෙකුත් ජලාශ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් මෙන්ම ජල පෝෂක ප්‍රදේශ, ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී.

සුනිත්‍ය බල ශක්ති වැඩ සටහන යටතේ මහවැලි ජලාශ වල පාවෙන සූර්ය බල ශක්ති පද්ධති සවි කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී ලෙස ජාතික බල ශක්ති අවශ්‍යතාවට දායක වීමටත් එමගින් විශාල අදායම් උත්පාදනයක් සිදු කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නව උපාය මාර්ගික ආදායම් මාර්ග හඳුනා ගනිමින් සිටී.

මේ අතරම මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වලව කලාපය, රඹකැන්ඔය, මහවැලි බී කලාපය, මහවැලි එච් කලාපය යන කලාප ආශ්‍රිතව තවත් දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තෙවන අදියරයේ සියලු මූලික අරමුණු ඉටු කර ගැනීමේ දී රටේ සිව් දෙස ව්‍යාප්ත වෙමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික, වාරිමාර්ග, පශු සම්පත්, බලශක්ති, පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍රවලින් උපරිම දායකත්වය ලබා දීමේ අදියර වෙත ක්‍රම ක්‍රමයෙන් ගමන් කරමින් සිටී.

**2017 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

| අනු අංකය | නම / තනතුර | කාලය |
|---|---|---|
| 01 | අනුර දිසානායක මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2017 ජනවාරි සිට<br>2017 මැයි දක්වා |
| 02 | එස්.එම්. ගෝඨාභය ජයරත්න මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2017 මැයි සිට<br>2017 දෙසැම්බර් දක්වා |
| 03 | ඉංජි. එස්. එස්.එල්. වීරසිංහ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2017 ජනවාරි සිට<br>පෙබරවාරි දක්වා |
| 04 | ඉංජි. එම්. තුරෙයිසිංහම් මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2017 මාර්තු සිට<br>ඔක්තෝම්බර් දක්වා |
| 05 | ඉංජි. එස්. මෝහන රාජා මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2017 නොවැම්බර්<br>දෙසැම්බර් දක්වා |
| 06 | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා<br>සහකාර අධ්‍යක්ෂ<br>භාණ්ඩාගාර අමාත්‍යාංශය | 2017 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |
| 07 | ඉංජි. ආර්. එම්. ඩබ්. රත්නායක මහතා<br>ලේකම්<br>වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2017 ජනවාරි සිට<br>පෙබරවාරි දක්වා |
| 08 | ඉංජි. එන් ඒ. සිසිර කුමාර මහතා<br>ලේකම්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ජල කළමනාකරණ | 2017 මාර්තු සිට<br>ඔක්තෝම්බර් දක්වා |
| 09 | ඉංජි. සී එච්. දේවේන්ද්‍රා මහත්මිය<br>අතිරේක ලේකම්<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 2017 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා |
| 10 | තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික | 2017 ජනවාරි<br>දෙසැම්බර් දක්වා |

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| අ/අ | තනතුරු නාමය | නම |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | අනුර දිසානායක මහතා (2017 ජනවාරි සිට 2017 මැයි දක්වා)<br>එස්. එම්. ගෝඨාභය ජයරත්න මහතා (2017 මැයි සිට 2017 දෙසැම්බර් දක්වා) |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) | - |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) | ඉංජි. කේ.ජී. පෙරේරා මහතා |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | - |
| 06 | අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) | කේ.සී.එස්. ප්‍රනාන්දු මහත්මිය |
| 07 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය) | ඉංජි. ඩී.සී.එස්. ඇලකන්ද මයා |
| 08 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය) | ඉංජි. ආර්.බී. තෙන්නකෝන් මයා |
| 09 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය) | ඉංජි. එම්.පී.එම්. පෙරේරා මයා |
| 10 | අධ්‍යක්ෂ (මුදල්) | ටී.ඩී.ප්‍රියන්ත මයා |
| 11 | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | - |
| 12 | අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) | අරුණ ප්‍රභාත් ලේකම්ගේ මයා |
| 13 | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | ඩබ්ලිව්.ඊ. ද මෙල් මයා |
| 14 | අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) | - |
| 15 | අධ්‍යක්ෂ (ඉඩම්) | ඩී.ඒ.ඒ.යූ.ගුණසේකර මයා |
| 16 | අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) | මහේන්ද්‍ර අබේවර්ධන මයා |
| 17 | අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) | - |
| 18 | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්) | ඉංජි. පී. තලගල මිය |
| 19 | අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන) | ඉංජි. කේ.ජී. පෙරේරා මයා |
| 20 | අධ්‍යක්ෂ (මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු) | - |
| 21 | අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) | ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය |
| 22 | අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) | එච්.එච්. ලීලානන්ද මයා |
| 23 | අධ්‍යක්ෂ (වන හා පරිසර) | එජ්.එම්.කේ.බී. අත්තනායක මයා |
| 24 | අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය) | ඉංජි. ජී.කේ.ටී. සමරතුංග මෙය |
| 25 | අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) | මහින්ද ගුණරත්න මයා |
| 26 | අධ්‍යක්ෂ (මූලස්ථාන මෙහෙයුම්) | ඩී.කේ.වී. විජේවීර මිය |
| 27 | අධ්‍යක්ෂ (ආරක්ෂක) | මේජර්. එල්.පී.ඒ. ජයවර්ධන මයා |
| 28 | අධ්‍යක්ෂ (නීති) | ආර්.එල්. රාජපක්ෂ මිය |
| 29 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( බී කලාපය) | එස්.ටී.දන්තනාරායන මයා |
| 30 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( සී කලාපය) | කේ.ඒ.සී.විමල් කුමාර මයා |
| 31 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ඩී කලාපය) | එම්.එම්.අසංක ගුණතිලක මයා |
| 32 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එල් කලාපය) | එච්.කේ.පී.ජයනාද මහතා |
| 33 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ජී කලාපය) | ඒ.එම්.එච්.බණ්ඩා මයා |
| 34 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එච් කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මහතා |
| 35 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වික්ටෝරියා කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මහතා |
| 36 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( හුරුළුවැව කලාපය) | කේ.ඒ.ජයසිංහ මයා |
| 37 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( රඹකැන්ඔය කලාපය) | ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා |
| 38 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වලව කලාපය) | ආර්.බී. සිරිසේන මයා |

## 2017 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචන සටහන.

මහවැලි සංවර්ධන බහුකාර්යය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවේ 1/3 කට අධික භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින මහවැලි බල ප්‍රදේශ තුල වාසය කරන ජනගහනය දශ ලක්ෂයකට ආසන්න ය. මහවැලි සංවර්ධන වැඩසටහනේ ආරම්භක අරමුණු අතර වියළි කලාපයේ කෘෂිකාර්මික, ධීවර, විදුලිබල, පශු සම්පත් යනාදි ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම, ගංවතුර පාලනය, නව රැකී රක්ෂා ජනනය ඇතුළුව බත බුලතින් රට සශ්‍රීක කිරීම ආදිය විය. වර්තමානය වන විට එම අරමුණු වලින් ඔබ්බට ගොස් කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම, කාර්යක්ෂම ජල කළමණාකරණය, වාරි පද්ධති හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම, මෙහෙයුම් හා නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කිරීම හා සූර්ය බලශක්ති නිෂ්පාදනය ඇතුළුව මේ වන තෙක් ක්‍රියාත්මක නොවූ එහෙත් මහවැලි සංවර්ධන සැලැස්මේ ඇතුලත් මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ ඇල සංවර්ධන ව්‍යාපෘතිය, උතුරුමැද ඇල සංවර්ධන ව්‍යාපෘතිය, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, මිණිපේ ඇල සංවර්ධන ව්‍යාපෘතිය, ඉහළ ඇලහැර ඇල යන ව්‍යාපෘති ක්‍රියාත්මක ය. මීට අමතරව වැලි ඔය, රිදී මාලියද්ද හා උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘති ද ක්‍රියාත්මක වෙමින් පවතී. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මේ වන විට ඉතා සාර්ථකව වැඩ අවසන් වෙමින් පවති. මේ මගින් ඩයරබා හා පුහුල්පොල ප්‍රදේශ වල ජලාශ දෙකක් ඉදිකර උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය කිරිදිඔය ද්‍රෝණියට හරවා යැවීම සිදුකෙරේ. එමගින් වාර්ෂිකව මෙගාවොට් 120ක විදුලි ධාරිතාවක් ජාතික විදුලි පද්ධතියට එක් කිරීමත්, දැනටත් රටේ අවම සංවර්ධිත ප්‍රදේශයක් වන මොණරාගල දිස්ත්‍රික්කය වෙත ජලය සැපයීම මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමටත් එම ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීමටත් බලාපොරොත්තු වේ.

මේ වන විට දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස විශාල ජලාශ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් හා ජල පෝෂක ප්‍රදේශ ගංහා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී. ඊට අමතරව ලෝක බැංකු ව්‍යාපෘතියේ තුන්වන අදියර යටතේ 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත රුපියල් මිලියන 3000 ට අධික මුදල් ආයෝජනයක් මගින් මහවැලි බල ප්‍රදේශ තුළ සුවිශාල සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය මගින් රුපියල් මිලියන 26,000 ක ආයෝජනයක්, දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය හරහා රුපියල් මිලියන 2145 ක ආයෝජනයක් හා වෙලි ආරක්ෂණ ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 5500 ක ආයෝජනයක්, මිණිපේ ඇළ, උතුරු මැද ඇළ හා වයඹ ඇළ යෝජනා ක්‍රමය හරහා ඉතිහාසයේ සිදුවූ දැවැන්තම මූල්‍ය ආයෝජනයක් සහිතව මහවැලි සංවර්ධන වැඩසටහන ඉතා ශක්තිමත් ප්‍රවේශයක් වෙත ගමන් කරමින් සිටී. එමෙන්ම රු. මිලියන 3000 ක වාර්ෂික ඉලක්ක ගත ආදායම ඉලක්ක කොට ගනිමින් විදුලි බල, වාණිජ ඉඩම්, ඛණිජ ද්‍රව්‍ය සැපයීම, මහවැලි ජලාශ 12 ක පාවෙන සූර්ය බල ශක්ති පද්ධති සවි කිරීම මගින් ජාතික විදුලි බල පද්ධතියට විදුලි බල උත්පාදනය යනාදිය අපේක්ෂිතව මෙම වර්ෂයේ කටයුතු ආරම්භ කොට ඇත. එමගින් රුපියල් මිලියන දහසක අදායම් උත්පාදනයක් සිදු කිරීමට අපේක්ෂිතය. මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බස්නාහිර පළාත හැර දිවයිනේ අනෙක් සෑම පළාතකම ව්‍යාප්ත වෙමින් දැවැන්ත වැඩසටහනක්ව ක්‍රියාත්මක වේ.

ඉහත කාර්යයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන දර්ශනය, මඟ පෙන්වීම සහ උපදේශකත්වය සපයන මහවැලි සංවර්ධන හා පරිසර ආමාත්‍යාංශ විෂය භාර ගරු අමාත්‍යතුමන් වන අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබෙන ධෛර්යය ඉතා අගය කොට සලකමි. එමෙන්ම ගරු මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා හා ආමාත්‍යාංශ ලේකම්තුමාගේ මෙහෙයවීම මත ඉහත ඉලක්ක සාර්ථකව ජය ගැනීම සඳහා කටයුතු කරන සමස්ථ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්ය මණ්ඩලය හා සමස්ථ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

**අධ්‍යක්ෂ මණ්ඩල සංක්ෂිප්ත සටහන.**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2017-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමඟ කාරුණිකව ඉදිරිපත් කරමු.

**වර්ෂය පිළිබඳ සමාලෝචනය.**

**අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර්ගත කර ඇත.**

**එසේම සංවිධානයේ වත්කම්, සුරැකීම්, වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොයා බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිළිබඳ මනා කළමනාකාරීත්වයකින් කටයුතු කර ඇත.**

**තවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කාර්ය මණ්ලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.**

ඉංජි. ආර්. එම්. ඩබ්. රත්නායක මහතා
ලේකම්
වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

ඉංජි. එස්. එස්. එල්. වීරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඉංජි. එස්. මෝහනරාජා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා
සහකාර අධ්‍යක්ෂ
වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ඉංජි. සී.එච්. දේවේන්ද්‍රා මහත්මිය
ලේකම්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික

## 2017 විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එහි සභාපතිත්වය මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරියෙකු විසින් දරනු ලබයි.

**වර්ෂය තුළ විගණන කමිටු සාමාජිකත්වය:**

- එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා - කමිටු සභාපති - භාණ්ඩාගාර නියෝජිත
- ඉංජි. එන්. ඒ. සිසිර කුමාර මහතා මහතා - සාමාජික
- තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික

**කමිටුව සඳහා සහභාගිත්වය:**

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)
- අධ්‍යක්ෂ (මුදල්)
- අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
- විගණකාධිපතිවරයා නියෝජනය කරමින් රජයේ විගණන අධිකාරි
- අවශ්‍යතාවය අනුව කැඳවුම් ලබන අනෙකුත් අදාල නිලධාරීන්

**කමිටුවේ කාර්යභාරය:**

❖ අභ්‍යන්තර පාලන ක්‍රියාදාම සුපරීක්ෂාව, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිසංවිධානය සඳහා උපදෙස් ලබාදීම හා වාර්ෂික විගණන සැලසුම අනුමත කිරීම.

❖ විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම, විගණන විමසුම් ආශ්‍රයෙන් පවතින ගැටළු හඳුනාගැනීම හා ගැටළු විසඳීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

❖ 1971 අංක 38 දරණ මුදල් පනතේ 142(ඇ) අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් මතු කර ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකර අධිකාරියේ අභ්‍යන්තර පාලන කටයුතු විධිමත් කිරීමට උපදෙස් ලබාදීම.

❖ ආයතනික කාර්ය සාධන වාර්තා කාර්තුමය වශයෙන් සමාලෝචනය හා සැසඳීම.

**අභ්‍යන්තර විගණන අංශය:**

මහවැලි අධිකාරියේ ඵලදායි කාර්යසාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය හා කාර්යසාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2017 වර්ෂය තුල විගණන කමිටු උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන සැලැස්මක් ඔස්සේ අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ අතර අකාර්යක්ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කරමින්, වංචා දූෂණ සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා මෙම අංශය තුලින් පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

**2017 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය**

- අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ වර්ෂය තුළ විගණන වාර්තා 19 ක් නිකුත් කිරීම.
- විමර්ශන 20 ක් පවත්වා විමර්ශන වාර්තා ලබා දීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
- විගණන විමසුම් සඳහා ලබාදුන් පිළිතුරු පසුවිපරම් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.

**නිර්දේශය:**

ඉහත කරුණු වලදී හඳුනාගත් ගැටළු නිවැරදි කිරීමට උපදෙස් දෙමින් කමිටුව විසින් සැපයූ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් ආයතනයේ නිවැරදි කිරීම් සිදුකිරීමට පියවර ගෙන ඇත.

## ඉකුත් වසර 07ක වත්කම් හා වගකීම්

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| | (රු. 000) | (රු. 000) | (රු. 000) | (රු. 000) | (රු. 000) | (රු. 000) | (රු. 000) |
| **වත්කම්** | - | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | - | | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | 4,116,187 | 4,195,724 | 4,294,893 | 4,259,208 | 4,549,301 | 3,733,498 | 4,011,792 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | | | | | | |
| නොනිමි වැඩ | 78,552 | 41,301 | 74,286 | 62,506 | 48,362 | 12,821 | |
| ආයෝජන | 187,531 | 178,556 | 152,577 | 175,359 | 166,731 | 135,392 | 135,392 |
| ජංගම නොවන වත්කම්වල එකතුව | 4,382,270 | 4,415,581 | 4,521,756 | 4,497,073 | 4,764,394 | 3,881,711 | 4,147,184 |
| | | | | | | | |
| ජෛව වත්කම් ප්‍රාග්ධන | 134,578 | 101,940 | | | | | |
| ලියා හැරීම් | 859 | 859 | | | | | |
| | | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | | |
| වට්ටෝරු/ තොග | 184,815 | 168,173 | 157,428 | 180,900 | 174,028 | 161,801 | 157,725 |
| ජෛව වත්කම් වෙළඳ | 15,875 | 22,630 | | | | | |
| ලැබිය යුත | 2,084,069 | 1,730,015 | 1,307,077 | 1,274,329 | 1,150,958 | 898,804 | 684,392 |
| කලින් ගෙවීම් | 3,896 | 8,754 | 5,172 | | 38 | 1,548 | 19,470 |
| බැංකු සුරැකම් | 6,164 | 4,153 | 1,372 | 837 | 905 | 2,210 | 2,160 |
| මුදල් සහ මුදල් සමායනයන් | 343,312 | 312,750 | 429,588 | 190,391 | 140,950 | 121,802 | 143,521 |
| ජංගම වත්කම් එකතුව | 2,638,131 | 2,246,475 | 1,900,637 | 1,646,457 | 1,466,879 | 1,186,165 | 1,007,268 |
| **මුළු වත්කම්වල එකතුව** | 7,155,838 | 6,764,855 | **6,422,393** | **6,143,530** | **6,231,273** | **5,067,876** | **5,154,452** |
| | | | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | | |
| ගෙවිය යුතු | 879,967 | 376,737 | 341,286 | 491,622 | 528,482 | 478,223 | 364,983 |
| ඒලයන්ස් මූල්‍ය සමාගම කල් බදු | 2,153 | 3,080 | | | | | |
| උපචිත වියදම් | 175,733 | 122,286 | 46,159 | 207,705 | 87,145 | 61,525 | 47,494 |
| **ජංගම බැරකම් එකතුව** | **1,057,853** | **502,103** | **387,445** | **699,327** | **615,627** | **539,748** | **412,477** |
| | | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| පාරිතෝෂිත දීමනා සදහා වෙන්කිරීම් | 1,388,101 | 1,489,288 | 1,551,379 | 1,311,876 | 1,157,688 | 1,077,205 | 1,022,674 |
| බැංකු ණය | | 2,455 | | | | | |
| විලම්බිත බදු | 612 | 612 | 612 | 612 | 612 | 612 | 612 |
| කල්බදු | 271 | 2,653 | 11,247 | 14,329 | 6,243 | 9,269 | |
| **ජංගම නොවන බැරකම් වල එකතුව** | 1,388,984 | 1,495,008 | 1,563,238 | 1,326,817 | 1,164,543 | 1,087,086 | 1,023,286 |
| **මුළු බැරකම්** | 2,446,837 | 1,997,111 | 1,950,683 | 2,026,144 | 1,780,170 | 1,626,834 | 1,435,763 |
| **ශුද්ධ වත්කම් එකතුව** | 4,709,001 | 4,767,744 | 4,471,710 | 4,117,386 | 4,451,103 | 3,441,042 | 3,718,689 |
| **ශුද්ධ වත්කම්** | | | | | | | |
| සමුච්චිත අරමුදල | 24,407,260 | 24,066,161 | 23,702,950 | 23,383,849 | 23,224,435 | 23,116,473 | 23,009,463 |
| ආදායම් සංචිත | (23,755,208) | 52,121 | 53,992 | 67,466 | 53,560 | 53,560 | 53,560 |
| ප්‍රත්‍යාගන ලාභය | 4,006,082 | 4,019,027 | 4,021,721 | 3,837,266 | 3,851,627 | 3,061,097 | 3,061,146 |
| ඉ/ගෙ අදායම් හා වියදම් ශේෂය | 50,865 | (23,369,566) | (23,276,474) | (23,171,205) | (22,678,520) | (22,787,889) | (22,405,480) |
| **ශුද්ධ වත්කම්/හිමිකම් එකතුව** | 4,708,999 | 4,767,743 | 4,502,189 | 4,117,376 | 4,451,102 | 3,443,241 | 3,718,689 |

### ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය - 2017

| අනු අංකය | සමාගම | සභාපති | අධ්‍යක්ෂ මණ්ඩලය | ප්‍රධාන කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|---|
| 01 | සී/ස මහවැලි පශුසම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | | 1. පරාක්‍රම අබේවර්ධන මයා<br>2. එඩ්වඩ් ද මැල් මයා (අධ්‍යක්ෂ)<br>3. ඔස්මන් ද සිල්වා (අධ්‍යක්ෂ) | අංක 260/20, බේස්ලයින් පාර, කොළඹ 09 |
| 02 | සී/ස මහවැලි උපදේශන සේවා කාර්යාංශය | Dr.හර්ෂ සමරවීර මයා | 1. කේ.එල්.එස්.සහබන්දු මයා<br>2. ඉංජි එල්.ආර්.එච්.පෙරේරා | අංක 11, ජාවත්ත පාර, කොළඹ 05 |
| 03 | ස්භාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම | Eng.ඒ.ඒ.වී.ඩයස් මයා | 1. ඉංජි.බී.ඩබ්.එන්.ඩබ්. සෙනෙවිරත්න බණ්ඩා<br>2. එන්.එම්.කේ.බී.අත්තනායක<br>3. එල්.එම්.ධර්මසිරි මයා<br>4. එම්.ජී.අබේරත්න බණ්ඩාර (සමාගම් ලේකම්) | වේල්ල පෙදෙස, පොල්ගොල්ල , මහනුවර |

# පාලන වාර්තාව

## I කොටස

# පළමු පරිච්ඡේදය
# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම.
# එහි සංයුතිය.

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍රස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම.
එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායි වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුබසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජන ක්‍රමය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන රජයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම් මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම.
- වත්කම් නඩත්තුව හා පරිපාලනය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුලින් වත්කම් අපහරණය කිරීම.
- කාලරාමුවකට අනුව මොරගහන්ද කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම.
- බී කලාපය දකුණු ඉවුර හා එල් කලාපයේ වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යයනයක් සිදුකිරීම.
- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කෘෂිකාර්මික ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදනය වැඩසටහන් දියුණු කිරීම හා රටේ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- වාරි පද්ධති නඩත්තුව හා කළමනාකරණය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිළිබඳ නිලධාරීන් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම.
- "සමෘද්ධිමත් දැයකට මහවැලි සත්ත්ව නිපැයුම්" තේමාව යටතේ මහවැලි ජනපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.
- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජනපදිකයන්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.
- සියළුම මට්ටම් වල නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිසනක ගත කර ඊ මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.
- රේඛීය ආයතන සමඟ සාකච්ඡා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුළින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලි නිෂ්පාදනය හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා ජලය වෙන් කර දීම.
- බී, සී, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව, වලව, වික්ටෝරියා සහ නව කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගීකරණය, සමාජආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.
- ජල කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය කෘෂිකාර්මික සංවර්ධනය පස සහ ජලය සංරක්ෂණය දියබෙත්ම කළමනාකරණය පාරිසරික දූෂණය හා ජල දූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රධාන ජලාශවල හැරවුම නිර්මිත සුරක්ෂිතාවය සිදු කිරීම සඳහා සඵලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ගොවි සංවිධාන දැනුවත් කිරීම.

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය.

- **අධ්‍යක්ෂ ජනරාල්**
  - **අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**
    - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)**
      - අධ්‍යක්ෂ - මූ.වැ.පා.ක්‍රි හා න. අංශය
      - අධ්‍යක්ෂ - ඉංජිනේරු නිර්මාණ
      - අධ්‍යක්ෂ - පහළ නිම්න සංවර්ධන
      - අධ්‍යක්ෂ - ගංගා ද්‍රෝණි කළමනාකරණ
      - අධ්‍යක්ෂ - වන හා පරිසර
      - අධ්‍යක්ෂ - ඉඩම් පරිහරණ සැළසුම්
      - අධ්‍යක්ෂ - ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
    - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)**
      - අධ්‍යක්ෂ - පිරිස් හා පාලන
      - අධ්‍යක්ෂ - මුදල්
      - අධ්‍යක්ෂ - නීති
      - අධ්‍යක්ෂ - මහවැලි කේන්ද්‍රය
      - අධ්‍යක්ෂ - මහවැලි ආරක්ෂක බලකාය
    - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)**
      - අධ්‍යක්ෂ - ඉඩම්
      - අධ්‍යක්ෂ - කෘෂිකර්ම
      - අධ්‍යක්ෂ - ආයතන සංවර්ධන
      - අධ්‍යක්ෂ - ව්‍යාපාර සංවර්ධන
      - අධ්‍යක්ෂ - පශු සම්පත් සංවර්ධන
    - නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන්
      - බී,සී,ඩී,එච්,එල්, මොරගහකන්ද, වික්ටෝරියා, රඹකැන්ඔය, හුරුළුවැව, වලව
    - අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක
    - අධ්‍යක්ෂ - සැළසුම් හා මෙහෙයුම්
    - අධ්‍යක්ෂ - මූලස්ථාන මෙහෙයුම්

## මහවැලි කලාප - ව්‍යුහය හා පරිපාලනය

මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇති කරන ලද ජනාවාස පරිපාලනය වාරි පද්ධති මෙහෙයවීම නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නය ආශ්‍රිතව බී,සී,ඩී,එච්, මොරගහකන්ද, වික්ටෝරියා, හුරුළු වැව යන කලාපද උඩවලව, වැලිඔය (එල් කලාපය) සහ රඹුක්කන්ඔය කලාප වැනි විශේෂ කලාප ද මෙසේ ආරම්භ කර ඇත.

මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමනාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.

එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ, ඉඩම්, කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරීන් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාස කළමනාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාස කළමනාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු, ආයතන සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියලු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරීම හා එක් එක් ඒකකයකට එක් ඒකක කළමනාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් 250-300 අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරීම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදුකරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුව ය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ පසු කටයුතු ද සිදු කරනු ලැබේ. මීට අමතරව වාණිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේ ද, මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම් ලබා දීම ද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමනාකරණය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව, කළමනාකරණය හා වැඩි දියුණු කිරීම ද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය ගොවිපල සංවර්ධනය, පුහුණු හා ආදර්ශ කටයුතු ද පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු ව්‍යාපෘති සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම, වාණිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපීය පරිපාලනය යටතේ සිදු කෙරේ.

## 1.3 අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකරණය වන අංශ:

- මූලස්ථාන මෙහෙයුම් අංශය
- සැලසුම් හා මෙහෙයුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 1.3 1 මූලස්ථාන මෙහෙයුම් අංශය

**කාර්යභාරයන්**

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එහි කාර්යයන් සම්බන්ධ සියලු අදාළ කටයුතු මෙහෙයවීම.
- ආයතනයට ලැබෙන තැපැල සම්බන්ධීකරණය කළමනාකරණය හා පසු විපරම
- අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන සියලූම අභ්‍යන්තර හා බාහිර රැස්වීම් සම්මන්ත්‍රණ ආදිය සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- කලාපීය ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට අදාළ කටයුතු හා විදේශ ආධාර දූත මණ්ඩල පැමිණීම් වලට අදාළ සංවිධාන කිරීම හා මෙහෙයවීම.
- විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යභාරයන්ට අදාළ පාර්ලිමේන්තුව, ජනාධිපති කාර්යාලය හා මුදල් අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් සියළු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ජාත්‍යන්තර ආයතන ආදි සියලූම ආයතන සම්බන්ධීකරණය.
- අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් වලට අනුව ක්‍රියා කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම ප්‍රාදේශීය හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කටයුතු වල තීරණ තහවුරු කිරීම.
- විධායක කළමනාකරණ/ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය ලේඛන ගත කිරීම හා තීරණ දැනුම් දීම.
- විශේෂ ව්‍යාපෘති සම්බන්ධ ව්‍යාපාර මෙහෙයුම් කමිටු පැවැත්වීමට අදාළ සම්බන්ධීකරණය.

### 1.3 2 සැලසුම් හා මෙහෙයුම් අංශය

**කාර්යභාරයන්**

- ආයතනයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරීම.
- විශේෂ ව්‍යාපෘති වාර්තා සැකසීම හා ආර්ථික සාමාජීය සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරීම. ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධීකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරීම.

- තාක්ෂණ වාර්තා, ශක්‍යතා වාර්තා මෙහෙයුම් හා ඇගයීම් වාර්තා සංරක්ෂණය හා භාවිතයට ලබා දීම.
- මහවැලි පරිගණක ජාලය මෙහෙයවීම නඩත්තුව හා නිල වෙබ් අඩවිය ස්ථාපිත කිරීම. යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ සහාය පැතීම.
- බලපෑමට ලක්වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධීකරණය කිරීම.

## 1.3 3 අභ්‍යන්තර විගණන අංශය

**කාර්යභාරයන්**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර ප්‍රතිපත්ති චක්‍ර ලේඛන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍යාමය විධිවිධාන හා මුදල් සහ ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති සහ නීති රීති ව්‍යවස්ථා හා කළමනාකරණ තීරණ වලට අනුකූලව අභ්‍යන්තර විගණන විෂය පථය සකස් වී ඇත.

ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ඨි කෝණයකින් මෙන්ම කළමනාකරණ දෘෂ්ඨි කෝණයකින් ද යුතුව ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම. විගණනය හා වාර්තා කිරීම.

වැඩ යෝජනා ක්‍රම ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩසටහන් නියමිත කාල රාමුව තුළ කොතෙක් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත්දැයි නිරන්තරව ඇගයීම් කිරීම.
අදාළ කාලවකවානුව තුළ සිදුකළ යුතු වැඩ ක්‍රියාත්මක වීම ප්‍රමාද වීමට තුඩු දෙන ගැටළු සහගත ක්ෂේත්‍රයන් පිළිබඳ යාවත් කාලීනව ස්ථානීය විමර්ශනයක් පැවැත්වීම.

මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීමෙහිලා භාවිතා කරනු ලබන කළමනාකරණ ක්‍රමවේදය සහ පාලනයන් ඇගයීම හා සමාලෝචනය කිරීම.

# දෙවන පරිච්ඡේදය
## තාක්ෂණ සේවා අංශය

### 2.0 කාර්යභාරයන්

1. සංයුක්ත සැලැස්ම / වාර්ෂික සැලැස්මට අනුව අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.
2. තාක්ෂණික සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මඟ පෙන්වීම සහ මෙහෙයවීම.
3. ප්‍රධාන වේලි හා ජල හැරවුම් මාර්ග සහ පහළ නිම්න ප්‍රදේශයේ වාරි පද්ධතිය ඇතුළුව භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂාව තහවුරු කිරීම.
4. ජලාශ සහ වාරි පද්ධති හරහා කෘෂිකාර්මික කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සඳහා ඇති ජල ප්‍රමාණය නිසි කලට සපයා දීම සඳහා විධිමත් සැලසුම් පිළියෙල කිරීම.
5. ව්‍යාපෘති සැලසුම් කිරීම ශක්‍යතා ඇගයීම මෙහෙයවීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.
6. පෞද්ගලික අංශය දායක කර ගනිමින් කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම.

මූලික වශයෙන්ම ඉහත දැක්වූ ප්‍රධාන ක්‍රියාවලින් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ සේවා අංශය කටයුතු කරන ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ මෙම අංශය මඟින් පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

### 2.1 <u>ඉංජිනේරු නිර්මාණ සැලසුම් අංශයේ කාර්යභාරය.</u>

2.1.1 නියමිත කාර්යන්

1. සංවර්ධනය කරන ලද සහ යෝජිත ව්‍යාපෘති වල ඉංජිනේරු නිර්මාණ සහ සැළසුම් සකස් කිරිම.
2. ඉහත ව්‍යාපෘති වල යටිතල පහසුකම් සඳහා අවශ්‍ය සැළසුම් සහ සහ ඉංජිනේරු නිර්මාණ සැළසුම් කිරිම.
3. නිර්මාණ හා සැළසුම් වලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රමාණ බිල්පත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කොන්ත්‍රාත් කළමනාකරණ අංශයට ඉදිරිපත් කිරිම.
4. රාජ්‍ය හා පුද්ගලික ව්‍යවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ජල ව්‍යාපෘති යෝජනා හා සැළසුම් විශ්ලේෂණය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිම.
5. ඉංජිනේරු නිර්මාණ හා සැළසුම්කරණය පිළිබඳ නවක ඉංජිනේරුවරුන් පුහුණු කිරීම සහ සැළසුම් අංශය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගත් තත්වයන් යටතේ පවත්වාගෙන යාම.
6. සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ ගොඩනැගිලි හා උද්‍යාන අලංකරණ සංවර්ධන කටයුතු වලට අදාළ ගෘහ නිර්මාණ සැළසුම් ඇස්තමේන්තු පිළියෙල කිරීම.

### 2.1.2 2017 වර්ෂයේ ඉංජිනේරු නිර්මාණ සැලසුම් අංශය මඟින් කරන ලද ඉංජිනේරු සැළසුම්

2.1.2 වාරිමාර්ග නිර්මිත සැලසුම් සහ මහාමාර්ග සැළසුම්

1. මැදිරිගිරිය පලුගස්වැවට ජලය සැපයීම සඳහා අවහැරුම් නිර්මිතය.
2. මැදිරිගිරිය උප අතු ඇළ හරහා කි.මී. 10+320 හි පාලම.

3. මැදිරිගිරිය උප අතු ඇළෙහි යටි පැන්නුම් නිර්මිත (DUC) 9 ක් කි.මී. 13+260, 14+650, 8+715, 8+290, 14+650, 1+600, 2+230, 0+653, 8+290,
4. සුදු ගඟෙහි පාලමක් අලුත්වැඩියා කිරීම සඳහා සැළසුම් සහ ඇස්තමේන්තු
5. මැදිරිගිරිය දහම්වැව ඒකකයේ වැව් අංක 2 හි පිටවාන.
6. මැදිරිගිරිය නබඩවැව ඒකකයේ වැව් අංක 4 හි පිටවාන.
7. කළුගඟ දකුණු ඇළෙහි D2 අවහැරුම් නිර්මිතය.
8. කළුගඟ දකුණු ඇළ යටිපැන්නුම් නිර්මිතය කි.මී. 0+653, 2+813, 3+810.
9. මැදිරිගිරිය නබඩවැව ඒකකයේ වැව් අංක 1 සැළසුම් කිරීම (සියළු නිර්මිත සමඟ)
10. කළුගඟ දකුණු ඇළ හරහා කි.මී. 1+240 හි පාලමක්.
11. මැදිරිගිරිය උප අතු ඇළෙහි කි.මී. 15+700 අවහැරුම් නිර්මිතය.
12. කළුගඟ දකුණු ඇළ කි.මී. 0+976 වැහි ජලය එකතු වීමේ (Drain Inlet) නිර්මිතය.
13. කළුගඟ දකුණු ඇළ හරහා කි.මී. 3+300 හි පාලම.
14. වැලිඔය පරාක්‍රමපුර පාරෙහි කොටසක් අලුත්වැඩියා කිරීම සඳහා සැළසුම් සහ ඇස්තමේන්තුව.
15. වැලිඔය හැළඹවැව පාරෙහි සැළසුම් යාවත්කාලීන කිරීම.
16. මැදිරිගිරිය බණ්ඩාරවැව ඒකකයේ කුඹුරු කට්ටි සැළසුම් කිරීම.
17. මැදිරිගිරිය උප අතු ඇළෙහි අවසන් රෙගියුලේටරය (End Regulator) .
18. බී කලාපයේ මිරිදිය මධ්‍යස්ථානයට ලබා දෙන ජල මිණුම් නිර්මිතය.

### 2.1.3. ගොඩනැගිලි සැලසුම්

1. යෝජිත මැදිරිගිරිය ක්‍රීඩාපිටිය සහ ප්‍රධාන ප්‍රේක්ෂකාගාරය, උප ප්‍රේක්ෂකාගාර 4 ක් එහි ඇස්තමේන්තු.
2. රඹකැන්ඔය පුහුණු මධ්‍යස්ථානය.
3. මැදිරිගිරිය නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය.
4. දාස්ගිරිය රෝහලෙහි මුළුතැන්ගෙය (Kitchen)
5. මැදිරිගිරිය නේවාසික ව්‍යාපාර කළමනාකාර නිළ නිවස.
6. මැදිරිගිරිය සංචාරක බංගලාව.
7. මොරගහකන්ද ප්‍රාථමික විද්‍යාලය සඳහා පරිගණක කාමරය, පුස්තකාලය, ගුරු විවේකාගාරය.
8. ලග්ගල ක්‍රීඩාපිටිය, ප්‍රධාන ප්‍රේක්ෂකාගාරය, උප ප්‍රේක්ෂකාගාර.
9. මැදිරිගිරිය රෝහල සඳහා (Steel roof truss)

### 2.1.4. කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති වල සැලසුම් විශ්ලේෂණය කිරීම

1. කුඹල්ඔලුව ජල විදුලි ව්‍යාපෘතිය.
2. දිග්ගල ජල විදුලි ව්‍යාපෘතිය.
3. ලත්පඳුර ජල විදුලි ව්‍යාපෘතිය.
4. අඹන්ගඟෙහි මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය.
5. මැදගම ජල විදුලි ව්‍යාපෘතිය.
6. කිවුල ජල විදුලි ව්‍යාපෘතිය.

**2.1.5** **වර්ෂය දක්වා කරන ලද සැලසුම්**

**2.2.4.1** **<u>වාරිමාර්ග</u> සැලසුම්**

1. කළුගඟ RBMC$_1$ ප්‍රධාන ඇළ කි.මී. 0+000 - කි.මී. 5+550.
2. RBMC$_1$ ඇළ යටි පැන්නුම් නිර්මිත 5 ක් කි.මී. 0+650,1+265, 3+700, 3+810, 4+ 350
3. කළුගඟ LC$_2$ ජලය පිටකිරීමේ නිර්මිතය (Outlet).
4. කළුගඟ LC$_3$ ට ජලය ඇතුළුවීමේ නිර්මිතය (Inlet) සහ පිටවීමේ නිර්මිතය (Outlet).
5. කළුගඟ RBMC$_1$/FC$_3$ අවහැරුම් නිර්මතය.
6. කළුගඟ RBMC$_1$/D$_2$ අවහැරුම් නිර්මතය.
7. කළුගඟ RBMC$_2$ ඇළ කි.මී. 0+000 - කි.මී. 3+260
8. RBMC$_2$ /D$_5$ , D$_6$ අවහැරුම් නිර්මිත.
9. RBMC$_2$/FC$_4$ , FC$_5$, FC$_6$ අවහැරුම් නිර්මිත.
10. RBMC$_2$ ඇළ යටිපැන්නුම් නිර්මිතය කි.මී. 3+260.
11. RBMC$_2$ අවසාන රෙගියුලේටරය.

**2.1.6.1** **<u>ගොඩනැගිලි</u> සැලසුම්**

1. අඹන රෝහලෙහි OPD ගොඩනැගිල්ල.
2. අඹන රෝහලෙහි ගැහැණු/පිරිමි වාට්ටු.
3. අඹන රෝහලෙහි කුස්සිය (Kitchen).
4. අඹන රෝහලෙහි මෘත ශරීරාගාරය.
5. මැදිරිගිරිය ක්‍රීඩාපිටිය සඳහා ඔලිම්පික් පහන, කොඩිකණු ආධාරකය.
6. පොදු මහවැලි හෙළ බොජුන්හල.

**2.1.7** **<u>වාස්තු විද්‍යා ඒකකය</u>**

**2.1.7.1** **මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියට අදාලව**

- ලග්ගල නගරයේ යෝජිත සංස්කෘතික මධ්‍යස්ථානය සහ රංග ශාලාව
- ලග්ගල නගරයේ ඉදිවන පාසලට රැස්වීම් ශාලාවක්
- නව ක්‍රීඩා සංකීර්ණය - ලග්ගල

  Including Main Pavilion, 4 No's of spectator galleries, Olympic Lamp & Flag Post, Entrance

**2.1.7.2** **මොරගහකන්ද -කළුගඟ ව්‍යාපෘතියට අදාලව (මැදිරිගිරිය -බිසෝපුර)**

- නව නේවාසික කළමණාකරණ කාර්යාලය - RPM Office
- නව ක්‍රීඩා සංකීර්ණය - මැදිරිගිරිය

  Including Main Pavilion, 4 No's of spectator galleries, Olympic Lamp & Flag Post, Entrance
- නව බස් නැවතුම්පල
- නව පොල සංකීර්ණය

  Including main building, Fish stall, toilets, washing area

#### 2.1.7.3 මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතියට අදාලව (අඹන)

- බාහිර රෝගී අංශය (OPD) - අඹන රෝහල
- කාන්තා පිරිමි වාට්ටු සංකීර්ණය, මුළුතැන්ගෙය, මෘත ශරීරාගාරය - අඹන රෝහල
- උප තැපැල් කාර්යාලය
- නව පොල සංකීර්ණය
  Including main building, Fish stall, toilets, washing area
- දෙමහල් ගොඩනැගිල්ල -කුඹියන්ගහඇල පාසල
  Including 4 class rooms & conference Hall

### 2.1.8 Type Drawings and Estimates

- හෙළ බොජුන්හල
- Grade II නිල නිවස

## 2.1.2 පහළ නිම්න සංවර්ධන කටයුතු

මහවැලි බල ප්‍රදේශයන් හි ඇති වාරි පද්ධති මෙහෙයවීම සහ නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු කිරීම සහ කළමණාකරනය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාල ඉදිකිරීම්, ඇස්තෙම්න්තු කිරීම්, ඉදිකිරීම් තත්ව පාලනය කිරීම් සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යන් වේ.

- 2017 වසර සඳහා මහාභාණ්ඩාගාරය විසින් ඒ ඒ කලාපය සඳහා වෙන් කල ප්‍රතිපාදන වැය කිරීම් පහත පරිදි වේ.

### 2.1.3 ව්‍යාපෘති යටතේ :-

| අනු අංකය | ව්‍යාපෘතිය | 2017 වර්ෂෙය් තා/සේ අංශයට වෙන් කල මුදල රු. මිලියන | 2017 වසරේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | රිදිමාලියැද්ද සංවර්ධන ව්‍යාපෘතිය | 73 | 63.33 | 87% |
| 2 | රඹකැන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය | 60.5 | 65.42 | 100% |
| 3 | වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | 267.92 | 237 | 81% |
| 4 | ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය | 485.8 | 493.2 | 100% |
| 5 | මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය | 140.9 | 135 | 95% |
| 6 | කුඩා හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 273.50 | 233.56 | 85% |
| 7 | කිවුල් ඔය ව්‍යාපෘතිය | 25 | 18.75 | 75% |

**2.1.4** ආයතනික ප්‍රාග්ධනය යටතේ :-

| අනු අංකය | කලාපය/ අංශ | 2017 වර්ෂෙය් තා/සේ අංශයට වෙන් කල මුදල රු. මිලියන | 2017 වසරේ මුලා ප්‍රගතිය රු. මිලියන | මූලා ප්‍රගතිය % |
|---|---|---|---|---|
| කලාපය | | | | |
| 1 | බී | 115 | 105 | 100% |
| 2 | සී | 144.1 | 105 | 75% |
| 3 | ඩී | 47.2 | 38.23 | 86% |
| 4 | ජී | 31.44 | 24 | 72% |
| 5 | එච් | 84.11 | 73.92 | 71% |
| 6 | එල් | 9.689.8 | 9.83 | 101% |
| 7 | වලව | 86.3188.59 | 83.4 | 96% |
| 8 | හුරුළු වැව | 91.2981.64 | 65.1 | 71% |
| 9 | රඹකැන් ඔය | 21.9 | 21.9 | 100% |
| 10 | වික්ටෝරියා | 46.48 | 49.57 | 100% |
| අංශ | | | | |
| | ප්‍රධාන කාර්යාලය (තා/සේ) | 92.93 | 87.0 | 94% |
| 1 | යාන්ත්‍රික වැඩපල තඹුත්තේගම | 5 | 5 | 100% |
| 2 | ගංගාද්‍රෝණි කළමනාකරණ අංශය | 3 | 3 | 100% |
| 3 | මූලික වැඩපාලන ක්‍රියාකරවුම් සහ නඩත්තු ඒකකය | 175.5 | 204.45 | 100% |

**2.1.5** <u>කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය</u>

මහවැලි ගඟ හා ඊට සම්බන්ධ අතු ගංගා වල ජලය උපයෝගී කොට ගෙන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ක්‍රියාත්මක වේ. මෙයින් ජනනය කරන විදුලිය ලංකා විදුලි බල මණ්ඩලය යටතේ ඇති ජාතික විදුලිබල පද්ධතියට (National Grid) සපයනු ලැබේ. මාස්පතා සපයනු ලබන මෙම විදුලි ඒකක ප්‍රමාණය අනුව ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය විසින් එම සැපයූ විදුලි ඒකක ප්‍රමාණයට ගෙවීමක් එම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ ආයෝජකයාට ගෙවනු ලබන අතර ආයෝජකයා විසින් ප්‍රතිශතයක් මහවැලි ගඟේ ජලය භාවිතා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවනු ලැබේ.

මේ දක්වා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 11 ක වැඩ නිමවා ඇති අතර එයින් මෙගාවොට් 33.35ක ප්‍රමාණයක් ජාතික විදුලි පද්ධතියට තම දායකත්වය සපයයි. එමඟින් මහවැලි අධිකාරියට මහවැලි ජල හැරවුම් අයිතිය වෙනුවෙන් ගෙවනු ලබන බද්ද ලෙස යම් ප්‍රතිශතයක් හිමිවේ.

මීට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය සහිතව කුඩා පරිමාන ජල විදුලි බලාගාර 10 ක් ඉදිකරමින් පවති. (5.1)

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය රහිතව ඉදිකරන ලද කුඩා පරිමාන ජල විදුලි බලාගාර 46 දැනට වාර්තා වී ඇති අතර තවත් ජල විදුලි බලාගාර ඉදිවෙමින් පවතී.

## ඉදිකරමින් පවතින කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වල ප්‍රගති වාර්තාව
## (2017 වර්ෂයේ)

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ආයෝජකයාගේ නම | ධාරිතාවය / MW | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | Ukuwela | Onyx Hydro Power Company (Pvt) Ltd. | 2.2 | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවෙන් ජනන බලපත්‍රය (Generation License) ලබා ගැනීමේ කාර්යය සිදු කරමින් පවතී. |
| 2 | Ankanda | Escas Ankanda Power (Pvt) Ltd. | 6.5 | ඉදිකිරීම් කටයුතු බොහෝ දුරට අවසන්ව ඇත. |
| 3 | Diggala | Escas Diggala Power (Pvt) Ltd. | 4.4 | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| 4 | Kiula | Escas Kiula Power (Pvt) Ltd. | 2.8 | සැලස්ම වෙනස් කිරීම නිසා නව පාරිසරික ඇගයීමක් (EIA) සිදු කළ යුතුව ඇත. |
| 5 | Nayakkubura | Ralic Hydro Power Generation (Pvt) Ltd. / N.G.P. Panditharathna | 0.5 | මෙම ව්‍යාපෘතිය සඳහා ආයෝජකයින් දෙදෙනෙකු ඉදිරිපත්ව ඇති බැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීමට නීතිපති උපදෙස් ලබාගැනීම සඳහා යොමු කර ඇත. |
| 6 | Chandrikawewa | Mahaweli Consultancy Bureau (Pvt) Ltd. | 0.63 | පාරිසරික ඇගයීම (EIA) අවසන් කර ඇත. |
| 7 | Kubaloluwa I | Noorwood Hydro Power (Pvt) Ltd. | 2.4 | මෙම ව්‍යාපෘති දෙක සුදු ගඟෙහි ආසන්නව පිහිටා ඇති බැවින් ව්‍යාපෘති දෙකම එකවර ක්‍රියාත්මක කරවීමේ ගැටළුවක් පවතී. ව්‍යාපෘති දෙකෙහි ශක්‍යතාවය අධ්‍යනය කිරීම සඳහා බිම් මැනුමක් ( Survey) සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |
| 8 | Kubaloluwa II | Kumballoluwa Hydro Power (Pvt) Ltd. | 1 | |
| 9 | Maduruoya offtake of LBL3 | Nippon Knit (Pvt) Ltd. | 0.15 | පාරිසරික ඇගයීම (EIA) සිදු කරමින් පවතී. |
| 10 | Moragolla Mini Hydro Power Project | Zhejiang Young Energy Co. (pvt) Ltd. | 2.1 | පාරිසරික ඇගයීම (EIA) සිදු කරමින් පවතී. |

## 2.2 ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය.

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ජල තත්ත්ව විද්‍යාගාරය මගින් කලාවැව, කණ්ඩලම,දඹුළු ඔය, බෝවතැන්න, චන්ද්‍රිකා වැව යන ජලාශ වල හා කලාපයන් හි කුඩා වැව් වල මෙන්ම මහවැලි පද්ධතිය සහ සම්බන්ධ තෝරා ගත් ජලාශවල ජලයේ ගුණාත්මක බව මාසිකව පරීක්ෂාව සිදුකිරීම. මහවැලි කලාප හා ඉන් බාහිර ජල ප්‍රභවයන්හි ජල නියැදි පරීක්ෂාවට ලක්කර පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේදී එම ආයතන මගින් මුදා හැරෙන අප ජලය පිළිබඳව වාර්තා ලබා දීම මෙම අංශය මගින් 2017 වර්ෂය තුල ඇති කරගත් නව ප්‍රවණතාවන්ය.

ඉහත රාජකාරි වලට අදාළ ප්‍රගතිය පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රගතිය.

| අ/අ | විස්තරය | වෙන් කිරීම රු. මි. | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 3,000 | 2966 |
| 02 | පුනරාවර්තන වියදම් | 31.467 | 17.778 |

## 2.3 මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් නඩත්තු අංශය.

මහවැලි කඩිනම් ව්‍යාපාරය යටතේ ඉදිකරන ලද විශාල ජලාශ, අන්තර් ද්‍රෝණි, ඇළ පද්ධති, වේලි හා ආශ්‍රිත නිර්මිත නොකඩවා ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ඒවා නිසි කළමනාකරණය සඳහා 1985 වසරේදී මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය ස්ථාපිත කර ඇත.

### 2.3.1 මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන්:

- **පරිපාලනය:**
  වේලි හා ජලාශ වල ජලදේහය, ස්වාරක්ෂක කලාපයේ (100 m Buffer zones) හා ඊට අයත් රක්ෂිත ආරක්ෂා කර ගැනීම උදෙසා වූ රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ජලාශ හා රක්ෂිත අයත් ප්‍රදේශ පරිපාලනය කිරීම.
- **ක්‍රියාකරවීම:**
  ජල කළමනාකරණ ලේකම් කාර්යාලයෙන් නිතිපතා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ ගේට්ටු ක්‍රියාත්මක කිරීම හා ජලාශවල ඉහළ සහ පහළ නිම්නවල ගංවතුර අවමකරලීම පිණිස ගංවතුර පාලනය සඳහා සොරොව් ගේට්ටු ක්‍රියාකරවීම.
- **නඩත්තුව:**
  ජලාශ හා ජලාශ වලට අනුබද්ධිත වේලි, ගේට්ටු, ජලාශ පර්යන්ත ප්‍රදේශ හා ජලාශයට අනුබද්ධිත සියලු නිර්මිතයන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව (ICOLD) නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

### 2.3.2 2017 වර්ෂයේ ක්‍රියාකාරකම්:

- ජලාශ වේලි හා ආශ්‍රිත නිර්මිතවල සාමාන්‍ය නඩත්තු සම්පූර්ණ කිරීම.
- සියලු වේලි සඳහා සැළසුම් කරන ලද ආරක්ෂිත මෙහෙයුම් ක්‍රියාකාරකම් හා නිත්‍ය නඩත්තුව සම්පූර්ණ කිරීම.

- උපකරණ වලින් රැස්කරන ලද දත්ත එකතු කිරීම විශ්ලේෂණය කිරීම සැලසුම් කළ පරිදි ඉටු කිරිම.
- සැලසුම් කරන ලද ජල තත්ත්ව නඩත්තු ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම.
- ජාලශ සංරක්ෂණ කටයුතු හා අනවසර අල්ලා ගැනීම් සිදුකර ඇති ප්‍රදේශ නැවත අත්පත් කර ගැනීමේ මූලික කටයුතු අවසන් කිරීම.
- ආයතනික පරීක්ෂණ, මු.වැ.පා. ඒකකයට අනුයුක්ත කර ඇති ඉංජිනේරුවරුන් මගින් ඉටු කිරීම.

## 2.4 ජල කළමනාකරණ ලේකම් කාර්යාලය.

ජල පාලන ලේකම් කාර්යාලය මගින් වාර්ෂික යල සහ මහ කන්නයන් සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති නිර්දේශ කර මහවැලි පද්ධති සඳහා මෙහෙයුම් සැළසුම් සකස් කිරීම සිදුකරන අතර මෙය මූලික වාරිමාර්ග හා බලශක්ති අවශ්‍යතා මත පදනම් ව ප්‍රධාන වී සහ අතුරු වැවිලි බෝග නිෂ්පාදනය සඳහා පුළුල් දායකත්වයක් ලබා දෙන ජාතික වැඩසටහන වේ. මෙය සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ උපදෙස් සපයන ඒකකයක් ලෙස ජල පාලන ලේකම් කාර්යාලය මගින් ජල පාලන කමිටුවට අයත් සාමාජික ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් සියලු මෙහෙයුම් සැළසුම් සතිපතා අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සමාලෝචනය හා ඉදිරි සති ජල මෙහෙයුම් සැළසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම සිදුකරන අතර එය කෘෂි, විදුලි හා පානීය ජල අවශ්‍යතාද සලකමින් සමස්ථ පද්ධතිය තුළ නිර්දේශිත ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබන්නකි.

### 2.4.1 2016/17 මහ කන්නය (2016 ඔක්. 01 -2017 මාර්තු 31)

2016/2017 මහ කන්නය සඳහා වූ මහවැලි ජල පාලන කමිටු රැස්වීම 2016 ඔක්තෝම්බර් මස 24 පේරාදෙණිය ගන්නෝරුව පැලැටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

2016/17 මහ කන්නය සාමාන්‍ය මහ කන්නයක් ලෙස අපේක්ෂා කළද, අපේක්ෂිත මෝසම් වැසි නොලැබීම හේතුකොට ජල පාලන කමිටුව මගින් අනුමත කරගත්තා වූ වගා කාල සටහන සංශෝධනය කිරීමට සිදුවූ අතර, පද්ධති එච්, අයි, එච් හා එම්එච් හි වගාව 40% -50% කට සීමා කිරීමට සිදුවිය. 2017ජනවාරි 02 වන විට ජලාශය සක්‍රීය ජල ධාරිතාව, කොත්මලේ 45.7% හා උඩ වළව 38.5% ලෙස විය. කඩින් කඩ ලැබුණු මද වර්ෂාව තුළ වගාව ආරක්ෂා කර ගැනීමට මහවැලි සී හා බී කලාප වලට හැකිවිය. සමස්ථයක් ලෙස 2016/17 මහ කන්නය ජල හිඟ වූ කන්නයක් ලෙස ද රටෙහි ජල විදුලි බල නිෂ්පාදනයට බලපෑම් කල මහ කන්නයක් ද විය.

මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 124 ක් 2016/17 මහ කන්නය තුළ ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලදී. විදුලිබල උත්පාදනය 2016/17 මහ කන්නය තුල පැවති ආකාරය පළමුවන සටහනින් දැක්වේ.




පළමුවන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ ඇති කලාපවල 2016/17 මහ කන්නයේ වගාව සැළසුම හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.




රූප සටහන 02

## 2.4.2 2017 යල කන්නය - (2017 අප්‍රේල් 01-2017 සැප්.)

2017 යල කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටු රැස්වීම 2017 අප්‍රේල් මස 03 දින පේරාදෙණිය ගන්නෝරුව පැලැටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. ඒ වන විට කොත්මලේ ජලාශයේ සක්‍රිය ජල මට්ටම 48.9% ද, මාදුරුඔය 49.9%ද, කලාවැව 45% ද, හුරුළුවැව 6.1% ලෙස පහත ජල මට්ටමක් පවැති අතර පරාක්‍රම සමුද්‍රය ජල මට්ටම උපරිම ජල මට්ටමට ආසන්නව පැවතිනි.

එබැවින් සමස්ථයක් ලෙස වගාව 60% පමණ උපරිමය අපේක්ෂා කළ අතර පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, අල්ලෙයි, රාජාංගනය 100% සඳහා යෝජිත විය. ඒ අනුව 2017 යල කන්නයේ මුළු වගා වපසරය හෙක්. 139,472 වූ අතර එය ආසන්න ලෙස මුළු වගාවෙන් 73% ක ප්‍රමාණයක් විය.

මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 522 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදි. විදුලිබල උත්පාදනය සැලසුම් කල හා 2017 යප කන්නය තුල පැවති ආකාරය රූප සටහනින් දැක්වේ.




තුන්වන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ ඇති කලාපවල 2017 යල කන්නයේ වගාව සැලසුම හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.




සිව්වැනි රූප සටහන

## 2.4.3 2017/2018 මහ කන්නය - (2017 ඔක්තෝම්බර් 01-2017 දෙසැම්බර් දක්වා)

2017/18 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටු රැස්වීම 2017 ඔක්තෝම්බර් මස 04 දින පේරාදෙණිය ගන්නෝරුව පැලැටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. ඒ වන විට

කොත්මලේ ජලාශයේ සක්‍රීය ජල මට්ටම කොත්මලේ, වික්ටෝරියා 36% ද, වලව 9.5%ද, හුරුළුවැව 7.5%, මාදුරුඔය 11.2% ලෙස පහත මට්ටමක පැවතීය.

ඒ වන විට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී නොතිබීම හේතුකොට ජලය නිකුත් කිරීම් ප්‍රමාද කරන ලෙස දන්වන ලද අතර ඒ අනුව ජලය නිකුත් කිරීම, කලාප ජී, ඩී 01, 2017 දෙසැම්බර් 15 තෙක් ප්‍රමාද කරමින් ආරම්භ කිරීමට සිදුවිය. ඒ අනුව 2017/18 මහ කන්නයේ මුළු වගා වපසරිය හෙක්. 127,466 වූ අතර එය සමස්ථ ලෙස 71% පමණ උපරිමය අපේක්ෂා කළ අතර පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, අල්ලෙයි, රාජාංගනය 100% සඳහා යෝජිත විය.

තවද මහවැලි පද්ධතියට අලුතින් එක්වූ ඉදි කිරීම් කටයුතු නිම වෙමින් පැවති මොරගහකන්ද ජලාශයේ වේලි බැම්ම හා එම ගෙට්ටු හා විදුලි ජනක යන්ත්‍රවල පරීක්ෂණ කටයුතු සඳහා ජලාශය පිරවීමට මෝසම් වැසි හා හැරවුම් ජලය උපයෝගී කර ගත් අතර 2017 දෙසැම්බර් 29 දින වන විට එම ජලාශයේ සක්‍රීය ජල ධාරිතාව 98.7% ක් දක්වා ඉහළ දැමිනි.

මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 390 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදි. විදුලිබල උත්පාදනය සැලසුම් කල හා 2017/18 මහ කන්නය තුල පැවති ආකාරය පස්වන රූප සටහනින් දැක්වේ.




පස්වන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ ඇති කලාපවල 2017/18 මහ කන්නයේ වගාව සැලසුම හා එහි ප්‍රගතිය හය වන රූප සහටනින් දැක්වේ.




හයවන රූප සටහන

## 2.5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

### 2.5.1 කාර්යභාරයන්

- 2017 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අප අංශය විසින් වැව් රක්ෂිත සීමා සළකුණු කිරීම.
- නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- කට්ටි සැලසුම් සකස් කිරීම
- තත්ත්ව මිනුම් සකස් කිරීම හා භෞතික සැලසුම් වාර්තා සඳහා නිර්දේශ ලබාදීම.

<u>මහවැලි කලාප ආශ්‍රිතව වැව් රක්ෂිත සීමා සළකුණු කිරීම.</u>

මහවැලි කලාප ආශ්‍රිතව පවතින වැව් රක්ෂිත සීමාවන් විධිමත්ව මැන සළකුණු කිරීම් සිදු කර නොමැති වැව් තෝරා ගෙන එම වැව් රක්ෂිත සීමා සළකුණු කර සංරක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම 2017 වර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන මත සැලසුම් කරන ලදී. ඒ අනුව එක් එක් කලාපයේ පහත වැව් ආශ්‍රිතව මැනුම් කටයුතු අවසන් කර රක්ෂිත මායිම් ගල් යොදා ඇත.

| කලාපය | වැව | මැන අවසන් කල ප්‍රමාණය |
|---|---|---|
| බී කලාපය | ඉබ්බන් වැව දළුකාන වැව | 02 |
| සී කලාපය | කාසන් වැව,විජේපුර වැව,අළුයටවල වැව | 03 |
| ජී කලාපය | බටුහේන වැව,නිකවැව | 02 |
| එච් කලාපය | ලුණු වැව,මුසල්පිටිය වැව,නාවක්කුලම වැව,පලුගස් වැව | 04 |
| වලව කලාපය | ආඩියන්ගම වැව,ජුල් වැව,හත්පෝරුව වැව, බෙල්ලගස් වැව | 04 |
| **මුළු එකතුව** | | **15** |






## 2.5.2 සමෝච්ඡ රේඛා සිතියම් සකස් කිරීම.

ඩී කලාපයේ සූරියපුර කොට්ඨාසයේ සූරියපුර ඒකකයේ හැළඹයාය ප්‍රදේශයේ වාරි ජලය ලබාදීය නොහැකි එහෙත් වාරි ඉඩම් ලෙස කට්ටි සැලසුම් කල හැකි ප්‍රදේශය හඳුනා ගැනීම සඳහා සමෝච්ඡ රේඛා සිතියමක් සකස් කර ඒ අනුව වාරි ඉඩම් ලෙස ලබාදිය හැකි ප්‍රදේශයට අදාල සැලැස්ම සකස් කර අවසන් කර ඇත.



## 2.5.3 තත්ත්ව මිනුම් සකස් කිරීම.

හුරුළුවැව කලාපයට අදාලව මේ වන විට පවතින සියලුම අවසාන ජනපද සිතියම් හා ගම් සිතියම් වල දෘඩ පිටපත් මෘදු පිටපත් බවට පත් කර එම සිතියම් වල විද්‍යුත් දත්ත පද්ධතියක සකස් කිරීමට අදාල කටයුතු අවසන් කර ඇත.

තවද, දඹුළුහල්මිල්ලෑව, ගිරාණේගම, බෝගස්වැව ගම්මානයට අදාලව පවුල් 85 ක් පමණ පදිංචි ප්‍රදේශයෙහි පදිංචිකරුවන්ට ඉඩම් අයිතිය ලබාදීම සඳහා සැලසුම් රෙගුලාසි වලට අනුකූල වන කට්ටි සැලැස්මක් සැකසීම සඳහා දැනට එම පදිංචිකරුවන් භූමියෙහි පදිංචිය දරණ ආකාරය දැක්වෙන තත්ත්ව මිනුමක් සකස් කර අවසන් කර ඇත.



### 2.5.4 නගර ආශ්‍රිත උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.

තෙල්දෙණිය නගර සැලැස්ම යාවත්කාලින කිරීමට අදාලව ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදුකර ලබාගත් තොරතුරු මත පදනම්ව තෙල්දෙණිය නගරය සඳහා නව සැලැස්මක් සකස් කර උපායමාර්ගික ව්‍යාපෘති හඳුනා ගැනීම් සිදුකරන ලදී. එසේ හඳුනාගත් ව්‍යාපෘති සඳහා නගර සැලැස්ම තුළ ස්ථාපිත කිරීම් කටයුතු සිදුකර ඇත.

එමෙන්ම දිගන නගරය හා අඹකොටේ නගරය ආශ්‍රිතව හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව ජල අපවහන ඇල මාර්ග පද්ධතිය සකස් කිරිම, ඇවිදින මංතීරු සකස් කිරීම් කටයුතු අවසන් කර ඇත.




මොරගහකන්ද කලාපය තුළ අඹන නගර සැලැස්ම තුළ සේවා පහසුකම් ස්ථාපනය කර සංවර්ධනය කිරීමට අදාල සැලැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතු මේ දක්වා අවසන් කර ඇත.






මැදිරිගිරිය සංවර්ධන සැලැස්ම තුළ ජනාවාස සැලසුම් කටයුතු සඳහා සැලැස්ම යාවත්කාලීන කිරීම හා සේවා පහසුකම් වැඩිදියුණු කිරීමට අදාල සැලසුම් සකස් කිරීම් අවසන් කර ඇත.



එමෙන්ම 2017 වර්ෂයේ මැද භාගයේ සිට භෞතික සැලසුම් වාර්තා සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීමට කටයුතු කරන ලද අතර එම ප්‍රමාණයන් පහත දැක්වේ.

**2017.07.01 දින සිට -2017.12.31 දින දක්වා**

| කලාපය / රක්ෂිත ප්‍රදේශ | යොමු කර ඇති ලිපි ප්‍රමාණය | යොමු කර ඇති මුළු ස්ථාන ප්‍රමාණය | නිර්දේශ කර ඇති ප්‍රමාණය | නිර්දේශ කර නොමැති ප්‍රමාණය | වැඩිදුර තොරතුරු ලගැනීම සඳහා යොමු කර ඇති ප්‍රමාණය | ශ්‍රී. ලං. ම. අ. මගින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සඳහා ඛණිජ කැණීම් සිදු කල ස්ථාන ගණන |
|---|---|---|---|---|---|---|
| බී කලාපය | 25 | 54 | 53 | - | 1 | 60 |
| සීකලාපය | 13 | 14 | 12 | - | 02 (01 වාර්තාවක් නි.අධ්‍යක්ෂ ජනරාල් [තාක්ෂණ සේවා] නිර්දේශයලබා ගැනීමසඳහා) | 12 |
| ඩී කලාපය | 16 | 21 | 19 | 1 | එක් වාර්තාවක් ව්‍යාපෘති අධ්‍යක්ෂ ඩී වෙත යොමු කර ඇත. | 3 |
| ජී කලාපය | 33 | 35 | 35 | - | - | - |
| එච් කලාපය | 29 | 38 | 34 | 1 | වාර්තා 03 ක් අධ්‍යක්ෂ ඉඩම්ගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව නිර්දේශලබා දීම සඳහා | 9 |
| එල් කලාපය | 9 | 10 | 10 | - | - | 8 |
| වලව කලාපය | 94 | 601 (ඉඩම් තේරීම් ලාභීන් 463 දෙනෙක් ඇතුළුව) | 594 | - | 4 (වාර්තා 03 ක් අධ්‍යක්ෂ ඉඩම් ගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව නිර්දේශ ලබා දීම සඳහා) | 2 |
| රඹකැන්ඔය කලාපය | 18 | 20 | 20 | - | - | 8 |
| වික්ටෝරියා කලාපය | 17 | 30 | 22 | - | 08 වන ජීවී අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. | - |
| හුරුළුවැව කලාපය | 19 | 23 | 21 | 1 | 1 | - |
| ගංගා හා ජලාශ ආශ්‍රිත | 21 | 24 | 6 | 5 | 13 | |
| **එකතුව** | **294** | **870** | **826** | **08** | **36** | **102** |

## 2.6 වන හා පරිසර අංශය

ශ්‍රී ලංකාවට සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් හිමිකර දෙමින් මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක වූ අතර එය කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත තිරසාර පරිසර සංරක්ෂණ වැඩපිළිවෙලක් යටතේ ඉදිරියට ගෙන යාමට මූලිකව සැලසුම් කල අතර යෝජිත සංවර්ධන ක්‍රියාවලියේ සෑම පියවරකින්ම සිදුවිය හැකි පාරිසරික බලපෑම හා විපර්යාස අවම මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණ විය

ඒ අනුව ගොවිජනපද ලෙස සංවර්ධනය කරන ලද පහළ මහවැලි නිම්න කලාප මෙන්ම ප්‍රශස්ථ ජල සැපයුමක් සඳහා ඉහළ ජලාධාර ප්‍රදේශයද සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම එහි සොබා සම්පත් මනාලෙස සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම පරිසර හා වන සංරක්ෂණ අංශය වෙත පැවරුණු මූලික කාර්ය භාරය විය.

### 2.6.1 කාර්යභාරයන්

1. ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සඳහා වූ ක්‍රියාකාරකම්
2. මහවැලි පහළ නිම්න හා අනෙකුත් මහවැලි කලාපවල සිදුකරන ලද පරිසර ක්‍රියාත්මක වැඩසටහන හා ඒකාබද්ධ ව්‍යාපෘති වල පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු හා පසුවිපරම් කිරීම සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු ,මෙහෙයුම් කමිටු හා ස්ථාවර කමිටු නියෝජනය කිරීම.
4. ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් කටයුතු පරිපාලනය හා පසුවිපරම් කටයුතු සිදුකිරීම.
5. රේඛීය රාජ්‍ය ආයතන වලින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු නියෝජනය, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරවීමට යෝජිත පරිසර ක්‍රියාකාරකම් සම්බන්ධ රැස්වීම් හා වැඩමුළු සඳහා අධිකාරිය නියෝජනය කිරීම හා අභ්‍යන්තර කමිටු නියෝජනය කිරීම.

### 2.6.2 2017 මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ප්‍රගතිය.

| අංකය | අංශය/ කලාපය | මූලික මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.) | සංශෝධිත මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01 | පරිසර හා වන සංරක්‍ෂණ අංශය කොත්මලේ | 38.00 | 30.12 | 30.23 | 100% |
| 02 | බී, සී, ඩී, වලව, හුරුළුවැව, වික්ටෝරියා, කලාප | 28.00 | 22.07 | 22.63 | 100% |
| 03 | (1. මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය, 2. රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය 3. බී කලාපය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය ( මල්වැන්න, වැලිතැන්න) | 32.43 | 21.98 | 20.33 | 92.51% |
| | **එකතුව** | **98.43** | **74.17** | **73.19** | **98.14%** |

### 2.6.3 ප්‍රාග්ධන වියදම්

| අයවැය සංකේත අංකය | අංශය | සංශෝධිත ඇස්තමේන්තු මුදල රු.මි. | වියදම් මුදල රු.මි. | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2965 | ස්වභාවික සම්පත් සංරක්ෂණ අංශය | 9.834 | 9.841 | 100.07% |
| 2965 | පරිසර අධ්‍යාපන හා පුහුණු අංශය | 4.965 | 4.869 | 98.08% |
| 2965 | ජලවිද්‍යා අධ්‍යයන අංශය | 2.877 | 2.967 | 102% |
| | ජල තත්ව අධ්‍යයනය | 0.5 | 0.487 | |
| 2965 | පටක රෝපණ අංශය | 5.023 | 5.094 | 101.43% |
| 2705/2113 | ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | 0.35 | 0.338 | 96.64% |
| 2383 | වාහන නඩත්තුව හා අළුත්වැඩියාව | 2.33 | 2.455 | 105.37% |
| 2385 | ගොඩනැගිලි නඩත්තු අංශය | 4.145 | 4.117 | 99.33% |
| 2386 | කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම | 0.1 | 0.106 | 106.76% |
| **එකතුව** | | **30.124** | **30.277** | **100.51%** |

### 2.6.4 2017 ක්‍රියාකාරකම්:

01. ගොවිපලින් බැහැර පාංශු සංරක්ෂණ වැඩසටහන(දිය කඳුරු සංරක්ෂණය)
02. පැල නිෂ්පාදනය - නව දෙවිට මධ්‍යම පැල තවාන
03. රුක් රෝපණ වැඩසටහන්
04. ජලපෝෂක ප්‍රදේශයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීමේ වැඩසටහන
05. හරිත ගම්මාන වැඩසටහන
06. පටක රෝපණ නිෂ්පාදන අංශය
07. විද්‍යාගාරය තුල වෙනත් භෝග පිළිබඳ අත්හදාබැලීම්)Research and Development) - උණ විශේෂ නිෂ්පාදනය-:
    (i) කහ බීරළු උණ )*Bambusa venticosa* "Kemi" )
    (ii) බට උණ) *Bambusaatra)*
08. පාරිසරික ප්‍රවර්ධන මධ්‍යස්ථාන ඇති කිරීම
09. පැල තවාන මගින් නිෂ්පාදනය කළ හා නඩත්තු කළ පැල ගණන

### 2.6.5 මහවැලි කලාප තුල ක්‍රියාත්මක පරිසර හා වන සංරක්ෂණ වැඩසටහන 2017

01. වැඩසටහන් සඳහා පැල ලබාදීම
02. පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ඉටු කරනු ලබන වෙනත් විශේෂ කටයුතු.

# තුන්වැනි පරිච්ඡේදය

## සංවර්ධන අංශය

**සංවර්ධන අංශය ප්‍රධාන අංශ 05 කින් සමන්විත වන අතර එම අංශ පහත පරිදි වේ.**

**01. ඉඩම් අංශය**

**02. කෘෂිකර්ම සංවර්ධන අංශය**

**03. පශු සම්පත් සංවර්ධන අංශය**

**04. ආයතන සංවර්ධන අංශය**

**05. ව්‍යාපාර සංවර්ධන අංශය**

## 3.1 ඉඩම් අංශය

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, සන්තකය ආපසු ලබා ගැනීමේ පනත, කැළෑ ආඥා පනත වැනි අණපනත් මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කලාපවල ඉඩම් රාජකාරි කටයුතු සංවිධානය කිරීම, ඉඩම් කච්චේරි හා අනවසර පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව කලාප වලින් යොමුවන ඉල්ලීම අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම හා දන්වා යැවීම එම කටයුතු අධීක්ෂණය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම මෙම අංශයෙන් සිදුකරනු ලබන ප්‍රධානතම කාර්යභාරයන් ලෙස හඳුනාගත හැකිය.

### 3.1.2 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කළ කාර්යයන්.

01. මහවැලි ගොවිජනතාව වෙත ඉඩම් ඔප්පු ලක්ෂයක් (100,000) ලබා දීමේ කඩිනම් වැඩසටහන
02. රජයේ ඉඩම් ආඥා පනත යටතේ භුක්තිය බාරදීම -2017
03. රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදුකර ලබා දීම-2017
04. රජයේ ඉඩම් ආඥා පනත යටතේ විහාරස්ථාන දීමනා පත්‍ර ලබා දීම-2017

**01. මහවැලි ගොවිජනතාව වෙත ඉඩම් ඔප්පු ලක්ෂයක් (100,000) ලබා දීමේ කඩිනම් වැඩසටහන.**

| කලාපය | ඉලක්කය | 2017.12.31දිනට ප්‍රගතිය අවසරපත්‍ර ප්‍රදානපත්‍ර දීර්ඝ කාලීන බදුකර |
|---|---|---|
| බී | 25,600 | 25,533 |
| සී | 17,700 | 26,360 |
| ඩී | 2,800 | 444 |
| එච් | 12,500 | 8,729 |
| එල් | 8,600 | 7,816 |
| මොරගහකන්ද | 3,600 | 3,522 |
| වික්ටෝරියා | 2,800 | 3,299 |
| හුරුළුවැව | 4,100 | 2,119 |
| වලව | 18,500 | 19,683 |
| රඹකැන්ඔය | 3,800 | 2,568 |
| **එකතුව** | **100,000** | **100,073** |

## 02. රජයේ ඉඩම් ආඥා පනත යටතේ භුක්තිය භාර දීම 2017

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 870 | 596 |
| සී | 30 | 19 |
| මොරගහකන්ද | 204 | 182 |
| එච් | 400 | 365 |
| එල් | - | - |
| උඩවලව | 30 | 22 |
| වික්ටෝරියා ,කොත්මලේ | 200 | 167 |
| මැදිරිගිරිය | 4 | 1 |
| හුරුළුවැව | - | - |
| රඹකැන්ඔය | 15 | 9 |
| එකතුව | **1,753** | **1,361** |

## 03. <u>දීර්ඝ කාලීන බදුකර ලබා දීම -2017.</u>

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 25 | 14 |
| සී | 30 | 24 |
| මොරගහකන්ද | 14 | 5 |
| එච් | 18 | 14 |
| එල් | 3 | - |
| උඩවලව | 33 | 22 |
| වික්ටෝරියා ,කොත්මලේ | 202 | 182 |
| මැදිරිගිරිය | 4 | 2 |
| හුරුළුවැව | 7 | 3 |
| රඹකැන්ඔය | 4 | - |
| එකතුව | **340** | **266** |

## 04. රජයේ ඉඩම් ආඥා පනත යටතේ විහාරස්ථාන දීමනා පත්‍ර ලබා දීම-2017

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 10 | 7 |
| සී | 10 | 1 |
| මොරගහකන්ද | 4 | 3 |
| එච් | 20 | 3 |
| එල් | - | - |
| උඩවලව | 20 | 2 |
| වික්ටෝරියා, කොත්මලේ | 30 | 7 |
| මැදිරිගිරිය | - | - |
| හුරුළුවැව | 5 | 4 |
| රඹකැන්ඔය | - | - |
| එකතුව | **99** | **27** |

## 06. රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබා දීම-2017

| කලාපය | පැවරුම් නියෝග | | ඉඩම් භාරදීම | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| බී | 10 | 4 | 50 | 47 |
| සී | 15 | 13 | - | - |
| මොරගහකන්ද | - | - | 2 | 1 |
| එච් | 5 | 1 | 3 | 1 |
| එල් | 7 | 5 | 50 | 47 |
| උඩවලව | - | - | - | - |
| වික්ටෝරියා, කොත්මලේ | - | - | 10 | 6 |
| මැදිරිගිරිය | - | - | - | - |
| හුරුළුවැව | 2 | 1 | 5 | 3 |
| රඹකැන්ඔය | - | - | - | - |
| එකතුව | **39** | **24** | **120** | **105** |

## 3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

### 3.2.1 කාර්යභාරය

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි කලාපවල පදිංචි ගොවියන්ගේ ආර්ථිකය ඵලදායි ලෙස වැඩිදියුණු කිරීම උදෙසා පරිසර හිතකාමී කෘෂි තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා ව්‍යාප්ත කිරීම.
- ආහාර නිෂ්පාදන ජාතික ඉලක්කයන්ට අනුව මහවැලි බල ප්‍රදේශයන්හි වාරි හා වාරි නොවන ඉඩම්වල බෝග වගාව, සත්ත්ව නිෂ්පාදනය හා කෘෂි ව්‍යාපාර ඇති කිරීම සඳහා වාර්ෂික ඉලක්කයන් සකසා ගැනීම.
- වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදනවලට අනුකූලව ව්‍යාප්ත ඉලක්ක හා උපක්‍රම සැලසුම් සකස් කිරීම, ඒවා කලාප මට්ටමින් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කරවීම, පසුවිපරම, අධීක්ෂණය හා වාර්තා කිරීම.
- කෘෂිකාර්මික සංවර්ධන කටයුතුවලදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හා සියලුම බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීම.

### 3.2.2 ක්‍රියාත්මක වූ වැඩසටහන්

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කර 2017 වසර තුළ සමස්ත මහවැලි කලාපවල කරන ලද වැඩසටහන් හා ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| **වී වගා ප්‍රවර්ධනය** | | | |
| ආදර්ශ යාය වැඩසටහන් | සංඛ්‍යාව | 100 | 94 |
| අස්වනු සමීක්ෂණ* | සමීක්ෂණ | 300 | 289 |
| නව තාක්ෂණ ආදර්ශන | වැඩසටහන් | 100 | 125 |
| **වැඩසටහන** | **ඒකකය** | **ඉලක්කය** | **ප්‍රගතිය** |
| කාර්යක්ෂම පොහොර භාවිතය සඳහා ගොවි පුහුණු | ගොවීන් | 11,965 | 9,530 |
| බෙදාදුන්පැරඹුට් තැටි ගණන | සංඛ්‍යාව | 70,000 | 68,300 |
| පැළ සිටුවන යන්ත්‍ර ලබා දීම | සංඛ්‍යාව | 25 | 24 |
| **වැඩසටහන** | **ඒකකය** | **ඉලක්කය** | **ප්‍රගතිය** |
| පුහුණුභෝග සායන/ දිනකේෂ්ත්‍ර/ | සංඛ්‍යාව | 900 | 899 |
| පත්‍ර වර්ණ දර්ශක භාවිතය | හෙක්. | 2,000 | 1,853 |
| කාබනික පොහොර භාවිතය | හෙක්. | 10,000 | 11,140 |

| වෙනත් ක්ෂේත්‍ර බෝග | | | |
|---|---|---|---|
| ගොවි පුහුණු/ කේෂ්ත්‍ර දිනය/ සායන බෝග | වැඩසටහන් | 280 | 286 |
| වගා ආදර්ශන | වැඩසටහන් | 500 | 534 |
| බී ජැණු වසන්තිකරණය | කිලෝ ග්‍රෑම් | 150,000 | 143,226 |
| ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීම | සංඛ්‍යාව | 80 | 83 |
| වැසි ආවරණ | සංඛ්‍යාව | 250 | 253 |
| කෘෂි ළිං | සංඛ්‍යාව | 100 | 120 |
| **පළතුරු බෝග සංවර්ධනය** | | | |
| අඹ ගස් පුනරුත්ථාපන වැඩසටහන් | සංඛ්‍යාව | 115 | 110 |
| පළතුරු මැස්සා පාලන වැඩසටහන් | සංඛ්‍යාව | 57 | 53 |
| ගොවි පුහුණු/ කේෂ්ත්‍ර දිනය/ බෝග සායන | වැඩසටහන් | 260 | 241 |
| මී පැණි නිෂ්පාදන වැඩසටහන | මීමැසි ජනපද | 640 | 626 |
| බිම්මල් නිෂ්පාදන වැඩසටහන | සංඛ්‍යාව | 50 | 53 |
| ආදර්ශ ගෙවතු වැඩසටහන | ගෙවතු | 4,000 | 4,110 |
| ගොවි පුහුණු | වැඩසටහන් | 350 | 355 |
| **කාබනික පොහොර භාවිතය වැඩි කිරීමේ වැඩසටහන** | | | |
| **වැඩසටහන** | **ඒකකය** | **ඉලක්කය** | **ප්‍රගතිය** |
| ගොවි පුහුණු | වැඩසටහන් | 240 | 228 |
| කොම්පෝස්ට් නිෂ්පාදන ආදර්ශන | වැඩසටහන් | 2300 | 2355 |
| කර දහයියා නිෂ්පාදන ආදර්ශන | වැඩසටහන් | 50 | 65 |
| **කෘෂි ව්‍යාප්ති කටයුතු** | | | |
| තුන්අවුරුදු සැලසුම මෙහෙයවීම | වැඩසටහන් | 500 | 492 |
| වගා තරඟ හා ප්‍රදර්ශන | වැඩසටහන් | 12 | 13 |
| **නිලධාරි පුහුණු** | | | |
| පෙර කන්න පුහුණු | වැඩසටහන් | 12 | 12 |
| විශේෂ පුහුණු | වැඩසටහන් | 41 | 48 |

### 3.2.3 මූල්‍ය ප්‍රගතිය

2017 වසර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් වූ ප්‍රතිපාදන යටතේ ඉහතින් සඳහන් සැලසුම්ගත වැඩසටහන් සඳහා **රු.මිලියන 160 ක** මූල්‍ය ප්‍රතිපාදනමෙම අංශයට ලැබිණි. වසර තුළ ක්‍රියාත්මක වූ වැඩසටහන් සඳහා රු.මිලියන 157.65 ක ප්‍රතිපාදන වැය වූ අතර එය 99% ප්‍රගතියකි.

| | වැඩසටහන | වෙන් කළ මුදල රු: මිලියන | වැය වූ මුදල රු: මිලියන |
|---|---|---|---|
| **1** | වී නිෂ්පාදන ඵලදායිතා ප්‍රවර්ධනය | 3.78 | 3.7 |
| **2** | බෝග විවිධාංගීකරණය | 24.84 | 24.9 |
| **3** | පලතුරු බෝග සංවර්ධනය | 2.04 | 2 |
| **4** | ගෘහ ආර්ථික ගෙවතු සංවර්ධනය | 6.06 | 6.2 |
| **5** | කාබනික ද්‍රව්‍ය භාවිතය/නිෂ්පාදනය ප්‍රවර්ධනය | 0.96 | 0.95 |
| **6** | කෘෂි තාක්ෂණ ව්‍යාප්ති කටයුතු | 6.94 | 6.9 |
| **7** | නිලධාරි පුහුණු කිරිම | 2.28 | 2.3 |
| **8** | සන්නිවේදන පහසුකම් | 0.87 | 0.8 |
| **9** | ගොවිපල සංවර්ධනය | 94.57 | 92 |
| 10 | තවාන් හා පටක රෝපණ පැල නිෂ්පාදනය | 9.35 | 9.45 |
| 11 | කාලගුණ විපර්යාස අනුගත වීම වැඩසටහන් | 240 | 0.26 |
| 12 | දිළිඳුකම පිටුදැකීම සඳහා වැඩසටහන් | 4.24 | 4.35 |
| 13 | කළමනාකරණ වියදම් | 3.85 | 3.84 |
| | **එකතුව** | **160** | **157.65** |

### 3.2.4 මහවැලි කලාප මට්ටමින් මූල්‍ය ප්‍රගතිය

| කලාපය | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය (රු.මි.) | % |
|---|---|---|---|
| බී | 33.4 | 30.4 | 91% |
| සී | 17.6 | 17.7 | 100% |
| ඩී | 3.5 | 3.5 | 100% |
| ජී | 7.3 | 7.3 | 100% |
| එච් | 45.4 | 46.7 | 1.3% |
| හුරුළුවැව | 7.0 | 6.6 | 94% |
| වලව | 42.0 | 42.0 | 100% |
| වික්ටෝරියා | 2.0 | 0.8 | 90% |
| ප්‍ර.කාර්යාලය | 1.7 | 1.6 | 98% |
| **එකතුව** | **160.0** | *** 157.6** | **99%** |

### 3.2.5 2017 වසර කෘෂි නිෂ්පාදන ප්‍රගතිය

#### 1. 2016/17 මහ බෝග වගා ප්‍රගතිය

| බෝගය | ඉලක්කය(හෙක්) | ප්‍රගතිය(හෙක්) |
|---|---|---|
| වී | 93,471 | 56,310 |
| බඩඉරිඟු | 3,036 | 2,555 |
| මිරිස් | 717 | 405 |
| කව්පි | 997 | 383 |
| මුං | 1,028 | 331 |
| උඳු | 350 | 881 |
| රටකජු | 610 | 416 |
| කුරක්කන් | 329 | 283 |
| සෝයා | 660 | 2,151 |
| එළවළු | 4,209 | 4,152 |
| බී ලූණු(බීජ) | 25 | 9 |
| පළතුරු | 12,984 | 12,984 |
| වෙනත් | 7,000 | 7,589 |
| **එකතුව** | **125,416** | **88,449** |

### 3.2.6 2017 යල බෝග වගා ප්‍රගතිය

| බෝගය | ඉලක්කය(හෙක්) | ප්‍රගතිය(හෙක්) |
|---|---|---|
| වී | 35,481 | 42,621 |
| බඩඉරිඟු | 3,344 | 814 |
| මිරිස් | 424 | 183 |
| කව්පි | 761 | 209 |
| මුං | 1,275 | 370 |
| උඳු | 520 | 690 |
| රටකජු | 766 | 213 |
| කුරක්කන් | 328 | 156 |
| සෝයා | 4,847 | 3,809 |
| එළවළු | 3,786 | 3,191 |
| බී ලූණු | 1,992 | 1,195 |
| පළතුරු | 13,767 | 13,130 |
| වෙනත් | 7,127 | 6,857 |
| **එකතුව** | **74,418** | **73,438** |

### 3.2.7 ජාතික ආහාර නිෂ්පාදනයට මහවැලි දායකත්වය- 2017 වසර

**කාලීන බෝග**

| බෝගය | මහවැලි වපසරිය | මහවැලි නිෂ්පාදනය (මෙ.ටො.) | ජාතික නිෂ්පාදන (මෙ.ටො.) | මහවැලි දායකත්වය |
|---|---|---|---|---|
| වී | 98,931 | 507,828 | 2,383,000 | 21% |
| බඩ ඉරිඟු | 3,369 | 14,012 | 195,744 | 7% |
| මුං | 702 | 1,157 | 9,392 | 12% |
| කව්පි | 593 | 708 | 8,576 | 8% |
| සෝයා | 5,960 | 13,703 | 14,363 | 95% |
| අමු මිරිස් | 588 | 4,481 | 51,827 | 9% |
| රටකජු | 629 | 1,203 | 22,475 | 5% |
| උඳු | 1,572 | 2,300 | 7,329 | 31% |
| තල | 64 | 49 | 7,754 | 1% |
| කුරක්කන් | 439 | 792 | 5,574 | 14% |
| ලොකුළුණු | 1,204 | 24,066 | 53,603 | 45% |

### 3.2.8 ක්‍රියාත්මක වූ විශේෂිත වැඩසටහන්

2017 වසර තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වය මත ඇතිවන ආහාර හිඟයට විසඳුම් ලෙස හා භූමියෙන් හා අවම ජල සම්පතෙන් උපරිම ඵලදායිතාවය ලබා ගැනීම අරමුණු කොට සමස්ත මහවැලි කලාප තුළ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක විය.

1. **සෝයා බීජ නිෂ්පාදනය**
2. **ගෙවතු ආශ්‍රිතව බඳුන්ගත බෝග වගාව**
3. **කෘෂි ළිං යටතේ බෝග වගාව**



**සෝයා බීජ නිෂ්පාදනය**



**එල් කලාපය - බඳුන්ගත මිරිස් වගාව**



**කෘෂි ළිං සකස් කිරීම**

**4. පවතින කෙසෙල් වගාව නියඟයෙන් ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.**



වලව කලාපය- කෙසෙල් වගාව



සී කලාපය- මී මැසි පාලන පුහුණු වැඩසටහන්



එච් කලාපය බිම්මල් නිෂ්පාදනය

**5. ගෘහ ආර්ථිකමය ඵලදායි ගෙවතු ඇති කිරීම**

**6. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා දායකත්වය**

- අවම මට්ටමින් රසායනික පොහොර හා පලිබෝධනාශක භාවිතයට ගොවීන් හුරු කිරිම.
- කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය කිරිම .
- ගෙවතු ආශ්‍රිතව කාබනික බෝග වගාව ප්‍රවර්ධන කිරීම.





**එච් කලාපය - කාබනික පොහොර හා දහයියා අඟුරු නිෂ්පාදනය**





**සී කලාපය - දහයියා අඟුරු නිෂ්පාදනය**

**7.** ස්ථිර බෝග සායන පැවැත්වීම

**8.** බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන

### (i) මහවැලි පැළ තවාන්

(a. මහවැලි බී කලාපය - මධ්‍යම පැළ තවාන, වැලිකන්ද පැළ තවාන
(b. සී කලාපය - දෙහිඅත්තකණ්ඩිය මධ්‍යම පැළ තවාන,ගිරාඳුරුකෝට්ටේ පැළ තවාන
(c. මොරගහකන්ද කලාපය- බකමූණ පැළ තවාන
(d. එච් කලාපය - තෙල්හිරියාව පැළතවාන නිරාවිය ගොවිපල පැළ තවාන
(e. වලව කලාපය - ඇඹිලිපිටිය
(f. හුරුළුවැව කලාපය - පැළ තවාන

### 3.2.9 පැළ තවාන් ප්‍රගතිය - 2017

| කලාපය | පැළ තවාන | වියදම (පුනරාවර්තන/ ප්‍රාග්ධන) | ආදායම රු. | ලාභය රු. |
|---|---|---|---|---|
| බී | මධ්‍යම | 1,230,225.45 | 2,402,880.00 | 1,172,654.55 |
| | වැලිකන්ද | 1,813097.95 | 538,655.00 | 1,274,442.95 |
| සී | දෙහි අත්තකණ්ඩිය<br>ගිරාඳුරුකෝට්ටේ | 884,480.00 | 1,881,835.00 | 997,355.00 |
| ජී | බකමූණ | 1,680,305.25 | 2,539,000.00 | 858,694.75 |
| එච් | තෙල්හිරියාව | 1,414,634.90 | 2,703,940.00 | 1,287,305.10 |
| | නිරාවිය | 3,316,227.90 | 362,938.00 | 49,310.07 |
| හුරුළුවැව | පැල් වෙහෙර | 497,570.00 | 360,852.00 | 136,718.00 |
| උඩවලව | ඇඹිලිපිටිය | 2,519,157.00 | 3,658,876.40 | 1,139,719.40 |
| **එකතුව** | | **523,770.00** | **10,187,888.48** | **14,449,776.40** |







**බකමූණ කලාපයේ පැළ තවාන්**

### 3.2.10 වී හා අතිරේක බෝග බීජ නිෂ්පාදන වැඩසටහන -2017

මහවැලි ගොවීන් සඳහා මෙන්ම ජාතික අවශ්‍යතාවය සලකා ගොවි ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් වී හා අතිරේක බෝග බීජ නිෂ්පාදන වැඩසටහන් සෑම කන්නයකදීම ක්‍රියාත්මක කරනු ලැබේ.

වික්ටෝරියා/කොත්මලේ කලාපයන් හැරුණු විට අනෙකුත් සියළුම මහවැලි කලාපයන්හි වාරි ඉඩම් හා ගොඩ ඉඩම් වල වගාවන් සිදු කරනු ලබයි.විශේෂයෙන් මහ කන්නය තුල වී වගාව ප්‍රමුඛ වගාවක් වන අතර යල කන්නය වී මෙන්ම අතිරේක බෝග වගාවන් ද විශාල වශයෙන් සිදු කරනු ලබයි.මේ සඳහා අවශ්‍ය බීජ මහවැලි කලාප තුල නිෂ්පාදනය කරන අතර දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලබීජ අවශ්‍යතාවය සපුරාලීමට හැකියාව ලැබී ඇත.

මෙම බීජ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ස්වයං බීජ නිෂ්පාදනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව සිදු කරනු ලබන වාණිජ බීජ නිෂ්පාදන වැඩසටහන හා මහවැලි කලාප තුල පුද්ගලික ආයතන විසින් සිදු කරනු ලබන බීජ නිෂ්පාදන වැඩසටහන් හැඳින්විය හැක.මෙම වැඩසටහන තුලින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කරනු ලබන නව බෝග ප්‍රභේද ගොවීන් අතර ප්‍රචලිත කිරීමට මහඟු පිටුවහලක් සිදු වේ.

| බෝගය | නිෂ්පාදනය(මෙ.ටොන්) | |
|---|---|---|
| | 2016/17 මහ | 2017 යල |
| වී | 5616 | 3172 |
| මුං | - | 30 |
| කව්පි | - | 12 |
| උඳු | 12.5 | 43 |
| මිරිස් | 15.8 | - |
| සෝයා | 4221 | 175 |
| බඩ ඉරිඟු | - | 8.6 |
| ලොකු ළූණු | - | 0.85 |
| කුරක්කන් | 10.8 | 28.5 |
| අනකුත් | 4 | 7 |

### 3.2.11 මහවැලි ගොවිපල සංවර්ධන වැඩසටහන - 2017

**ආදර්ශ ගොවිපල සංවර්ධන වැඩසටහනෙහි මූලික අරමුණු**

1. ප්‍රදේශයට උචිත නව ප්‍රභේද, නව ක්‍රමවේද අත්හදා බැලීමේ මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාම.
2. කලාපීය බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරාලීමට දායක වීම.
3. යහපාලන කෘෂිකාර්මික ක්‍රමවේද ගොවි ප්‍රජාව වෙත ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගැනීම.
4. පරිසර හිතකාමී දේශීය සංචාරක නිකේතනයක් ලෙස පවත්වාගෙන යාම.
5. උපරිම ලාභ ලබන වාණිජ වශයෙන් වැදගත් ආර්ථික ඒකකයක් බවට පත් කිරීම.

### 3.2.12 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත ගොවිපල දත්ත සටහන

| කලාපය | ගොවිපල | ගොවිපල වපසරිය (හෙක්) |
|---|---|---|
| බී | අරලගංවිලගොවිපල | 200 |
| සී | කෘෂිකර්මකළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | 268 |
| ජී | අත්තනකඩවලගොවිපල | 4 |
| එච් | කලංකුට්ටියගොවිපල | 6.8 |
| එච් | නොච්චියාගමආදර්ශගොවිපල | 19.2 |
| එච් | නිරාවිය ගොවිපල | 140 |
| එල් | සම්පත්නුවරආදර්ශගොවිපල | 8.4 |
| රඹකැන්ඔය | රඹකැන්ඔය ගොවිපල | 20 |
| උඩවලව | කච්චිගල්ආරගොවිපල | 1.5 |
| උඩවලව | කට්ටකඩුවගොවිපල | 6 |
| උඩවලව | සේදගොවිපල | 19 |
| උඩවලව | මහගොවිපල | 21.7 |
| උඩවලව | සූරියවැවසංවර්ධන මධ්‍යස්ථානය | 2.8 |
| උඩවලව | ගුරුගොඩැල්ලගොවිපල | 12 |
| උඩවලව | මහගමගොවිපල | 28 |
| **එකතුව** | | **770.9** |

### 3.2.13 ගොවිපල ආදායම් වියදම් වාර්තාව- 2017

වගු අංක (1) හි දැක්වෙන පරිදි සමස්ත ගොවිපල සංවර්ධන වැඩසටහන සඳහා 2017 වර්ෂයේ යෙදවීමට අපේක්ෂිත මුදල රු: මිලියන 87.33 කි. එහෙත් එම මුදලින් 83% ක පමණ ප්‍රගතියක් අත් කර ගැනීමට සමත් වී ඇත.

එමෙන්ම 2017 වර්ෂයේ අපේක්ෂිත ආදායම රු: මිලියන 116.21 ක් වූ අතර උපයා ඇති ආදායම

| කලාපය | ගොවිපල | ගොවිපල වපසරිය (හෙක්ටයාර) | 2017 | | වියදමට අනුව ආදායම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | | ලැබූ ආදායම | ගොවිපල සංවර්ධන වැඩ කටයුතු සඳහා 2017 වර්ෂයේ දරන ලද වියදම | |
| උඩවලව | සූරියවැව සංවර්ධන මධ්‍යස්ථානය | 2.8 | 1,667,252.90 | 1,585,813.00 | 105% |
| | ගුරුගොඩැල්ල | 12 | 1,833,499.00 | 2,551,113.00 | 72% |
| | කට්ටකඩුව | 6 | 681,893.50 | 2,454,129.04 | 28% |
| | මහගම | 28 | 4,387,466.80 | 3,660,763.25 | 120% |
| | සේද | 19 | 2,337,189.50 | 3,863,000.70 | 61% |
| | මහ | 21.7 | 2,743,928.00 | 3,830,082.61 | 72% |
| | කච්චිගල්ආර | 1.5 | 1,457,281.00 | 3,228,413.53 | 45% |
| බී | අරලගංවිල ගොවිපල | 200 | 28,038,814.80 | 22,057,519.05 | 127% |
| සී | කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | 268 | 25,369,593.35 | 3,231,389.44 | 785% |
| ජී | අත්තනකඩවල ගොවිපල | 4 | 1,169,999.00 | 1,471,236.45 | 80% |
| එච් | නොච්චියාගම ආදර්ශ ගොවිපල | 19.2 | 333,168.88 | 610,585.00 | 55% |
| | කලංකුට්ටිය ගොවිපල | 6.8 | 1,939,306.90 | 1,415,681.40 | 137% |
| | නිරාවිය ගොවිපල | 140 | 17,943,670.91 | 17,549,061.79 | 102% |
| එල් | සම්පත්නුවරආදර්ශගොවිපල | 8.4 | 1,782,875.00 | 1,534,985.00 | 116% |
| රඹකැන්ඔය | රඹකැන්ඔය ගොවිපල | 20 | 2,895,005.00 | 3,550,297.50 | 81.54% |
| | මුළු එකතුව | | **94,580,944.54** | **72,594,070.76** | **130%** |

රු: මිලියන 94.58 ක් ද, ආදායම් ප්‍රතිශතය 81.39% කි.

### 3.2.14 2017 වර්ෂයේ ගොවිපලවල කෘෂි නිෂ්පාදනයන්හි ප්‍රගතිය

| කෘෂි නිෂ්පාදනය | ප්‍රමාණය(මෙ.ටො.) | ඉපැයූ ආදායම (රු: මිලියන ) |
|---|---|---|
| වී/ සහල්/ බීජ වී | 220 | 28.89 |
| පළතුරු (අඹ, ඩ්‍රැගන්ෆෘට්, කෙසෙල්) | 132 | 13.83 |
| ධාන්‍ය බෝග (බඩ ඉරිඟු, තල) | 12 | 1.08 |
| එළවළු | 22 | 0.83 |
| පොල් (ගෙඩි) | 13,085 | 0.63 |
| පැළ වර්ග (පැළ සංඛ්‍යාව) | 326,725 | 4.58 |
| බීජ වර්ග | 0.42 | 0.63 |
| පළතුරු ආශ්‍රිත නිෂ්පාදන (බෝතල්) | 1,784 | 0.29 |
| අතුරු බෝග වගාව | 1.6 | 0.06 |
| සත්ත්ව නිෂ්පාදන (කුකුළු පැටවු /බිත්තර /කිරි) | - | 15.97 |
| වෙනත් බදු ආදායම | - | 26.81 |
| ණය මුදල් | | 0.98 |
| **මුළු ආදායම රු.මිලි.** | | **94.58** |











## 3.3 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය

### හැදින්වීම

මහවැලි කලාප වල සුළු පරිමාණ හා ව්‍යාපාරික මට්ටමේ කිරි ගොවීන් 460,18ක් පමණ සිටින අතර එළගව හා මී ගව ගහනය 360,09,1කි201 .7 වාර්ෂයේ දියර කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 29.4කි . දෛනිකව දියර කිරි ලීටර 75, 000 ක් පමණ නිෂ්පාදනය කරන අතර කිරි මිලදී ගැනීමේ ආයතන විසින් කිරි ලීටරයක ගැනුම් මිලේ සාමාන්‍ය රු.65කට මිල දී ගනු ලබයි. එම නිෂ්පාදන සඳහා වාර්ෂිකව රු. මිලියන 1191ක පමණ මුදලක් මහවැලි කලාප වල කිරි ගොවීන් සඳහා ලබාගැනීමට හැකියාව ලැබී ඇත. 2020 දී වාර්ෂිකව දියර කිරි ලීටර් මිලියන 33ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත අතර එය ජාතික දියර කිරි නිෂ්පාදනයට දක්වන දායකත්වය 8% සිට 10% දක්වා වැඩි කිරීමකි.

මහවැලි ප්‍රධාන ජලාශ 10ක් ඇතුළුව ජලාශ 324ක් කලාප තුල පිහිටා ඇත .ධීවර ප්‍රජාව 5450ක් පමණ වන අතර වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 15,102 ක් නිෂ්පාදනය කරන අතර එය දෛනිකව කි .ග 40,000 කි. ඒ අනුව එක් මත්ස්‍ය කිලෝවක් සඳහා සමාන්‍ය රු. 200.00ක මිලක් වන අතර එයින් 2017 වර්ෂය තුලදී රු. මිලියන 3020ක් පමණ මහවැලි කලාප වල ධීවර ප්‍රජාව සඳහා උපයා ගැනීමට හැකි වී ඇත. 2020දී වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො.18000,ක් නිෂ්පාදනය කරමින් ජාතික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට දක්වන මහවැලි දායකත්වය 2 % සිට 25% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කර ඇත.

බොහෝ මහවැලි ජලාශ ආශ්‍රිතව මිරිදිය ඉස්සන් වගාව ප්‍රචලිත කිරීමට පියවර ගන්නා අතර ඒ තුලින් වාර්ෂික මිරිදිය ඉස්සන් නිෂ්පාදනය මෙ.ටො .10කි. අපනයනය සහ රටතුල හඳුනාගත් වෙළඳපල වෙත නිකුත් කිරීම ධීවර සමිති විසින් සිදුකරන අතර මිරිධිය ඉස්සන් කි.ග් එකක මිල රු. 800.00 සිට 1500.00 දක්වා වන ඉහළ මිලකට අලවි කිරීමේ හැකියව උදාවී ඇත. මෙම නිෂ්පාදනය 2020දී මෙ.ටො.20ක් දක්වා වැඩි කිරීම අපේක්ෂා කර ඇත.

ගෙවතු ආශ්‍රීත ගම්කුකුළු පාලනයේ නිරතව සිටින ගොවීන් හා ව්‍යාරික මට්ටමේ බිත්තර සහ මස් සඳහා කුකුළු පාලනයේ නිරත ගොවීන් 950,17ක් පමණ සිටියි . වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 50 ක් පමණ වන අතර කුකුළු මස් නිෂ්පාදනය මෙ.ටො,16,610ක් පමණ වේ. ගම්කුකුළු බිත්තරයක් රු.18.00ත් - 22.00ත් අතර ඉහළ මිලක් ලැබෙන අතර සාමාන්‍ය බිත්තරයක් රු. 16.00ක සාමාන්‍ය මිලකට අලවි කරයි. ජීව බර අනුව කුකුළු මස් කිලෝවක සාමාන්‍ය මිල රු. 280.00ක් වන අතර සාමාන්‍ය වෙළඳපල කුකුළු මස් කිලෝවක මිල රු. 440ක් පමණ වේ.

මහවැලි ප්‍රදේශ වල විසිතුරු මත්ස්‍ය වගාවේ නියුතු ගොවීන් 840ක් සිටින අතර 2017 වාර්ෂයේ දේශීය මෙන්ම විදේශීය වෙළඳපල සඳහා විසිතුරු මසුන් මිලියන 13.4ක් පමණ නිෂ්පාදනය කරමින් මහවැලි ජනපදිකයින් සඳහා රුපියල් මිලියන 300කට වැඩි අදායමක් උත්පාදනය කරගැනීමට කටයුතු කර ඇත . 2020 දී විසිතුරු මසුන් මිලියන 20ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

පාසල් ළමුන් අතර දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීමට 2017 වර්ෂය තුල දුෂ්කර පාසැල් 15ක් තොරාගෙන කිරි ගොවි සමිති සමග සම්බන්ධීකරනයෙන් පාසැල් පවත්වන කලයේ සතියකට දින 2-3ක් දියර කිරි ලබාදී, දරුවන් විෂය කරුණු පිළිබඳ දැණුවත් කරමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වාර්ෂිකව පාසල් හැරගිය තරුණ තරුණියන් 50ක් ස්වයං රැකියාවක් ලෙස සත්ත්ව පාලන කටයුතු සඳහා සත්ත්ව පාලන ගොවිපවුල් අතරට එකතු කිරීමට කටයුතු කිරීම හා මග පෙන්වීම.

## 2017 මූල්‍ය ප්‍රගතිය

| කලාපය | අනුමත ප්‍රතිපාදන (මිලියන.රු) | 2017 12.31.ට මූල්‍ය ප්‍රගතිය (000' .රු) | ප්‍රගතිය % |
|---|---|---|---|
| බී | **17.5** | 17.5 | 100 |
| සී | **6.63** | 6.12 | 92 |
| ඩී | **5.0** | 5.1 | 102 |
| ජී | 3.2 | 3.0 | 94 |
| එච් | 8.02 | 8.19 | 102 |
| එල් | 6.1 | 5.55 | 91 |
| හුරුළුවැව | 5.06 | 3.11 | 73 |
| වලව | 11.89 | 11.89 | 100 |
| රඹකැන්ඔය | 0.74 | 0.69 | 95 |
| රිදීමාලියද්ද | 7.27 | 4.08 | 56 |
| වික්ටෝරියා | 2.28 | 2.19 | 96 |
| ප්‍රධාන කාර්යාලය | 0.45 | 0.44 | 98 |
| **MCP** | 1.3 | 1.3 | 100 |
| **එකතුව** | **75.41** | **56.49** | **75** |

## 2017 භෞතික ප්‍රගතිය

| අනු අංක | ක්‍රියාකාරකම | ඒකකය | එකතුව | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය |
| | **වාර්ෂික නිෂ්පාදනය** | | | |
| I | දියර කිරි නිෂ්පාදනය (ලිටර/නිෂ්පාදන) | ලිටර සංඛ්‍යාව | 31 | 29.4 |
| | එළ ගව පාලනයේ යෙදෙන ගොවීන් | සංඛ්‍යාව | 1670 | 18460 |
| | එළ ගව ගනනය | සංඛ්‍යාව | 0 | 81400 |
| | මී ගව ගනනය | සංඛ්‍යාව | 0 | 28020 |
| II | ජලාශ | සංඛ්‍යාව | 324 | 117 |
| | ධීවරයින් සංඛ්‍යාව | සංඛ්‍යාව | 0 | 3666 |
| | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො) | මෙ.ටො.සංඛ්‍යාව. | 17000 | 15102 |
| | මිරිදිය ඉස්සන් නිෂ්පාදනය | නිෂ්පාදන ශුද්ධ ගණන | 14500 | 8580 |
| III | විසිතුරු මත්ස්‍ය ගොවිපල | | 0 | 840 |
| | විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය (මිලියන) | මත්ස්‍ය සංඛ්‍යාව | 20 | 13.4 |
| IV | කුකුළු ගොවිපල සංඛ්‍යාව | | 0 | 16940 |
| | බිත්තර නිෂ්පාදනය (මිලියන) | බිත්තර සංඛ්‍යාව | 60 | 50 |
| | කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.) | මෙ.ටො. | 20000 | 16614 |
| V | එළු පාලනය | සංඛ්‍යාව | 0 | 1280 |
| | එළු ගනනය | සංඛ්‍යාව | 0 | 15360 |
| | එළු මස් නිෂ්පාදනය | මෙ.ටො. | 112 | 96 |

## 3.4 ආයතන සංවර්ධන අංශය.

**2017 වර්ෂයේ ආයතන සංවර්ධන අංශය මගින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අංශ:**

- ආයතන සංවර්ධන කටයුතු } ගොවි සංවිධාන ප්‍රවර්ධනය / ප්‍රජා සහභාගීත්ව වාරි පද්ධති කළමනාකරණය
- ප්‍රජා සංවර්ධන කටයුතු
- කාන්තා සංවර්ධන කටයුතු
- ජාන පදික පුහුණු

**කාර්යභාරය:**

1. ගොවි සංවිධාන ප්‍රවර්ධනය
2. ප්‍රජා සහභාගීත්ව වාරි පද්ධති කළමනාකරණය
3. ප්‍රජා සංවර්ධනය
4. ජානපදික හැකියා වර්ධනය හා වෘත්තීය පුහුණු
6. කාන්තා සංවර්ධනය

### 2017 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන

| වැය වර්ෂය | ක්‍රියාකාරකම් | වෙන් කල මුදල |
|---|---|---|
| 2802 | ආයතන සංවර්ධන කටයුතු | 46.6 |
| 2815 | ප්‍රජා සංවර්ධන කටයුතු | 22.5 |
| 2841 | කාන්තා කටයුතු | 2.8 |
| 2941 | ජානපදික පුහුණු | 8.2 |
| | එකතුව | 80.25 |
| | වෙනත් ව්‍යාපෘති මඟින් | 46.2 |
| | මුළු එකතුව | **126.5** |

**2017 වර්ෂය සඳහා වෙන් වූ මුල්‍ය ප්‍රතිපාදන හා ලබා ඇති ප්‍රගතිය.**

| කලාපය | 2017 වර්ෂය සඳහා වෙන්වූ මුදල රු.මි. | 2017-12-30 දිනට ප්‍රගතිය රු.මි. | 2017 ප්‍රගතිය %100 | 2018 වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල රු.මි. |
|---|---|---|---|---|
| බී කලාපය | 14.94 | 14.94 | 100% | 15 |
| | 3.3 ව්‍යාපෘති | 1.735 | 52.6% | 04 |
| සී කලාපය | 17.14 | 15.723 | 92% | 22 |
| ඩී කලාපය | 2.22 | 2.22 | 100% | 4.9 |
| එච් කලාපය | 12.02 | 12.02 | 100% | 12.5 |
| එල් කලාපය | 5.99 | 5.72 | 95% | 6 |
| | 23.208 ව්‍යාපෘති | 21.765 | 94% | 15 |
| මොරගහකන්ද කලාපය | 4.11 | 4.11 | 100% | 6.5 |
| රඹකැන්ඔය කලාපය | 7.69 රඹකැන්ඔය ව්‍යාපෘතිය | 6.74 | 87% | 5 |
| | 12.049 රිදීමාලියද්ද ව්‍යාපෘතිය | 10.338 | 86% | 7 |
| වලව කලාපය | 13.4 | 12.88 | 95% | 13.5 |
| හුරුළුවැව කලාපය | 3.38 | 3.27 | 97% | 6.45 |
| වික්ටෝරියා කලාපය | 2.47 | 2.47 | 100% | 3.02 |
| ප්‍රධාන කාර්යාලය | 4.584 | 4.584 | 100% | 15 |
| එකතුව | 126.501 | 118.52 | 94% | 111.4 |

**2017 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන - සහභාගීත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩ සටහන්**

| කලාපය | ප්‍රතිසංස්කරණය කල කෙත් ඇළ සංඛ්‍යාව | වැය කල මුදල රු.මි | ශ්‍රම වටිනාකම රු.මි | නිමැවුම් වටිනාකම රු.මි |
|---|---|---|---|---|
| වලව කලාපය | 17 | 7.33 | 4.8 | 13 |
| එච් කලාපය | 09 | 3.89 | 0.58 | 4.47 |
| මොරගහකන්ද කලාපය | 02 | 0.97 | 0.52 | 1.5 |
| හුරුළුවැව කලාපය | 02 | 0.94 | 0.49 | 1.43 |
| බී කලාපය | 22 | 9.68 | 8.44 | 18.12 |
| සී කලාපය | 16 | 6.75 | 3.31 | 10.06 |
| එල් කලාපය | 02 | 0.58 | 0.73 | 1.3 |
| **එකතුව** | **70** | **30.14** | **18.87** | **49.01** |

| වැඩසටහන | කලාපීය මට්ටමෙන් පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| සුජාත දරුවෝ මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 151 |
| වකුගඩු රෝග සායන හා වෙනත් වෛද්‍ය සායන පැවැත්වීම | 346 |
| ගොවි සංවිධාන විගණන නිලධාරීන් පුහුණු කිරීම | 03 |
| ගොවි සංවිධාන ශක්තිමත් කිරීම, නිලධාරීන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම | 1,028 |
| කාන්තා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 278 |
| අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම | 318 |
| වැසිකිළි නොමැති පවුල් සඳහා වැසිකිළි ඉදිකරදීම | 320 |
| එකතුව | **2,444** |

**2017 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන්**

**දිළිඳු බව පිටු දැකීමේ ජාතික වැඩසටහන**

| කලාපය | පුහුණුව ලබා දුන් සංඛ්‍යාව | වැයකල මුදල රුමි. | දැනට රැකියාගත කර ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| මාසික ආදායම රු30.,000.00ට අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදී රැකියා ගත කර ඔවුන්ගේ පවුලේ ආදායම වැඩි කිරීම. | 1620 | 12.4 | 934 |
| එකතුව | 1620 | 12.4 | 934 |

## 3.3.6 පුහුණු පාඨමාලා

- වඩු කාර්මික
- මැහුම්
- පෙදරේරු
- රූපලාවන්‍ය
- බර යන්ත්‍ර පුහුණු
- ජංගම දුරකථන අලුත්වැඩියා පුහුණු
- ආහාර තාක්ෂණ
- වෙනත්

## 3.5 ව්‍යාපාර සංවර්ධන අංශය.

**ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය**

- සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය,පොල් වගාව,වෙනත් බෝග හා පළතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බොට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම
- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුලින් අදායම් උත්පාදනය
- සූර්ය බල ශක්ති,ජෛව ස්කන්ධ විදුලි බල ශක්ති ,ජල විදුලි බල ශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම
- ප්‍රදේශිය ආර්ථික සංවර්ධනයට සෘජුවම දායකවන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ජලය සැපයීම තුලින් ආදායම් ලබා ගැනීම
- ජලාශ මතු පිට පාවෙන සූර්ය බල ශක්ති විදුලි ව්‍යාපෘති සඳහා මහවැලි ජලාශ මතුපිට ආයෝජන අවස්ථා සලසාදීම
- දේශීය සීනි අවශ්‍යතාවය මෙරට තුලදීම නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්ත ශාලා වැනි ව්‍යාපෘතිවල ඉඩම් සහ ප්‍රදේශයේ ගොවීන් අතර ඉඩම් බෙදා දීම මඟින් බදු අදායම මෙන්ම රාජ්‍යභාගය ලබා ගැනීම
- කළුගල් /ඛණිජ ද්‍රව්‍ය (ඩොලමයිට්,තිරුවානා,ඇපටයිට්,මයිකා,හුනුගල් ) ආශ්‍රිත කර්මාන්ත සඳහා ලබාදෙන ඉඩම් වල බදු හා ඉවත් කරනු ලබන කියුබ් ප්‍රමාණය අනුව අයකිරීම.
- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම
- තිලාපියා වැනි මිරිදිය මත්ස්‍යයින් ජලාශ වල දැල් කූඩු තුල ඇති කිරීමේ ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් දිරිමත් කිරීම සඳහා සහනශීලි පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය බැංකු හා එක්ව ණය ලබා දීම.

### 3.5.1 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය
- “මොරගහකන්ද අත්වැල” ණය වැඩ සටහන හා “මහවැලි සවිය” ණය යෝජනා ක්‍රමය
- “මහවැලි හෙල බොජුන් හළ” ව්‍යාපෘතිය
- ආයෝජන ව්‍යාපෘති සමීක්ෂණය මඟින් තොරතුරු රැස් කිරීම
- මහවැලි ජලාශවල බොට්ටු සේවා ආරම්භ කිරීම
- “මහවැලි සතිය” වැඩ සටහනට සමගාමීව ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සංචාරක බංගලා**

| අනු අංකය | කලාපය | සංචාරක බංගලාවේ නම | | සංචාරක බංගලා සංඛ්‍යාව | ආසන්න නගරය | කාමර ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | බී | රුහුණුකෙත | | 1 | වැලිකන්ද | 10 |
| 1 | බී | පිඹුරත්තෑව | | 2 | අරලගංවිල | 4 |
| 1 | බී | පිඹුරත්තෑව (මාර්ඩ්) | | 3 | අරලගංවිල | 4 |
| 1 | බී | හංසයා පාලම | | 4 | අරලගංවිල | 4 |
| 2 | සී | දෙහිඅත්තකණ්ඩිය i | | 5 | දෙහිඅත්තකණ්ඩිය | 10 |
| 2 | සී | දෙහිඅත්තකණ්ඩිය ii | | 6 | දෙහිඅත්තකණ්ඩිය | 5 |
| 2 | සී | දෙහිඅත්තකණ්ඩිය iii | | 7 | දෙහිඅත්තකණ්ඩිය | 3 |
| 2 | සී | ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය | VIP | 8 | ගිරාඳුරුකෝට්ටේ | 1 |
| 2 | සී | ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය | සාමාන්‍ය | 8 | ගිරාඳුරුකෝට්ටේ | 3 |
| 2 | සී | ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය | A ශ්‍රේණිය | 8 | ගිරාඳුරුකෝට්ටේ | 20 |
| 2 | සී | ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය | B ශ්‍රේණිය | 8 | ගිරාඳුරුකෝට්ටේ | 8 |
| 2 | සී | උල්හිටිය/රත්කිඳ | I | 9 | මැදගම | 2 |
| 2 | සී | උල්හිටිය/රත්කිඳ | II | 9 | මැදගම | 3 |
| 3 | ඩී | සූරියපුර | | 10 | කන්තලේ | 6 |
| 3 | ඩී | බිසෝපුර (නව) | | 11 | මැදිරිගිරිය | 6 |
| 4 | ජී | මොරගහකන්ද විශේෂ ව්‍යාපෘතිය | | 12 | මොරගහකන්ද | 4 |
| 4 | ජී | බකමූණ | | 13 | බකමූණ | 6 |
| 5 | එච් | කලා වැව | VIP | 14 | කලාවැව | 2 |
| 5 | එච් | කලා වැව | සාමාන්‍ය | 14 | කලාවැව | 3 |
| 5 | එච් | තඹුත්තේගම | | 15 | තඹුත්තේගම | 4 |
| 5 | එච් | නොච්චියාගම | | 16 | නොච්චියාගම | 6 |
| 5 | එච් | නිරාවිය | | 17 | තඹුත්තේගම | 4 |
| 7 | වික්ටෝරියා | 222 නේවාසික ව්‍යාපාර කාර්යාල සංචාරක බංගලාව | | 19 | දිගන | 4 |
| 7 | වික්ටෝරියා | නුවරඑළිය (නව ඉදිකිරීමකි) | | 20 | නුවරඑළිය | 6 |
| 7 | වික්ටෝරියා | කොත්මලේ 119 | 2 | 21 | කොත්මලේ | 3 |
| 7 | වික්ටෝරියා | බූ වැලිකඩ | | 22 | මහනුවර | 3 |
| 8 | වලව | උඩවලව | | 23 | ඇඹිලිපිටිය | 4 |
| 8 | වලව | ඇඹිලිපිටිය | | 24 | ඇඹිලිපිටිය | 8 |
| 8 | වලව | මයුරපුර | | 25 | සූරියවැව | 5 |
| 9 | රඹකැන්ඔය | මහඔය | | 26 | මහඔය | 4 |
| 9 | රඹකැන්ඔය | බදුල්ල | | 27 | බදුල්ල | 6 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | පොල්ගොල්ල | | 28 | මහනුවර | 4 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | කොත්මලේ 119 | 1 | 29 | කොත්මලේ | 4 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | රන්දෙණිගල | VIP 1 | 30 | මහියංගනය | 3 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | රන්දෙණිගල (පැරණි) | 2 | 30 | මහියංගනය | 4 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | බෝවතැන්න | | 31 | නාවුල | 3 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | මාදුරුඔය | | 32 | අරලගංවිල | 4 |
| | එකතුව | | | | | **187** |

2017/04/03 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරිය සතු සියලුම සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්ථනය කිරීම පිණිස අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන ) යටතට පත්කරනු ලැබූ අතර, ව්‍යාපාර සංවර්ධන අංශය තුල ස්ථාපිත කරනු ලැබූ මෙහෙයුම් ඒකකය සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) වරයෙකු යටතේ ක්‍රියාත්මක කෙරේ.

### 3.5.1 2017 නවීකරණය කරන ලද සංචාරක බංගලා

| අ.අං | සංචාරක බංගලාව | සිදු කරන ලද නවීකරණ | වැය වූ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 01 | කලාවැව | පූර්ණ අලුත්වැඩියාව | 52.3 |
| 02 | දෙහිඅත්තකණ්ඩිය | පූර්ණ අලුත්වැඩියාව හා ලී බඩු උපකරණ | 64 + VAT |
| 03 | නුවරඑළිය | පූර්ණ අලුත්වැඩියාව හා ලී බඩු උපකරණ | 15.5 |
| 04 | කොත්මලේ | ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු හා ලී බඩු උපකරණ | 9.0 |
| 05 | බකමූණ | ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු හා ලී බඩු උපකරණ | 0.9 |
| 06 | නොච්චියාගම | ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු | 0.4 |

දෙහිඅත්තකණ්ඩිය සංචාරක බංගලාව නවීකරණයට පෙර









නවීකරණය කරන අතරතුර







කලාවැව, නුවරඑළිය, බකමූණ හා නොච්චියාගම සංචාරක බංගලාවන්හි නවීකරණ කටයුතු තව දුරටත් සිදු වෙමින් පවති.

### 3.5.2 සංචාරක බංගලා අන්තර්ජාලයෙන් වෙන්කිරීම ( e- service)

සංචාරක බංගලා අන්තර්ජාලයෙන් වෙන්කිරීම 2017 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන අංශය මගින් හඳුන්වාදෙන ලද ප්‍රමුඛ වැඩසටහනකි. සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්ථනය කිරීම සඳහා, 2017 සැප්තැම්බර් මස 02 වන දින මහවැලි සංචාරක බංගලා ක්ෂේත්‍රය නව මගකට යොමුකරමින් අන්තර්ජාලයෙන් සංචාරක බංගලා වෙන් කිරීමෙන් පහසුකම හඳුන්වා දෙන ලදී.සංක්ෂේතවත් ලෙස අන්තර්ජාලයෙන් සංචාරක බංගලා වෙන් කිරීම අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් “බී”කලාපයේ, රුහුණුකෙත සංචාරක බංගලාව මූලික කරගනිමින් ක්‍රියාත්මක විය.



### 3.5.3 වර්ෂයේ සංචාරක බංගලා ආදායම් උත්පාදනය

2017 වර්ෂයේ සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්තනය කිරීමත් සමඟ 2016 වර්ෂයට සාපේක්ෂව ආදායම් උත්පාදනය **රු.මි.3.6 කින්** ඉහළ ගොස් ඇත.

| වෂර්ය | ආදායම (රු) |
|---|---|
| **2016** | 1,661,000.00 |
| **2017** | 5,260,450.00 |




### 3.5.4 “මහවැලි සවිය” ණය යෝජනා ක්‍රමය (2017 දෙසැම්බර් දක්වා)

| කලාපය | ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව | ණය මුදල රු |
|---|---|---|
| එච් | 10 | 2,000,000.00 |
| සී | 14 | 2,800,000.00 |
| ජී | 43 | 8,050,000.00 |
| වලව | 114 | 22,800,000.00 |
| එකතුව | **181** | **35,831,000.00** |

### 3.5.5 "මොරගහකන්ද අත්වැල" ණය වැඩ සටහන

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය නිසා ඉඩම් අහිමි වූ පුද්ගලයින්, මොරගහකන්ද කලාපයේ වැල්ලේවෙල හා ගුරුවෙල යන කොට්ඨාශ වල නැවත පදිංචි කරන ලද අතර, එම පදිංචිකරුවන්ගේ ඔවුන්ගේ ඉදිරි පරම්පරාවලත් ජීවන තත්වය උසස් කිරිම සඳහා අතිරේක ආදායම් මාර්ග උත්පාදනය පිණිස සුළු පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධන සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දිම, ප්‍රාථමික වගා කටයුතු වලින් බැහැරව කෘෂි කාර්මික නිෂ්පාදන පදනම් කර ගත් ව්‍යවසායන් ඇරඹීම සඳහා ඒ ආශ්‍රිත අගය එකතු කිරිමේ නිෂ්පාදන බිහි කිරිම, කෘෂි කාර්මික නොවන ව්‍යාපාර හා සේවා පවත්වා ගෙන යාම ආදි ව්‍යාපෘති සඳහා මුලික ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා දිම සඳහා චක්‍රිය ණය වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක විම. ණය වැඩ සටහන යටතේ රු. මිලියන 25 ක අරමුදලක් ප්‍රතිලාභින් අතර බෙදා හැරේ. මෙහිදි එක් පුද්ගලයෙකු සඳහා ලබා දෙන උපරිම ණය මුදල රු. ලක්ෂ 03 කි. මෙම ණය මුදල 7% ක සහනදායි වාර්ෂික පොළි අනුපාතයක් යටතේ ලබා දෙන අතර, ණය ආපසු ගෙවිමේ කාලය මාස 36 කි. තව ද මේ සඳහා සුදුසු බැංකුව ලෙස ප්‍රජාව සමඟ සුහදව හා පසුවිපරම් සේවාවක් සහිතව කටයුතු කරන ප්‍රාදේශිය බැංකුව තෝරා ගන්නා ලදි.

| මොරගහකන්ද අත්වැල | | |
|---|---|---|
| **කලාපය** | **ප්‍රතිලාභින් ගණන** | **නිකුත් කරන ලද ණය මුදල** |
| මොරගහකන්ද | 22 | මිලියන 6.5 |

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයෝජන ව්‍යාපෘති සමීක්ෂණය

## 2018 ජනවාරි 31 දක්වා සාරාංශය

| විස්තරය | | කලාපය | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බී | සී | ඩී | එච් | එල් | වික්ටෝරියා | මොරගහකන්ද | රඹකැන්ඔය | හුරුළුවැව | වලව | |
| මුළු ආයෝජන සංඛ්‍යාව | | 325 | 55 | 12 | 36 | 38 | 32 | 3 | 8 | 14 | 41 | 563 |
| ව්‍යාපාර ක්ෂේත්‍ර අනුව ආයෝජන සංඛ්‍යාව | බෝග වගාවන් හා වන වගාව | 157 | 11 | 9 | 7 | 7 | 0 | 0 | 1 | 0 | | 192 |
| | සත්ව පාලනය හා විසිතුරු මත්ස්‍ය වගාව | 21 | 8 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 1 | 2 | 34 |
| | සත්ව පාලනය හා බෝග වගාව | 33 | 2 | 2 | 0 | 30 | 0 | 0 | 1 | 1 | 11 | 80 |
| | ඇඟලුම් කර්මාන්තය | 1 | 12 | | 3 | | 3 | 2 | 1 | 1 | 5 | 28 |
| | සංචාරක කර්මාන්තය | 2 | 0 | 0 | 2 | 0 | 2 | 0 | 1 | 1 | 3 | 11 |
| | වෙනත් | 111 | 22 | 1 | 24 | 1 | 27 | 1 | 2 | 10 | 19 | 218 |
| රැකියා ජනනය | ස්ථිර | 610 | 426 | 37 | 1,642 | 96 | 1,845 | 1,435 | 16 | 920 | 3,811 | 10,838 |
| | තාවකාලික | 1,640 | 233 | 12 | 209 | 56 | 263 | 341 | 23 | 92 | 336 | 3,205 |

(වලව කලාපයේ පමණක් 2016 වසරේ සමීක්ෂණ තොරතුරු ඇතුලත් කර ඇත)







### 3.5.6 මහවැලි ජලාශවල බෝට්ටු සේවා ආරම්භ කිරීම

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | වික්ටෝරියා | වික්ටෝරියා ලෙෂර් (පුද්) සමාගම 339/6,මීගමු පාර,පැලියගොඩ | 2016.01.06 සිට 2021.01.05 දක්වා | 100,000.00 | පලමු වර්ෂ 2 සඳහා 75000 බැගින් වන අතර පසුව 5% බැගින් වාර්ෂිකව වැඩි වේ. |
| 02 | පොල්ගොල්ල | මහවැලි රිච් හෝටලය 35, පී.බී.ඒ. වීරකෝන් මාවත, මහනුවර (මෝටර් බෝට්ටු) | 2016.02.09 සිට 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
| | | සිනමන් සිටාඩෙල් අංක 117, සර් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02 | 2016.02.09 සිට 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා කුඩා හා මධ්‍ය පරිමාණ සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් -සමූහය

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සහ පූර්ණහිමිකාරිත්වය සහිත පරිපාලිත සමාගම් 03 ක් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර එක් සමාගමක් ඈවරකරමින් පැවතුණි. එයින් ණයහිමියන්ගේ ගණන්බේරා වසාදැමීමේ කටයුතු සිදුකරනු ලබන මහවැලි වෙන්චර් කැපිටල් ( පුද්) සමාගමේ රු. 15,550,577 ක වත්කම් හා රු. 394,657 ක වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර නොතිබුණි.

(ආ) අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණද සමාගම විසින් අනුගමනය කරන ලද පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 17 පරිච්ඡේදයේ 17.19 වගන්තිය පරිදි මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික ) සමාගමේ සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද් ) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය පිළිවෙලින් රු. 3,035,306 ක් හා රු.7,313,171 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 04 පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව මාස හයකින් කල්පිරෙන රු. 5,802,607 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස වාර්තාකළ යුතු වුවද ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිතයෙහි 28 පරිච්ඡේදයේ 28.18 වගන්තිය අනුව පාරිතෝෂික වෙන්කිරීමේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය හෝ ඒ හා සමාන වෙනත් ක්‍රමයක් අනුගමනය කළ යුතු වුවද මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික ) සමාගම විසින් සේවකයන් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයට අදාලව සිදුකර තිබූ පාරිතෝෂිත වෙන්කිරීම් ද පිළිවෙලින් රු.1,609,568 ක් සහ රු.1,216,096 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.134,578,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සටහනක් මඟින් හෙළිදරව්කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අධිකාරිය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.මිලියන 24,404 ක් වී තිබුණි.

### 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 1984 -1989 කාලපරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණු පිරිවැය රු.67,440,853 ක්වූ ඉඩම් කට්ටි 03 ක සාධාරණ වටිනාකම අගයකර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉන් ඉඩම් කට්ටි 02 ක් ගාස්තු ගෙවීමෙන් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණද ඒ සඳහා ගාස්තු අයකර නොතිබුණි.

(ආ) නිරාවිය ගොවිපල සහ මහවැලි බී හා එච් කලාපවල සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.7,305,230 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අතුළත් මාර්ගස්ථ මුදල් ශේෂය තුල රු.38,251,826 ක වෙනත් ලැබිය යුතු ශේෂ දක්වා තිබුණි.

(ඈ) අධිකාරිය සතුව උඩවලව කලාපයට අයත් නිවාස 3 ක්, සයනාගාර 2 ක්, නිවාඩු නිකේතනයක් හා ගොඩනැගිල්ලක් පැවති අතර එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු.671,503,748 ක්වූ ස්ථාවර වත්කම් වලින් කොටසක් රු.180,131,037 කට ප්‍රත්‍යාගණනයකර ගිණුම්ගත කර තිබුණ ද ඉතිරි වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) නිරාවිය ගොවිපලේ වර්ෂය අවසානයේ පැවති රු.1,161,780 ක් වටිනා කිලෝ ග්‍රෑම් 24,750 ක පොහොර තොගය අවසන් තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) මොරගහකන්ද ව්‍යාපෘතියෙන් හා ගංගා ද්‍රෝණි කාර්යාලයෙන් නිරාවිය ගොවිපල වෙත 2010 – 2016 කාලයතුල ලබා දී තිබුණු යතුරු පැදි 12 ක්, මල්ටි වොපර් යන්ත්‍ර 02 ක්, කිරි ප්‍රවාහන ලොරියක්, ට්‍රැක්ටර් 03 ක්, කුකුළු පාලන ගොඩනැගිලි 04 ක්, විද්‍යුත් බර මැණුම් උපකරණ 02 ක් හා බෙලින් මැෂිම විධිමත්ව පවරා ගැනීමට හා වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) වික්ටෝරියා කලාපයේ පුස්තකාල පොත් 7,588 ක වටිනාකම් ගණනයකර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු. 12,620,622 ක භිහ බදු කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද 2016 වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු 2015 වර්ෂයේ භිහ බදු කුලී ආදායම වූ රු.20,960,226 ක් සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමේදී එම ආදායම සමුච්චිත අලාභයට දෝෂ සහිතව බැර කර ලැබියයුතු බදුකුලී ගිණුම හර කිරීම හේතුවෙන් සමුච්චිත අලාභය හා ලැබිය යුතු බදු කුලී ගිණුම රු.41,920,452 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) මහවැලි බී කලාපයේ ඉඩම්වලින් සමාගමක් විසින් සමලෝචිත වර්ෂයේ දී ලබාගත් වැලි කියුබ් 75,941 ක් වෙනුවෙන් ලැබියයුතු ඉඩම් පරිහරන ගාස්තුව වූ රු.37,970,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) මුදල් හා මුදල් සමාන දෑ වල ඇතුළත් රු.2,602,908 ක ඉතුරුම් තැන්පතු, රු.727,481 ක ස්ථාවර තැන්පතු හා රු.1,000,000 ක කෙටිකාලීන තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) ණය යෝජනා ක්‍රමයක් සඳහා 2006 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ තැන්පත් කර ඇති රු.50,000,000 ක මුදල හා ඊට අදාල රු.16,196,761 ක පොලී මුදල අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දේපල පිරියත හා උපකරණ ක්ෂය හා මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජනවල එකතු වටිනාකම රු.945,474,952 ක් වූ අතර අදාල උපයෝගී ලේඛනවල එම වටිනාකම රු.915,514,765 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 29,960,187 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ස්ථාවර වත්කම් කලාප අතර හුවමාරු කිරීමේදී කලාපවලට ස්ථාවර වත්කම් ලැබීම් හා කලාප විසින් නිකුත් කිරීම්, ගිණුම් ඒකාබද්ධ කිරීමේදී තුලනය වියයුතු වූවද, කලාපවලින් ලැබුණු වත්කම් රු.409,983,931 ක් ලෙස හා කලාපවලට යවනලද වත්කම් රු.266,936,487 ක් ලෙස දැක්වීමෙන් රු.143,047,444 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3.5 අවිනිශ්චිත ගිණුම්

අධිකාරියට අයත් පරිපාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.14,117,550 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

### 2.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් ශේෂ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම විෂයය | විස්තරය | වටිනාකම රු. | නොලැබුණු සාක්ෂි |
|---|---|---|---|
| ආයෝජන - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම | 10,000,000 | කොටස් සහතික |
| | මහවැලි වෙන්චර් කැපිටල් සමාගම | 10,398,000 | කොටස් සහතික |
| | මහවැලි උපදේශක කාර්යාංශය සමාගම | 64,000 | කොටස් සහතික |
| | සවාභාවික සම්පත් කළමනාකරණ සේවා සමාගම | 15,000 | කොටස් සහතික |
| වත්කම් | ඉතිරිකිරීමේ ගිණුම | 2,632,908 | ශේෂ සනාථ කිරීම් හා බැංකු පාස් පොත |
| | ස්ථාවර තැන්පතු | 727,481 | තැන්පතු සහතික හා ශේෂ සනාථ කිරීම් |
| ආදායම් | එච්,උඩවලව හා වික්ටෝරියා කලාපවල බදුකුලී ආදායම | 518,363,565 | හිඟ බදු ලේඛන |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.712,249,000 ක ලැබිය යුතු බදුකුලී ආදායමක් වූ අතර ඉන් රු.24,776,000 ක් වර්ෂ 05 ක්ද රු.10,463,000 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් ද ඉක්මවා තිබුණි. අධිකාරිය සතු ඉඩම් බදු දීම් වලින් බදු ආදායම් රැස්කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම හිඟ බදු ආදායම වාර්ෂිකව වැඩි වීමට හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ පූර්ව අත්තිකාරම් රු.535,226,000 ක් වූ අතර ඉන් රු.3,466,000 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණද අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විදුලිය, ජලය හා පවිත්‍රතා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අධිකාරියට අයත් ගොඩනැගිලි බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබූ අතර පාර්ශව 05 කින් වර්ෂ 04 ට වැඩි කාලයක සිට රු.4,030,119 ක වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම අධිකාරියට අයත් රු.104,394,675 ක් වටිනා ගොඩනැගිලි බාහිර පාර්ශව 13 ක් විසින් භාවිතයට ගන්නා නමුත් ඒ සඳහා කුලියක් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.766,474,000 ක් වූ අතර, ඉන් රු.23,779,000 ක් වසර 05 ඉක්මවා තිබුණි.එම ශේෂවල ඇතුළත් රු.9,857,000 ක අත රැඳවුම් මුදල්වලට අදාල කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරු කර ගෙන රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 2010 වර්ෂයේදී අධිකාරිය සතු කලංකුට්ටිය ගොවිපලෙන් අක්කර 25 ක ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශයකට අයත් පශු සම්පත් ව්‍යාපාරික සමාගමට විධිමත් පරිදි බදු දී නොතිබුණු අතර 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු බදු මුදල රු.10,035,000 ක් වී තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 87 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 93 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 104 (4) | වාහන අනතුරු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණු බැවින් අලාභ ප්‍රමාණය හා ඊට වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන අලාභ අයකරගැනීමට කටයුතුකර ඇත්දැයි පරීක්ෂාකළ නොහැකි විය. |
| (ii) මුදල් රෙගුලාසි 757 | අධිකාරියේ කලාප 08 ක ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව වාහන අපහරණයෙන් ලැබෙන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වාහන අපහරණයෙන් ලැබී තිබුණු රු.36,521,474 ක් අනුමැතියකින් තොරව අධිකාරිය විසින් රඳවාගෙන තිබුණි. |
| (ඈ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 හා 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛවල 3.2 ඡේදය හා 2.3.3 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘති සඳහා නිදහස්කර තිබුණු නිලධාරීන් 03 දෙනෙකුට අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ සේවය කරන ලද කාලය වෙනුවෙන් අධිකාරිය විසින් රු. 4,282,668 ක වැටුප් ගෙවා තිබුණි. |
| (ඉ) අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය, අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වගන්තිය | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය නිම වී දින 07 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු. 156,851,005 ක සැපයුම් අත්තිකාරම් විය . |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමූහයේ හා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.437,478,000 ක හා රු.433,846,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.34,600,000 ක් හා රු.37,851,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.402,878,000 ක හා රු.395,995,000 ක ඌනතාවයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. අධිකාරියේ වියදම් රු.337,305,000 කින් වැඩිවීම ඌනතාවයේ වැඩිවීමට මූලික වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.350,271,000 ක්ව පැවති අධිකාරියේ ඌනතාවය 2013, 2015 හා 2016 වර්ෂවලදී අඩුවී 2014 වර්ෂයේදී වැඩිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.1,876,561,000 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2013, 2014 හා 2015 වර්ෂවලදී අඛණ්ඩව වැඩිවී 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අඩුවෙමින් පැවතුණි.

### 3.2 අධිකාරියට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන හා පුද්ගලයන් විසින් නිවාස සන්තකය ආපසු ලබාගැනීමට හා පාරිතෝෂික නොගෙවීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව නඩු 18 ක් ගොනු කර තිබුණු අතර එහි මූල්‍ය බැදීම රු.මිලියන 43.775 ක් වී තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීමේ දී පවතින අඩුපාඩු හේතුවෙන් රාජ්‍ය භාගය ලැබීම් හා නිවාස/ඉඩම් කුලී ආදායම 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 203,347,000 න් අඩුවෙන් ලැබී තිබුණි.

(ආ) ජනපදිකයින් පුනරුත්ථාපනය, වර්ධනය හා නඩත්තු වියදම් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී රු.330,300,000 න් වැඩිවී තිබුණු අතර 2016/2017 වර්ෂවලදී බී කලාපයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මෙයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

රාජ්‍ය ව්‍යවසායේ ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය අනුව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එපරිදි සංයුක්ත සැලැස්ම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. තවද 2017 වර්ෂයට අදාල කාර්යසාධනයට අනුකූලව සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2017 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කර තිබුණි. ක්‍රියාකාරී සැලැසුමට අනුව සකස්කරන ලද අධිකාරියේ ප්‍රගති වාර්තා 2018 සැප්තැම්බර් 31 දින වනවිටද විගණනයට ලබා දී නොතිබුණි.

### 4.1.2 ක්රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි ගඟේ ඝන මීටර් මිලියන 6,900 ක පමණ වූ ජල ප්‍රමාණයෙන් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා ජලය සැපයීමට සැලසුම් කර තිබුණි. එසේම මහ සැලැස්මට අනුව මහවැලි කලාප 13 ක ඉඩම් හෙක්ටයාර් 365,853 ක් සඳහා වාරි පහසුකම් සැපයීමට යෝජිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර 85,252 ක් සඳහා වාරි පහසුකම් සපයා තිබුණු අතර විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමට යෝජිත ජලාශ 11 න් ජලාශ 06 ක පමණක් ජල විදුලිය නිෂ්පාදනය කර තිබුණි.

(ආ) ඉඩම් අංශය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගෙවතු, වාරි හා කෘෂි වර්ෂා පෝෂිත කටයුතු සඳහා පිළිවෙලින් ඉඩම් අවසර පත්‍ර 13,550 ක්, 2530 ක්, 580 ක් බෙදා දීමට සැලසුම්කර තිබුණද පිළිවෙලින් අවසර පත්‍ර 12,093 ක්, 2,032 ක් හා 426 ක් බෙදා ද තිබුණි. ගෙවතු, වාරි හා කෘෂි වර්ෂා පෝෂිත කටයුතු සඳහා පිළිවෙලින් ප්‍රදාන පත්‍ර 10,260 ක්, 3,525 ක් හා 3,070 ක්, බෙදා දීමට සැලසුම්කර තිබුණද පිළිවෙලින් ප්‍රදාන පත්‍ර 8,668 ක්, 2,876 ක් හා 2,568 ක් බෙදා දී තිබුණි. වාණිජ කටයුතු, ආයෝජන ව්‍යාපෘති හා නිවාස බදු

පදනමට ලබා දී රු.216,789,000 ක මුදලක් රැස්කිරීමට ඉලක්කකර තිබුණද රු.189,084,000 ක් පමණක් රැස්කර තිබුණි.

(ඇ) අධිකාරිය යටතේ ක්‍රියාත්මක ධීවර හා පශු සම්පත් අංශයේ ඉලක්කගත හා තත්‍ය වශයෙන් ලඟාකර ගත් ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(i) අධිකාරියේ සියයට 50 දායකත්වය මත ජනපදිකයින් වෙත කුකුළු පැටවුන් බෙදාහැරීම සඳහා රු.3,065,000 ක ප්‍රතිපාදන වෙන්කර පැටවුන් 37,716 ක් බෙදාදීමට අපේක්ෂා කර තිබුණද රු.2,679,000 ක් වැයකර පැටවුන් 29,012 ක් පමණක් බෙදාහැර තිබුණි.

(ii) මහවැලි කිරි ගොවීන්ගේ සතුන් 158 ක් රක්ෂණය සඳහා රු.191,000 ක් ප්‍රතිපාදනයකර තිබුණු අතර රු.36,000 ක් වැයකර සතුන් 50 ක් පමණක් රක්ෂණයකර තිබුණි.

(iii) සුරතල් මත්ස්‍ය අභිජනනය සඳහා වන සතුන් බෝකිරීමේ ඒකක 20 පිහිටුවීම සඳහා රු.1,970,000 ක ප්‍රතිපාදනය කර තිබුණු අතර රු.474,000 ක් වැයකර ඒකක 8 ක් පමණක් පිහිටුවා තිබුණි.

(ඈ) ව්‍යාපාර සංවර්ධන අංශය ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

------------------------------------------------------------

(i) විගණනයට ඉදිරිපත්කරන ලද කලාප 06 තොරතුරු අනුව දිගුකාලීන ඉඩම් බදුදීම් 418 ක් අතුරින් සාර්ථකව ව්‍යාපාර පවත්වාගෙන යන ආයෝජකයින් 153 ක් වූ අතර, ඒ අතරින් ආයෝජකයින් 28 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු කුලිය රු.21,194,183 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) සංවර්ධනය කර නොමැති ඉඩම් 158 ක් වූ අතර, මුළු බදු දුන් ඉඩම් ප්‍රමාණයෙන් එය සියයට 38 ක් විය. ඉන් ව්‍යාපාර 38 ක් සඳහා රු.6,891,708 ක හිඟ ශේෂ අයවීමට තිබූ අතර, එම බදු අයකර ගැනීමට හෝ අධිකාරිය වෙත නැවත ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අන්සතු, අනවසරකරුවන් ව්‍යාපාර කරනු ලබන, වසා ඇති, නවතා ඇති, ව්‍යාපාර ආරම්භ කර නැති, සංවර්ධනය වෙමින් පවතින ව්‍යාපාර 60 කින් ව්‍යාපාර 20 ක් සඳහා අයවියයුතු හිඟ බදු මුදල රු. 1,509,893 ක් වී තිබුණි.

(iv) ඩී හා බී කලාපවල ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් අක්කර 3,489.19 කින් සංවර්ධනය කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 1,334.09 ක් හෙවත් මුළු ලබාදුන් ඉඩම්වලින් සියයට 38.23 ක් පමණක්වී තිබුණු නමුත්, ඊට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) එල්'' කලාපයේ අක්කර 755 ක් වැනි විශාල ඉඩම් ප්‍රමාණයක් ආයෝජකයින් 30 දෙනෙකු සඳහා 2013 හා 2014 වර්ෂවලදී ලබාදී ඇති නමුත්, විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 31 දින වනවිටද කිසිදු සංවර්ධනයක් සිදුකර නොතිබුණි. මෙවැනි විශාල ඉඩම් ප්‍රමාණයක දැව ඉවත් කර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් ලබාදී තිබුණද, ආයෝජකයින්ගේ ඉඩම්වල තිබූ වගාවන් වල් අලීන් විසින් විනාශ කර ඇති බව වාර්තා අනුව සනාථ විය. ව්‍යාපාර සඳහා ඉඩම් ලබාදීමට පෙර සුදුසු ඉඩම් තෝරා නොගැනීම නිසා වන සතුන්ගෙන් වගා හානි වලක්වාගත නොහැකිවී තිබීම හේතුවෙන් ඉඩම් ලබාදුන් අරමුණ ඉටුවී නොතිබුණු අතර විශාල පරිසර හානියක්ද සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක ණය වැඩසටහන්

---

"මහවැලි සවිය'' ණය වැඩසටහන සඳහා අධිකාරිය විසින් ජනපදිකයින් වෙත ණය ලබාදීම වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව අධිකාරිය 2010 වර්ෂයේදී රු.72,750,000 ක් බැංකුව වෙත ලබාදී තිබුණි. ණය නිකුත් කිරීමට යොදා නොගත් අරමුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරි කිරීමේ පොළියට සමාන පොළියක් අධිකාරියට ලැබිය යුතු වුවද 2011 සිට 2017 වර්ෂය දක්වා එක් එක් වර්ෂවලදී ඉතිරි මුදල් ශේෂවල එකතු වටිනාකම රු.335,850,255 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු පොළියක් ලබාගෙන නොතිබුණු අතර එම ශේෂ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම අවබෝධතා ගිවිසුමේ 04 වන වගන්තියට පටහැනිව අධිකාරියේ සේවකයින් තිදෙනෙක් වෙත ද රු.650,000 ක ණය ලබාදී තිබුණි.

මහජන බැංකුව සමඟ 2013 ජනවාරි 07 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජනපදිකයින්ට ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීමට ණය ලබාදීම සඳහා "මහවැලි අරුණ" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇති අතර, ණයකරු ගෙවන පොලිය හා ප්‍රකාශිත පොලිය අතර වෙනස අධිකාරිය දරනු ලබයි. අවබෝධතා ගිවිසුමේ 02 වගන්තියට පටහැනිව අධිකාරියේ සේවකයන් තිදෙනෙක් වෙත ද රු. 600,000 ක ණය ලබා දී තිබුණි. මෙහි ඉලක්කගත අරමුණෙහි යොදවා ඇත්ද, ඉන් නිසි ප්‍රතිලාභ ලබාගෙන ඇත්ද, ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය කෙසේද යන්න පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි.

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව "මහවැලි දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ එක් එක් කලාපවල ගොවි සංවිධානවල සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කලාප 02 කට පමණක් රු.15,435,000 ක් නිදහස් කර තිබුණද කලාප 08 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.
එම එක් කලාපයක් වූ "එච්" කලාපයේ ගොවි සංවිධානයක් මඟින් ණයකරුවන් වෙත උපරිම ණය සීමාව වූ රු. 200,000 ඉක්මවා ජනපදිකයින් තිදෙනෙක් වෙත අනුමැතියකින් තොරව රු.1,250,000 ක ණය ලබා දී තිබුණි.

අධිකාරිය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව 2017 වසරේ සිට ක්‍රියාත්මක මොරගහකන්ද කලාපයේ ව්‍යාපාරික අත්වැල ණය යෝජනා ක්‍රමය සඳහා 2016 අගෝස්තු 04 දින මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබුණු රු.මිලියන 25 ක මුදල අධිකාරිය විසින් අදාල කාර්යයට නොයොදවා ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණි. පසුව එය 2017 වර්ෂයේදී බැංකුව වෙත තැන්පත් කර තිබුණද එය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. අවබෝධතා ගිවිසුම අනුව ණය නිකුත් නොකරන මුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වල පොළියට සමාන පොළියක් අධිකාරියට ලැබිය යුතු වුවත්, 2017 වර්ෂය අවසානයට අරමුදලේ ඉතිරි ශේෂය වන රු.6,368,400 ක් සඳහා පොළියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයෝජකයින්ගේ යෝජනා අනුව ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවල ජලය සහ රක්ෂිත ඉඩම් භාවිතාකරමින් ක්‍රියාත්මක වන සුළු පරිමාණ ජල විදුලි බලාගාර 46 ක් සහ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු ජල විදුලි බලාගාර 24 ක් පැවතියද අධිකාරිය පනතේ 3(1), 12 සහ 13 වගන්ති ප්‍රකාරව රාජ්‍ය භාගය අයකර ගැනීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාර 3 ක් ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ලබා දී තිබුණු ඉඩම්වලින් ගිවිසුම් ප්‍රකාරව නාමික අගයක් වශයෙන් රු.25,733,500 ක බදුකුලියක් අයවියයුතුව තිබියදී පසුව ඉඩමේ නොදියුණු වටිනාකම අනුව මෙම මුදලින් රු.3,681,600 ක් අයකර ගැනීමට අධිකාරිය විසින් එන්තරවාසි යවා තිබුණද මෙතෙක් එම මුදලද අයවී නොතිබුණි.

(ආ) ජාවත්ත ප්‍රදේශයේ පිහිටි අධිකාරියට අයත් නොවන ඉඩම්වල රු.76,580,000 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණු අතර එම ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් පරිපාලිත සමාගම් 05 හි සිදුකර තිබුණු රු. 439,000,000 ක ආයෝජනයන් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි සී කලාපයේ පිහිටි ගල්වලවල් 03 කින් ඉවත්කළ කලුගල් කියුබ් 1943 ක් සඳහා අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කියුබ් එකක් සඳහා රු.1,000 බැගින් අයකළ යුතු වුවද කියුබ් එකකට රු.300 ක් අයකිරීම හේතුවෙන් රු.1,065,750 ක් අඩුවෙන් ආදායම රැස්කර තිබුණි. එසේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය විසින් කියුබ් 20934 ක් සඳහා රාජ්‍ය භාගය අයකරගෙන තිබුණද අධිකාරිය විසින් කියුබ් 1943 ක් පමණක් කැණීම්කර ඇති බව සලකා ගාස්තු අයකිරීම නිසා රු.20,206,750 ක් අඩුවෙන් ආදායම රැස්කර ගෙන තිබුණි.

(ආ) මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාශයේ නිවාස කදවුරේ නිවාසවල විදුලි බිල්පත් හිඟව පැවතීම නිසා විදුලිය සම්බන්ධතාවය විසන්ධි කර තිබුණු අතර, හිඟ විදුලි බිල්පත් ගෙවිය යුතු නිවාස හිමියන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ නිරාවිය ගොවිපලට අයත් අක්කර 26 ක් පමණ ඉඩම් 1989 වර්ෂයේදී අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් අංක එල්/4/තබු/6/102 දරන බදු ගිවිසුමෙන් තිස් අවුරුදු කාලයකට මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම වෙත බදුදී තිබුණි. බාහිර පාර්ශවය විසින් සිදුකර තිබුණු මෙම බදුදීම නිවැරදි කර අධිකාරිය වෙත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැලිකන්ද කලාපයේ සිංහපුර හා අසේලපුර කොට්ඨාශවලට අයත් අක්කර 589.8 ක ඉඩම් කැබලි 12 ක් සුදු හඳුන් වගාව සහ පොල් වගාව සඳහා තිස් අවුරුදු පදනමට බදුකර මඟින් පුද්ගලයන් 12 දෙනෙක් වෙත ලබා දීමට 2013 ජුනි 25 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නිතර වන අලි ගැවසෙන කාසන් වැව සහ මාදුරු ඔය වම් ඉවුර ඇලට යාබදව කැලෑ සහිත ප්‍රදේශයක මෙම ඉඩම් පිහිටා තිබුණු බව 2018 අගෝස්තු 9 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර පරිසර අධිකාරියේ හා වන ජීවි දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා නියමයන්ට අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කලාපයේ භෞතික සැලසුම්කරු, පරිසර නිලධාරී හා ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් එක්ව 2015 වර්ෂයේ දී කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව ඉඩම් අංක 2137 යටතේ හෙක්ටයාර 10 ක භූමියේ සඳුන් වගා කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණද 2018 වර්ෂය දක්වාම එහි වගා කිරීම් සිදුකර නොතිබුණි. විගණන භෞතික පරීක්ෂාවේදී තවත් හෙක්ටයාර් 40 ක කිසිදු වගාවක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iii) බදුකරුවන් විසින් වගාවන් සඳහා අධිකාරියට අයත් කාසන් වැවේ සහ මාදුරු ඔය වම් ඉවුර ඇලේ ජලය භාවිතා කළද 2014 ජූලි 17 දිනැති MASL/DDG(Dev)/15 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු අයකිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) බදු ඔප්පු 12 ක් වාණිජ බැංකුවක් වෙත උකස්කර රු.780,000,000 ක ණය ලබාගෙන තිබුණු අතර දීර්ඝකාලීන බදුකරයේ කොන්දේසි අනුව උකස්කල දින සිට දින 21 ක් ඇතුළත උකස පිළිබඳව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී නොතිබුණි.

(ඉ) මහවැලි බී සහ එල් කලාප සඳහා ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් සැපයීම, ඉදිකිරීම, සවිකිරීම, ඊට අනුෂාංගික පහසුකම් සැපයීම, වසර දහයක කාලයක් නඩත්තු කිරීම සහ නියමිත ප්‍රමිතියෙන් යුතු ජල සැපයුම සහතික කිරීම අරමුණු කරගෙන රු.මිලියන 80 ක් වටිනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව 2015 සැප්තැම්බර් 11 දින ගිවිසුම් ගතවී තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණය කරුණු ලැබේ.

(i) මේ සඳහා 2015 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු බැවින් රු.මිලියන 80 ක ප්‍රතිපාදන කලාප දෙකක ව්‍යාපෘති දෙකකින් ලබා ගෙන තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමතකර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා අතිරේක 33 ප්‍රකාරව රු.මිලියන 100 දක්වා විවෘත තරඟකාරී ක්‍රමය යටතේ සැපයුම්කරු තෝරාගත යුතු වුවද ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර වැනි උපකරණ සැපයීම, සවිකිරීම සහ නඩත්තුව සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමයට සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 සහ 5.4.8 ප්‍රකාරව ලබාගත යුතු අත්තිකාරම් සුරක්ෂණ සහ කාර්යයසාධන සුරක්ෂණ ලබාගෙන ද නොතිබුණි.

(ii) ගිවිසුම්ගත කාලය 2015 නොවැම්බර් 30 දිනට අවසන් වී තිබුණද එදින වන විට ගිවිසුම්ගත කාර්යය අවසන් වී නොතිබුණි. කෙසේ වුවද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකරගැනීමට හැකිවන කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(iii) වැඩ අවසන් පිරිපහදු යන්ත්‍ර / යන්ත්‍රාගාරය සහ එම උපාංග ජාතික ප්‍රජා ජලසැපයුම් දෙපාර්තමේන්තුවෙන් අධිකාරිය විසින් භාරගෙන විධිමත් ගිවිසුම් මඟින් එහි පරිපාලන කටයුතු ගොවි සංවිධාන වෙත භාර දිය යුතු වුවත් වැඩ නිමකළ යන්ත්‍රාගාර සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.

(iv) ගිවිසුම් ප්‍රකාරව මහවැලි අධිකාරිය විසින් ජල මූලාශ්‍රය ලෙස නළ ළිං ඉදිකිරීම, අවශ්‍ය අධීක්ෂණ කටයුතු හා මෙහෙයවීම, ජල පිරිපහදු යන්ත්‍රාගාරය වෙනුවෙන් ගොවි සංවිධාන සඳහා දැරීමට සිදුවන විදුලි ගාස්තු, සේවක වියදම් සහ ජල අලෙවියෙන් ලැබෙන ආදායම් පිළිබඳ වාර්තා තබාගැනීම සහ අධීක්ෂණය සිදුකර නොතිබුණි.

(v) ගිවිසුම් ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් වගකීම් සහිත ජල පිරිපහදු යන්ත්‍ර සැපයීම සහ සවිකිරීම , පිරිපහදු ජලයේ තත්ත්වය මසකට වරක් සහතික කර එම පරීක්ෂණ වාර්තා මාසිකව නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයට ඉදිරිපත් කිරීම, අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු, සේවා සැපයීම සහ අමතර කොටස් සැපයීම, අමතර කොටස් සහ ජල පෙරණ වසර 10 ක කාලයක් නඩත්තු කිරීම සිදුකර නොතිබුණි.

(vi) වකුගඩු රෝගයෙන් පීඩාවට පත් මහවැලි ජනපදිකයින්ට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා රු. මිලියන 80 ක මුදලක් වියදම්කර වසර තුනකට ආසන්න කාලයක් ගත වී තිබියදී එම ආයෝජිත මුදලේ ප්‍රතිලාභ අදාල ගම්මානවල ජනපදිකයින්ට ලැබී තිබේද එහි ප්‍රගතිය කුමක්දයන්න සොයා බැලීමට පසුවිපරම් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. කෙසේ වුවද වැලිඔය කලාපයේ සවිකර තිබුණු ජල පිරිපහදු යන්ත්‍ර 12 න් 03 ක් අක්‍රීය වී තිබුණු අතර පිරිපහදු යන්ත්‍ර 09 කින් ජලය නිකුත්කර තිබුණද ජලය සුදුසු තත්ත්වයේ පවතීද යන්න මාසිකව පරීක්ෂාකර නොතිබුණි. වැලිකන්ද කලාපයේ ඉදිකර තිබුණු පිරිපහදු යන්ත්‍ර 18 න් යන්ත්‍රාගාර 14 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ඊ) මහවැලි එච්, සී හා වලව කලාපවල හා අධිකාරියේ මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ පවතින ගොඩනැගිලි හා නිවාස 247 ක් විධිමත්ව බාහිර පාර්ශව වෙත බැහැර කර නොතිබීම හේතුවෙන් අධිකාරියට උපයාගත හැකිව තිබුණු ආදායමක් අහිමි වී තිබුණි .

(උ) මහවැලි ආරක්ෂක බලකාය සතු රු.26,030,780 ක් වටිනා ගොඩනැගිල්ලක්, පුහුණු ශාලා 03 ක් හා නිල නිවාස 24 ක් 2012 දෙසැම්බර් 24 දින දින සිට තාවකාලික පදනමින් කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයට භාරදී තිබුණද බාරදුන් දින සිට ඒ සඳහා කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි.

(ඌ) ඉඩම්වලින් බදු අයකිරීමේ වගකීම අධ්‍යක්ෂ (ඉඩම්) සහ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) වෙත පවරා තිබුණද එම වගකීම එක් එක් කලාපය භාර නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත සහ කලාපයේ අදාල නිළධාරීන් වෙත විමධ්‍යගත කරමින් ඔවුන්ගේ රාජකාරී ලැයිස්තුවලට ඇතුළත් කර නොතිබුණු අතර වෙනත් ආදායම් මූලාශ්‍ර වලින් ඉපයිය හැකි ආදායම් රැස්කිරීමේ වගකීම් කිසිදු නිළධාරියෙකුගේ රාජකාරී ලැයිස්තුවලට ඇතුළත් කර නොතිබුණි. එම හේතුවෙන් සී කලාපය,එච් කලාපය, වික්ටෝරියා කලාපය, ප්‍රධාන කාර්යාලය හා වන හා පරිසර අංශය විසින් සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් රැස්කර ගැනීමේ ප්‍රගතිය සියයට 37 සිට සියයට 66 දක්වා අවම අගයක් ගෙන තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැලි කැණීම් මංකඩ පරීක්ෂාව.

(i) මහවැලි බලප්‍රදේශයට අයිති මහවැලි ගඟේ නව වැලි මංකඩවල් ආරම්භකිරීමට සුදුසු ස්ථාන නිර්දේශ කිරීමට 2015 හා 2016 වර්ෂවලදී අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව පවත්වා තිබුණු ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් නිර්දේශකර නොතිබුණු ස්ථාන 50 ක් සඳහා සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ඉල්ලීම අනුව වන ජීවී අධ්‍යක්ෂ ජනරාල් විසින් පසුව අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය මත කැණීම් බලපත්‍ර ලබාගෙන වැලි කැණීම් සිදුකර තිබුණි.

(ii) ඉඩම් හිමියා වශයෙන් අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් විධිමත් හා නිරන්තර පසුවිපරම් කර නොතිබීම හේතුවෙන් එම කලාපයේ වැලි මංකඩ 16 ක වැලි මංකඩ පවත්වා ගෙන යාමේදි පරිසර අධිකාරිය හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු කොන්දේසි උල්ලංඝනය කර තිබූ බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) මාසයකට අදාල ඉඩම් පරිහරණ ගාස්තුව පමණක් ගෙවා මාස 12 ක කාලයක් වැලි කැණීම්කර තිබුණු නමුත් 2015 අගෝස්තු 24 දිනැති අංක ඩීඑල්/1/1/ දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉතිරි මාස 11 සඳහා කැණීම් බලපත්‍ර 386 කින් කණින ලද වැලි කියුබ් 807,194 ක් සඳහා ඉඩම් පරිහරණ ගාස්තු වශයෙන් රු.509,861,400 ක් අයකර ගැනීමට සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය කටයුතු කර නොතිබුණි. පසු විපරම් කටයුතු සිදු කළේ නම් මෙය හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව තිබුණි.

(ආ) වික්ටෝරියා කොත්මලේ කලාපය විසින් 2013 වර්ෂයේදී හෙක්ටයාර 3.593 ක ඉඩම් 03 ක් හුණුගල් ඉවත් කර ගැනීම සඳහා පුද්ගලයින් තිදෙනෙකුට බදු දී තිබුණි. ඔවුන් විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉවත්කරගත් හුණුගල් කියුබ් 31,684 ක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයට රාජ්‍ය භාගය ගෙවා තිබුණි. ඒ අනුව 2015 අගෝස්තු 24 දිනැති අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කියුබ් 1 ක් සඳහා රු.300 බැගින් රු.3,937,500 ක් අධිකාරිය වෙත ගෙවිය යුතු වුවද රු.1,004,580 ක් පමණක් ගෙවා තිබුණි. එක් බදුකරුවෙකුට 2016 දෙසැම්බර් 31 දින දක්වා හිඟ මුදල වූ රු.3,937,500 ක් සඳහා එන්තරවාසියක් යවා තිබුණද ගෙවීම්කර නොතිබුණු නමුත් ඊට අවශ්‍ය ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විදුලි රැහැන් පද්ධති ඉදිකිරීම විදුලිබල මණ්ඩලය විසින් කළයුතු කාර්යයක් වුවද, මාදුරු ඔය 1 හා 2 විදුලි බලාගාරවල ධාරිතාවය වැඩිකිරීම සඳහා නව විදුලි රැහැන් පද්ධතියක් ආයෝජකයෙකු විසින් රු.150,000,000 ක පිරිවැයක් දරා ඉදිකර තිබුණි. මෙම වියදම ආයෝජකයා හා අධිකාරිය අතර රාජ්‍ය භාගය බෙදාගන්නා 65.8 : 34.2 අනුපාතයට බෙදාගත යුතු බව ඒ සඳහා පත්කළ කමිටුවකින් නිර්දේශකර තිබුණි. එසේම අධිකාරියට ආයෝජකයාගෙන් ලැබෙන රාජ්‍ය භාගය හා අධිකාරිය විසින් ආයෝජකයාට ගෙවියයුතු මුදලට හිලව්කරගැනීම සඳහා මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩය සහ ආයෝජකයා අතර ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹියයුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. අදාල පාර්ශවයන් ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹ නොතිබුණු අතර උක්ත කමිටු නිර්දේශය අනුව ආයෝජකයා දරනලද වියදමින් රු.51,300,000 ක් අධිකාරිය විසින් දැරියයුතු වුවද ඊට පටහැනිව රු.75,000,000 ක් අධිකාරියට ලැබෙන රාජ්‍ය භාගයෙන් අඩුකර ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් නිරාවිය ගොවිපලේ රු.7,347,608 ක් වටිනා සතුන් 383 ක් ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලය වෙත භාරදී තිබුණි. සතුන්ගේ වටිනාකම අයකර ගැනීම සඳහා එකඟත්වයක් දෙපාර්ශවය අතර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පශු සම්පත් තොගයේ වටිනාකම අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර අයවියයුතු මුදලක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.

(ඉ) තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් එප්පාවල පොස්පේට් නිදිය සහිත හෙක්ටයාර් 17.942 ක ඉඩම 1992 අප්‍රේල් 09 දිනැති ගිවිසුම අනුව අවුරුදු 30 ක කාලයක් සඳහා රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාව වෙත බදු දී තිබුණි. ඉඩම බදු දීම පළාත් ඉඩම් කොමසාරිස් මගින් සිදු වී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව බදු මුදල පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබීමෙන් 1992 වර්ෂයේ සිට 2017 වර්ෂය අවසානය දක්වා කිසිදු බදු මුදලක් මහවැලි අධිකාරියට අයවී නොතිබුණි. පසුව අධිකාරිය 2016 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා අවස්ථා දෙකකදී ගාස්තු අයකිරීම සඳහා ලංකා පොස්පේට් සමාගම සමඟ ගිවිසුම් ගතවී කැණීම් කරන ඇපටයිට් කියුබ් එකක් සඳහා රු.300 ක සේවා ගාස්තුවක් අයකිරීමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පමණක් 2017 වර්ෂයේ කැනීම් කළ කියුබ් 6,011 ක් සඳහා රු. 1,809,738 ක් අයකර ගෙන තිබුණි.

(ii) සමාගම විසින් කොන්ත්‍රාත්කරු වෙත සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ගෙවීම් කිරීමේදී කැනීම් කරන ඇපටයිට් බර ප්‍රමාණය පදනම් කරගෙන තිබුණු අතර, මහවැලි අධිකාරියට ගෙවීමේදී ඇපටයිට් කියුබ් ප්‍රමාණය පදනම් කරගෙන තිබීම නිසා අධිකාරියට මූල්‍ය පාඩුවක් සිදුවන බව නිරීක්ෂණය විය.

(iii) අංක LUS/SYS-H/PP/1-VOL-1-2015 දරන 2015 නොවැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව අදාල සේවා ගාස්තු අය කිරීම සඳහා ක්‍රමවේදයක් හා මිල ගණන් සකස් කරන තෙක් පමණක් ඇපටයිට් කියුබ් 01 කට රු. 300 බැගින් අයකිරීම් කර තිබුණද, උක්ත පරිදි සේවා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගෙන නොතිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

2002 වර්ෂයේ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමේ අරමුණින් රු. මිලියන 48 ක් ඌව සංවර්ධන බැංකුවේ හා රජරට සංවර්ධන බැංකුවේ ආයෝජනය කර තිබුණද එම බැංකු සමඟ ඇති කරගත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු. මිලියන 84.5 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අමුදල් දීර්ඝ කාලයක් බැංකුවල රඳවා තැබීම අනාර්ථික කටයුත්තක් වී තිබුණි. තවද චක්‍රීය අරමුදලෙන් බලාපොරොත්තු වූ කාර්යය 2018 වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සැප්තැම්බර් දින රහිත MA/Asset/Build/Gen/01 මුදල් අංශයේ වාර්තාව අනුව අධිකාරියේ කලාප 10 කට හා අංශ 02 කට අදාලව 2017 වර්ෂය වනවිට ගොඩනැගිල 1,055 ක් බාහිර පාර්ශව විසින් භාවිතා කරන අතර ගොඩනැගිලි 551 ක් හා ගොඩනැගිලි 293 ක් නිෂ්කාර්යව හා භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

(ආ) නිරාවිය ගොවිපල තුළ නවතා දමා තිබෙන ලොරි 02 ක්, ට්‍රැක්ටර් 03 ක් හා ටේලරයක්, බවුසරයක් හා යතුරුපැදියක්, නිවාස 15 ක්, ගොඩනැගිලි 03 ක්, කුකුළු කොටු 12 ක්, ඌරු කොටු 05 ක් හා එළු ගාලක් නිෂ්කාර්යව පැවති අතර එම වත්කම් අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) පොල්ගොල්ලේ පිහිටා තිබූ භූගෝලීය තොරතුරු පද්ධති ( GIS ) අංශය 2007 වර්ෂයේදී කොත්මලේ පරිසර හා වන සංරක්ෂණ අංශයට මාරු කර තිබීම නිසා අංශය සතුව පැවතුණු පරිගණක 02 ක්, ලැප්ටොප් එකක්, යූපීඑස් 02 ක්, ජීපීඑස් උපකරණ 03 ක්, ප්‍රින්ටර් 03 ක්, ඩිජිටල් කැමරාවක්, ඩිජිටල් සේප්පුවක් හා ස්කැනර්යක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) නිරාවිය ගොවිපලේ ඉදිකරනලද ජල පොම්පාගාර 02 කට ජල පොම්ප සපයා නොතිබීම හේතුවෙන් පොම්පාගාරයේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවතුණි.

## 4.7 වෙනත් ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2015 වර්ෂයේ මහවැලි ආරක්ෂක බලකායට අනුයුක්ත සහකාර ආරක්ෂක සුපරීක්ෂකවරු සහ ආරක්ෂක නියාමකවරු 44 දෙනෙකු බාහිර රාජ්‍ය ආයතනවලට නිදහස්කර තිබූ අතර නිදහස්කළ දින සිට සමාලෝචිත වර්ෂය දක්වා අධිකාරියෙන් ගෙවන ලද රු. 49,974,569 ක වැටුප් හා රු.21,571,442 ක අතිකාල හා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් වාහන 18 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දී තිබුණද එසේ ලබාදීමට දුන් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම වාහනවල පැවැත්ම භෞතික පරීක්ෂාවකින් තහවුරු කරගෙන නොතිබුණි. එසේම ජනාධිපති ලේකම් කාර්යාලයට තාවකාලිකව ලබා දී තිබුණු එක් වාහනයක් අනතුරට ලක්වී අලුත්වැඩියාවකින් තොරව 2017 අප්‍රේල් 06 දින සිට ජාවත්ත මහවැලි ආරක්ෂක බලකා අනුබණ්ඩයේ තබා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට විවිධ ව්‍යාපෘතිවලට පූර්ණ කාලීනව නිදහස්කර තිබුණු නිලධාරීන් හා සේවකයින් 09 දෙනෙකු වෙත ගෙවා තිබුණු වැටුප් රු. 17,936,683 ක් සහ රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රාජ්‍ය ආයතනවලට නිදහස්කළ නිලධාරීන් හා සේවකයින් 18 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබුණු වැටුප්, අතිකාල හා ගමන් වියදම් රු.19,106,596 ක් ප්‍රතිපූරණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 14 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 159 ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 509 ක පුරප්පාඩු පැවති අතර 195 ක කාර්ය මණ්ඩලයක් අතිරික්තව පැවතුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු සඳහා 83 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) අධිකාරියේ ජොෂ්ඨ කළමනාකාර මට්ටමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), අධ්‍යක්ෂ (ඉඩම්), අධ්‍යක්ෂ ( පිරිස් හා පාලන), අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්), අධ්‍යක්ෂ (සංවර්ධන) හා "සී" කලාපය, "බී" කලාපය, හුරුළුවැව කලාපය, රඹකැන්ඔය කලාපය හා ජී කලාපවල නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් බඳවාගැනීමේ කාර්යය පරිපාටි ප්‍රකාරව නියමිත බඳවා ගැනීම් ක්‍රියාපටිපාටි අනුගමනය කර සුදුසු නිලධාරීන් ස්ථිරව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත් පදනමින් හා ද්විතීක පදනමින් පුරප්පාඩු ඇතැම් තනතුරුවල රාජකාරි ආවරණය කිරීම නිසා නියමිත සුදුසුකම් සහිතව ස්ථිර පදනමින් අධිකාරියට බඳවාගනු ලබන නිලධාරීන්ගෙන් දීර්ඝකාලීනව ලැබෙන සේවය හා ඉහළ කාර්යසාධනය ලබාකර ගැනීමට තිබුණු අවස්ථාව ඇහිරී තිබුණි.

## 4.9 වාහන උපයෝජනය

------------------------

මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ 2008 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණු වාහන 10 ක් 2010 මාර්තු 09 සහ 2014 ජනවාරි 22 දිනැති මූලික වැඩපාලන හා ක්‍රියාකරවුම් අධ්‍යක්ෂකගේ ලිපි මඟින් අපහරණය කිරීමට හා ටෙන්ඩර් මඟින් විකිණීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) වෙත හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) වෙත දැනුම් දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එපරිදි කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

---------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

## 6. ශිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06 ක් ප්‍රමාදව 2018 සැප්තැම්බර් 28 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණද ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරියේ අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර පුරප්පාඩු වී පැවතුණු අතර එම තනතුර සඳහා සුදුසුකම්ලත් අධ්‍යක්ෂවරයකු පත්කිරීමට කටයුතු නොකර එහි රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පත්කර තිබුණි .

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් වැඩ අංශයේ හා අරලගංවිල බීජ ගොවිපලේ ගබඩාවේ මුර කුටිය හා වැසිකිලි ඉදිකිරීම සඳහා රු1,922,818 ක කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණු අතර 2017 නොවැම්බර් 07 දින වැඩ ආරම්භ කර දින 90 කින් නිම කළයුතුව පැවතුණි. කොන්ත්‍රාත් කාලය අවස්ථා 03 කදී දීර්ඝකර තිබූ අතර තෙවන කාලය දීර්ඝ කිරීම 2018 මැයි 22 සිට 2018 ජුනි 02 දක්වා විය. නමුත් විගණිත දිනය වූ 2018 අගෝස්තු 07 දින වනවිටද වැඩ අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක් හෝ අදාල ප්‍රමාද ගාස්තුව වූ රු.34,610 ක් අයකර ගෙන නොතිබුණි. එසේම ඉදිකිරීමේදී ලී සහ ඇස්බැස්ටර්ස් යොදා වහලය සැකසීම වෙනුවට කොන්ක්‍රීට් ස්ථරයක් යෙදීම හා ලී දොර ජනෙල් වෙනුවට ඇලුමිනියම් දොර ජනෙල් යෙදීමට ඇස්තමේන්තුව සංශෝධනයකර තිබුණද සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කර ගැනීමට 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු.1,884,610 කට රුහුණුකෙත සංචාරක බංගලාව වටා වැට හා ප්‍රධාන ගේට්ටුව ඉදිකිරීමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර විගණිත දිනය වූ 2018 අගෝස්තු 07 වන විට රු.549,822 ක් වැයකර සංචාරක බංගලාව වටා වැටක් ඉදිකර තිබුණද එය වන අලි විසින් හානි කර තිබීම නිසා විනාශයට පත්වී තිබුණි. මෙම ප්‍රදේශය නිතර වන අලි ගැවසෙන බැවින් වැට ඉදිකිරීමට ප්‍රථම ශක්තිමත් විදුලිවැටක් සකස්කර නොගෙන කම්බි වැට ඉදිකිරීම හේතුවෙන් දරන ලද මුදල නිෂ්කාර්ය වැයක් බව නිරීක්ෂණය විය.

(ඇ) තඹුත්තේගම කලාපයේ කොන්ත්‍රාත් කාලසීමාව ඉක්මවා තිබූ කොන්ත්‍රාත්03 ක කාර්යයන් විගණිත දිනය වූ 2018 ජූලි 18 දින වන විටද අවසන් කර නොතිබුණි. වැඩ අවසන් කර නොතිබුණු මෙම කොන්ත්රාත් සඳහා කාලය දීර්ඝකිරීම් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර නොතිබූ අතර, නියමිත දිනට කොන්ත්‍රාත් නිමකිරීමට අපොහොසත්වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගිවිසුම් ප්‍රකාරව රු.1,025,776 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විෂයයන් 6 ක සියයට 81 ක සිට සියයට 38,445 ක් දක්වා වූ පරාසයක අයවැයගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා සත්‍ය වශයෙන් වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු.27,968,000 ක් වැයකර තිබුණු අතර රු.32,497,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ක්‍රියාකාරකම් 08 ක් සඳහා කිසිදු වියදමක් සිදුකර නොතිබුණි.

## 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 හා 2016 වර්ෂවලට අදාලව අධිකාරියේ වාර්ෂික වාර්තා 2018 ඔක්තෝබර් 30 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.7 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ ලංකාවේ මුළු ජල විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ ආශ්‍ර කොට ඉදිකර ඇති ජල විදුලිබලාගාර මගින් නිපදවන අතර, පොල්ගොල්ල, වික්ටෝරියා සහ කොත්මලේ යන ජලාශවල වේලි මත වූ විදුලි පහන් සඳහාද අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන බව නිරීක්ෂණය විය. ජලාශ නඩත්තුව හා විදුලිබල මණ්ඩලය ප්‍රයෝජනයට ගන්නා ජලය වෙනුවෙන් ගාස්තු ගෙවීමක්ද සිදුනොකරන බැවින්, මෙම ප්‍රධාන වේලිවල විදුලි අවශ්‍යතාවය නොමිලේ සපයා ගැනීමට අධිකාරිය අවධානය යොමු කළයුතුව පැවතුණි.

(ආ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ ආශ්‍රිත රක්ෂිත භූමි භාග තුළ අනවසර පදිංචිකරුවන් 655 ක් සිටින බව හෙළිදරව් වූ අතර, මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා නැවත පදිංචිවන අනවසර පදිංචිකරුවන් පැමිණීම වැලැක්වීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ඇ) 1992 ජූලි 08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය හා 1992 ඔක්තෝබර් 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණවලට අනුව ඇමරිකා එක්සත් ජනපදයේ සමාගමක් වෙත චිත්‍රපට ස්ථාන සංකීර්ණයක් හා ක්‍රියාකාරී භූමිභාගයක් ඉදිකිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් සියයට 06 ක හා උපරිමය සියයට 10 කට නොවැඩි වටිනාකමකට දිගුකාලීන බදු ප්‍රතිශතයකට යටත්ව වසර 50 ක කාලසීමාවකට අධිකාරියේ දිගන පිහිටි ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණය ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. 1993 මැයි 21 දින සමාගම සමඟ එළඹි අවබෝධතා ගිවිසුමට ගොඩනැගිලි සංකීර්ණය සහ භූමිය රු.මිලියන 20 කට තක්සේරුකර තිබුණද බදු ගිවිසුම්වලට ඇතුළත් වී නොතිබුණි. ඒ අනුව විගණනයේ ගණනය කිරීම්වලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයවියයුතු කුලිය රු. 28,800,000 ක් හා ගිවිසුම් ප්‍රකාරව ලබාදී ඇති නිවාස 11 වෙනුවෙන් අයවියයුතු බදුකුලිය රු.4,542.500 ක් වී තිබුණි. වර්තමානයේ මෙම වත්කම් වල සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණද අවසන් තීරණයකට එළඹීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අවශ්‍ය පස් ලබාදීමේදී වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ නිලධාරීන් විසින් නිසි සැලැසුමකට අනුව ඉඩම් ලබා නොදීම නිසා අනුමත සීමාව ඉක්මවා පස් කපා තිබුණු අතර මිනුම් වාර්තාවන්ට අනුව පස් කැපීම සඳහා ලබා දී තිබුණු ස්ථාන දෙකෙන් කපා ඉවත් කර ඇති පස් ප්‍රමාණය කියුබ් 157,719 ක් වූ නමුත් පස් කියුබ් 5,000 ක් සඳහා පමණක් රු. 2,800,000 ක ඉඩම් පරිහරණ ගාස්තු අධිකාරිය වෙත ලැබී තිබුණි. වැඩියෙන් ඉවත්කර ගන්නා ලද පස් කියුබ් 152,719 ක් සඳහා ලැබියයුතු රු.85,522,640 ක් අයකරගෙන නොතිබුණි. මෙම මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීම නිසා මෙම මුදල් අයකරගැනීම සැකසහිතවී තිබුණි. අදාල නිලධාරීන්ට එරෙහිව ගෙන තිබුණු විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී වික්ටෝරියා කලාපයට පවරාගත් වෝටර් ෆීල්ඩ් ආයතනයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරුකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 7 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම්වල පැවැත්ම තහවුරුකර ගැනීම සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපන සිදුකර තිබුණද අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබීම, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය | බාහිර පාර්ශවයන් විසින් ගොඩනැගිලි කුලී රහිතව ප්‍රයෝජනයට ගැනීම හා කලාපවල ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීම සහ ඛණිජ සම්පත් සහිත ඉඩම් නිසි පරිදි කළමනාකරණය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඈ) | ගිණුම්කරණය | බදු ආදායම හා හිඟ බදු ආදායම රැස්කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් නොතිබුණු අතර බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක කර නොතිබීම. |
| (ඇ) | අත්තිකාරම් ලබාදීම හා පියවීම | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් පියවා නොතිබුණි |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයකින් ඉටුකර නොගෙන ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය මගින් අනුමැතිය ලබාගත හැකිවන පරිදි කිසිදු පදනමකින් තොරව කාර්යයන් වෙන්කර තිබුණි. |
| (ඊ) | විවිධ ව්‍යාපෘති පරිපාලනය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හෝ පරිසර ඇගයීම් වාර්තා ලබාගැනීම හා අනෙකුත් අදාල ආයතන වලින් අනුමැතිය ලබා නොගැනීම. |
| (උ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 14 ක් හා වෙනත් සේවක කාණ්ඩවල අතිරික්ත කාර්ය මණ්ඩලය 195 ක් පැවතීම. |
| (ඌ) | වාහන පාලනය | බාහිර පාර්ශවයන් සතු වාහන ආපසු ලබා ගැනීම හා වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා කරුණු ඉදිරිපත් කිරීම

## IV කොටස

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පණතේ 14 ( 2) ( සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද අංක අයිර්එන්/ බී/එම්ජ්එස්එල්/ 01/17/57 හා 2019.01.06 දිනැති 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ පිළිතුරු පහත සඳහන් පරිදි වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

#### 2.2.1. මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

අ) සී/ස මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම ඇවර කිරිමේ කටයුතු අවසන් අධියරේ පවතින බැවින් එම සමාගමේ තොරතුරු "ගිණුම්කරණ සටහනක්" මගින් ඉදිරිපත් කල අතර 2018 වර්ෂයේදි ඔබගේ නිරීක්ෂණ අනුව කටයුතු කිරිමට සටහන් කර ගතිමි.

ආ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අදාල හෙළිදරව් සිදු කිරිමට අදාල සමාගම් වෙත උපදෙස් ලබා දි ඇත.

#### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.

(අ) අදාල සමාගම් වෙත එහි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අදාල ගිණුම් වල ගැලපිම් කිරිමට උපදෙස් ලබා දි ඇත.

(ආ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අදාල නිවැරදි කිරිම් සිදු කිරිමට එම සමාගම් වෙත උපදෙස් ලබා දි ඇත.

(ඇ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අදාල නිවැරදි කිරිම් සිදු කිරිමට එම සමාගම් වෙත උපදෙස් ලබා දි ඇත.

### 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම. අධිකාරිය

#### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) පිළිගනිමි. කෘෂිකාර්මික තොග තක්සේරු කිරිමේදි කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ සමාජ ආර්ථික සැලසුම් අංශය මගින් 2012 වර්ෂයේ ප්‍රකාශිත පළතුරු සහ මල් වගා බෝග ව්‍යවසායක අත්පොතෙහි Source Crop Enterprise Budget of "Fruits & Floriculture Crops, Socio Economic and Planing Center Department of Agriculture at Peradeniya- August -2012" ගණනය කිරිම් පාදක කොට ගනිමින් තක්සේරු වාර්තා පිළියෙල කර ඇත. පශු සම්පත් තොග වටිනාකම තක්සේරු කිරිමේදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩපය විසින් අනුගමනය කරන ක්‍රමවේදය අනුව (චක්‍රලේඛය) කටයුතු කර ඇත.

### 2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගි කරගෙන මිලදී ගනු ලබන ස්ථාවර වත්කම් ඒවායේ ඵලදායී ජීවිත කාලය පදනම් කර ගෙන ක්‍රමානුකූලව ඒ තුලින් ජනිත වන ආදායම් හදුනාගැනිමට 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් කටයුතු කරන බව දන්වමි.

### 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද විමසුමේ සදහන් ඉඩම් කට්ටි තුනෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති බව පිලිගනිමි.

මෙම ඉඩම්, මූල්‍ය ප්‍රකාශන වල මිලදී ගන්නා ලද වටිනාකමට ( ගැණුම් මිල) පෙන්වා ඇති අතර එම ඉඩම් වල වර්තමාන වටිනාකම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. දෙමටගොඩ, බේස්ලයින් පාර, අංක 260/20 හි පිහිටි ඉඩම වර්තමාන වටිනාකම රු. 296,000,000.00 ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර එවා ඇත. එම තක්සේරු වටිනාකම 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සහ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

ඉතිරි ඉඩම් 02 එනම් ප්‍රධාන කාර්යාලය, ටි.බී ජයා මාවත, කොළඹ 10 ඉඩම සහ ටී.බී ජයා මාවත 493,493/1 ඉඩම් දෙක සඳහා තක්සේරු වටිනාකම ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද මේ දක්වා තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් අදාල තක්සේරු වාර්තා ලැබි නොමැති අතර එම වාර්තා ලැබිමෙන් පසු මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරිමට කටයුතු කරන බව දන්වමි.

දෙමටගොඩ පිහිටි ඉඩම විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රතිපත්තිමය තිරණයක් මත වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරිමට පවරා දිමටත් සමද්‍රීය පරිසර දූෂණ වැලක්විමේ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදිරිකිරිමට දීර්ඝකාලින බදු බලපත්‍රයක් යටතේ ලබා දිමටත් කටයුතු කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

ටි.බි ජයා මාවතේ පිහිටි අංක 493 හා 493/1 දරණ ඉඩමේ පිහිටි ගොඩනැගිල්ල රේඛිය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් සඳහා විශාල වශයෙන් දායකත්වය ලබාදෙන " ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන" නැමැති විදේශාධාර ව්‍යාපෘතිය ස්ථාන ගත කර ඇත.

(ආ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් අදාල නිවැරදි කිරිම් කිරිමට සටහන් කර ගන්නා ලදි.

(ඇ) මෙම අයිතමයන් ඉදිරියේ දි නිවැරදිව ගිණුම් ගත කිරිමට උපදෙස් ලබා දි ඇත.

(ඇ) එම ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා මගේ අංක MA/ASSET/2019/9 හා 2019/01/31 දිනැති ලිපිය මගින් ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තුමේනතුව වෙත දැනුම් දී ඇත. එම තක්සේරුව ලැබීමෙන් පසු ගිණුම් වල ගැලපීමට කටයුතු කරමි.

(ඉ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ පළමු අදියර අවසාන වීමත් සමඟ එම ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගන්නා ලෙස දැනුම් දී තිබුණද එම ස්ථාවර වත්කම් මිලදී ගත් දින සිට භාරදෙන දිනය තෙක් ක්ෂය වීම් ගණනය කර අදාල ගැළපීම් සිදු කර නොතිබුණි.

එහෙයින් එම ස්ථාවර වත්කම් නැවත අගය කල යුතු (Revaluation) අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත අදාල ලිපි ලේඛන සමග භාර දෙන ලදි. මේ වනවිටද අදාල අගයන් ලැබෙමින් පවතින අතර ඒ ඒ කලාපයට අදාල ප්‍රාදේශීය තක්සේරුකරුවන් විසින් තක්සේරු අගය සහිත වාර්තා ඉදිරිපත් කරන අතර මේ වන විට බෝවතැන්න හා කලාඔය ගංගාද්‍රෝණි කාර්යාලයට අයත් ස්ථාවර වත්කම්, තක්සේරු කර අදාළ වාර්තා ලැබී ගිණුම් ගත කර ඇත.

අදාල සියළු තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් ලැබෙන අනුපිලිවෙලට ඒවා කඩිනමින් ලබාගෙන එම ස්ථාවර වත්කම්වල තක්සේරු අගය, ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

(ඊ) 2018 වර්ෂයේදි භෞතිකව සත්‍යාපනය කර ගිණුම් වල ගැලපීමට කටයුතු කරමි.

(උ) මෙම ස්ථාවර වත්කම් ඉදිරියේ දි විධිමත්ව පවරාගෙන එම වටිනාකම තක්සේරු කිරීමෙන් පසු ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ඌ) 2018 වර්ෂයේදි මෙම පුස්තකාල පොත් වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

(එ) 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ බදු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි.

(ඒ) මෙම මුදල අදාල චක්‍රලේඛ උපදෙස් වැරදි ආකාරයෙන් යොදා ගැනීම තුල උද්ගතව පවතින ශේෂයක් වන අතර මෙම මුදල බලපත්‍ර ලබා දිමේදි අදාල බලපත්‍ර හිමියන්ගෙන් අයකල ගාස්තුවක් නොවන බැවින් එය භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට ගෙවිය නොහැකි බවත් එය කිසි දිනෙක අයකර ගත හැකි ශේෂයක් නොවන බැවින් ඒ සම්බන්ධව අදාල තත්වය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙතද දැනුම් දිමට කටයුතු කරමි.

(ඔ) මේ පිළිබඳව සොයා බලා නිවැරදි කිරීම් කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ඕ) 2018 මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදු කර ඇත.

### 2.3.4 පැහැදිලි නොකල වෙනස්කම්

(අ) 2018 මුල්‍ය ප්‍රකාශන මගින් නිවැරිදි කිරිමට කටයුතු කර ඇත.

(ආ) මේ පිළිබඳව පරීක්ෂාකර බලා 2018 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සමග නිවැරදි කිරිමට කටයුතු කරමි.

### 2.3.5 අවිනිශ්චිත ගිණුම්

සීමාසහිත මහවැලි කෘෂි හා පශු සම්පත් (පුද්ගලික ) සමාගමේ මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් රු. 14,117,550.00 ක අවිනිශ්චිත ගිණුම වහාම නිරවුල් කිරිමට කටයුතු කරන ලෙස එම සමාගම් වෙත ලිඛිතව දැනුම් දි ඇත.

### 2.3.6 විගණනය සඳහා සාක්ෂි නොවිම.

| | | |
|---|---|---|
| ආයෝජන<br>වත්කම් | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදි ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |
| ආදායම් - | හිග බදු ලේඛණ - | අදාල ලේඛණ පිළියෙල කර ඇත. අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කල හැක. |

## 2.4 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.

(අ) පිළිගනිමි.

ඉඩම් බදු ආදායම් අය කිරිම රජයේ ඉඩම් ආඥාපනත යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව ඉඩම් කාර්ය සංග්‍රහයට අනුව නිවාස ඉඩම් බදු , ව්‍යාපාර ඉඩම් බදු හා ආයෝජන ව්‍යාපෘති බදු වශයෙන් වර්ග කිරීම් සිදු කර බදු අය කරනු ලබයි. නමුත් කඩිනම් මහවැලි වැඩ පිළිවෙල යටතේ රජයේ තක්සේරුව නොමැතිව මුල් කාලපරිච්ඡේදවල ඉඩම් බැහැර කිරීම් සිදුකර ඇත. එහිදි දළ තක්සේරුව මත ඉතා අඩු මුදලක් වාර්ෂික බදු වශයෙන් අයකර ඇත. රජයේ තක්සේරුව ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් රජයේ තක්සේරුව ලබා ගන්නා අවස්ථාව වනවිට බදුකරුවන්ට විශාල හිඟ බදු මුදලක් ගෙවීමට සිදුවීම නිසාත් එම බදු බර අදාල බදුකරුවන්ට දැරීමට අපහසුවීම නිසාත් මෙම තත්ත්වය උදාවී ඇත.

කෙසේ නමුත් ඒ ඒ කලාප වල ඒ ඒ කොට්ඨාශ මට්ටමින් අයවිය යුතු හිග බදු මුදල් අය කර ගැනිම සඳහා කොට්ඨාශ කළමණාකරුවන් වෙත හිග බදු අය කර ගැනිමේ ඉලක්ක හා දින වකවානු ලබා දි එම හිග බදු අය කිරිම් වල ප්‍රගතිය මාසිකව කොට්ඨාශ කළමණාකරුවන් සඳහා ප්‍රගති සමාලෝචන රුස්විම් පවත්වා විමසා බැලිම් සිදු කරයි. ඊට අමතරව නේවාසික ව්‍යාපාර කළමණාකාරුවන් , නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරුවන් වෙතද සමස්ථ කලාපිය හිග බදු ආදායම් ඉලක්ක ලබා දි එම අය කිරිම් වල ප්‍රගතියද කාලිනව විමසිමට ලක් කරන බව

දන්වමි. තවද මෙම හිග බදු ආදායම් අයකර ගැනිම සම්බන්ධව සොයා බලා කඩිනම් ක්‍රියාමාර්ග ගැනිමට අභ්‍යන්තර කමිටුවක්ද පත් කර ඒ ඔස්සේ ප්‍රගතිය විමසා බැලිම සිදු කරන බව දන්වමි.

(ආ) වැඩ පූර්වක අත්තිකාරම් අතුරින් වර්ෂ 05ක් ඉක්මවා තිබූ රු.34,66,000.00 ක වටිනාකමින් රු.22,31,000.00ක් බි කලාපයේ වර්ෂ 05 ඉක්මවා වූ වැඩ පූර්වක අතිකාරම් ශේෂය වේ.මෙම මුදල අයකර ගැනිමට නිතිමය ක්‍රියාමාර්ත ගෙන ඇති බව නේවාසික ව්‍යාපාර කළමණාකාර, බි කලාපය විසින් දැනුම් දි ඇත. තවද මෙම වැඩ පූර්වක අත්තිකාරම් එවකට බි කලාපයේ සෞදි සංවර්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක වි ඇති අතර පසුව එම කාර්යාලය වැසි යාම හේතුවෙන් මෙම අවසාන ශේෂය පමණක් බි කලාපයේ මුල්‍ය ප්‍රකාශන වලට සම්බන්ධ වි ඇත.
ඉතිරි වැඩ පූර්වක අත්තිකාරම් ශේෂය පිළිබදව සොය බලා කටයුතු කිරිමට සටහන් කර ගතිමි.

(ඇ) ජාවත්ත පරිශ්‍රයේ ගොඩනැගිලි සදහා ශ්‍රි ලංකා මහවැලි අධිකාරිය විසින් දරණ ලද වියදම් ප්‍රතිපූර්ණය කරන ලෙස අවස්ථා කිහිපයකදිම මගේ අංක MASL/FIN/EDB/16/01 හා 2018-03-21,2018-05-22 දිනැති ලිපි මගින් දැනුම් දි ඇත.
මෙම ආයතන අතුරින් පහත සදහන් ආයතන ශ්‍රි ලංකා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යෘපෘති වල ශක්‍යතා අධ්‍යන වාර්තා සකස් කිරිම හා අනෙකුත් කටයුතු සදහා පිහිටුවා තිබූ ආයතන වේ. එම ආයතන දැනටමත් එම කටයුතු අවසන් කර වසා දමා ඇත.

**1. ප්‍රොයරි උපදේශක සේවා කාර්යාලය**

**2. උතුරු මැද පළාත් ව්‍යාපෘති කාර්යාල**

**3**. වයඹ පළාත් ව්‍යාපෘති කාර්යාල

මෙම ආයතන දැනට සක්‍රියව ක්‍රියාත්මක නොමැති නිසා එම ආයතන වලින් අය විය යුතු හිග මුදල් කපා හැරිම සලකා බැලිම සදහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනිමට මේ වන විට කටයුතු කරමින් පවති.

එසේම දැනට ක්‍රියාත්මක ආයතන අතුරෙන් වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යංශය, මහවැලි උපදේශක සේවා (පුද්) කාර්යාංශ සමාගම ආදි වශයෙන් අදාල පරිදි මුදල් ප්‍රතිපූර්ණය කරන අතර අනෙකුත් පාර්ශව වෙත මෙම හිඟ මුදල් කඩිනමින් ගෙවන ලෙස දැනුම් දි තිබුණද මේ දක්වා එම ප්‍රතිපූර්ණයන් සිදු කර නොමැති බව දන්වමි.

මෙම පරිශ්‍රය පිහිටි ගොඩනැගිලි වල තක්සේරු වටිනාකම ලබා ගැනිම සදහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අතර, එම ගොඩනැගිලි වලට අදාල තක්සේරුව මේ වන විට ලැබි ඇත. ඒ අනුව අදාල ගොඩනැගිලි බදු කුලි ගෙවිම සදහා එම ආයතන වෙත ලිපි මගින් දැනුම් දි ඇත.

(ඈ) වර්ෂ 05 කට වඩා වැඩි ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 23.779,000 ක් බව පිළිගනිමි. ඒ තුල අඩංගු රුදවුම් ගාස්තු සම්බන්ධව පහත පරිදි කටයුතු කර ඇති බව දන්වමි.

**i) මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය - බී කලාපය**

රු. 6,349,689 ක් වූ රැඳවුම් මුදල් පහත පරිදි 2018 වර්ෂයෙදි නිදහස් කර ඇත.

*රු.561,092.80 මුදලක් කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය මත නිදහස් කර ඇත.

*රු.1,347,356.00 ක රැඳවුම් මුදල් දීර්ඝකාලීනව ඉල්ලුම් නොකල බැවින් ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

*රු. 438,453.00 ක රැඳවුම් මුදල්, ආදායම් ලෙස හඳුනාගැනීමට පෙර අදාල කොන්ත්‍රාත්කරුවන්ට එම රැඳවුම් මුදල් නිදහස් කර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත.

මීට අමතරව රු.3,750,596.00 ක පවතින රැඳවුම් මුදල් නිදහස් කිරීම පිලිබඳව නීතිමය ගැටළු පවතින හෙයින් ඒවා නිදහස් කිරීම සම්බන්ධව නීති උපදෙස් ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කිරීමට නියමිතව පවතී.

මීට අමතරව රඹකැන්ඔය කලාපය, බී කලාපය හා මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය සඳහා විමසුම මගින් ඉදිරිපත් කර ඇති "රැඳවුම් මුදල් " ආදායම් ලෙස හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වමි.

**<u>බී කලාපය - රු.7,544,874.00</u>**

බී කලාපයේ සැපයුම් අත්තිකාරම් වලින් රු.මි.5 ක මුදලක් 2016 වර්ෂයේ මනම්පිටිය හෙළ බොජුන්හලක් ඉදිකිරීම සඳහා පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇත. එහි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා අත්තිකාරම් පියවීමට නොහැකි වූ අතර එහි වැඩ 2018 වර්ෂය තුලද ක්‍රියාත්මක වූ බැවින් 2017 වසරේ පියවීමට නොහැකි වුවද මේ වන විට එම අත්තිකාරම් පියවා ඇත.

තවත් රු.1,802,500.00 ක මුදලක් 2016 වර්ෂයේදි හේලීස් ඇග්‍රෝ ආයතනය වෙත ලබාදී ඇති අතර ගොවි දායකත්වය යටතේ ගොවිමහතුන්ට පැරෂුට් කැට මිලදී ගැනීමට මෙම මුදල ලබා දී ඇත. 50% ගොවිදායක මුදල නියමිත කාලයට නොලැබීම නිසා අත්තිකාරම පියවීමට නොහැකිව ඇතත් එම මුදලින් 2018 දෙසැම්බර් වන විට රු.126,542.50 ක මුදලක් පමණක් ඉතිරිව ඇති අතර එම මුදලද ගොවිමහතුන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඉ) මේ සම්බන්ධව අධිකාරියේ නිලධාරින් හා මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම . ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිලධාරින් හා 2019.04.11 දින සාකච්චා පැවැත්වූ අතර එම සාකච්චා අනුව මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමි.

## 2.5 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) මූලික කටයුතු සිදු කර ඇති අතර වැට් බදු සඳහා ලියාපදිංචි වීම කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි.

(ආ) (i) ii) අදාල වාර්තා පිළියෙල කර ඇත. අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කල හැකි බවද දන්වමි.

(ඇ) 

| 2017 වර්ෂය | රාජ්‍ය ප්‍රදාන රු.මි | ව්‍යාපෘති රු.මි |
|---|---|---|
| ඇස්තමේන්තුව | 1575.410 | 1810.000 |
| අරමුදල් ලැබීම් | 1253.730 | 1422.850 |
| ප්‍රාග්ධන වියදම් | 1555.097 | 1496.442 |

2017 වර්ෂයේදි රාජ්‍ය ප්‍රදාන සඳහා රු.මිලියන 1575.41 ක් ද ව්‍යාපෘති සඳහා රු.මිලියන 1810.00 ඇස්තමේන්තු කර ඇතත් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරනු ලැබුවේ රාජ්‍ය ප්‍රදාන සඳහා රු.මිලියන 1253.730 ක් සහ ව්‍යාපෘති සඳහා රු මිලියන 1422.850 ක අරමුදලක් පමණක් බව දන්වමි.

2017 වර්ෂය ආරම්භයේ ක්‍රියාකාරි වැඩ සැලැස්මට අනුකූලව බාහිර පාර්ශවයන් සඳහා අදාල ප්‍රාග්ධන වැඩ සඳහා ගිවිසුම් වලට එළඹීම සහ එකී ගිවිසුම් ප්‍රකාරව අදාල කටයුතු ආරම්භ කර වසර අවසාන වන විට නිම කර තිබීම, රටේ පැවති අපදා තත්වයන් හේතු කොට කල් නොදැමිය හැකි ප්‍රාග්ධන වැඩ (ඇල පද්ධති ප්‍රතිසංස්කරණ වැනි) කිරිමට සිදු විමත්, ඇතැම් ප්‍රාග්ධන වැඩ සඳහා නියමිත දිනයට මුදල් නොගෙවුවහොත් දඩ මුදල් ගෙවිමට සිදු විමත් නිසා මෙම වාහන විකිණීමෙන් ලද මුදල් ඒ සඳහා යෙදවිමට සිදු වු බව දන්වමි. (ඒ අනුව 2017 වර්ෂයේ දි භාණ්ඩාගාරය වෙතින් ප්‍රදාන ලෙස රු. මි. 1,253.730 ක් පමණක් අරමුදල් ලැබිමත් ඒ වන විට ආරම්භ කර තිබු වැඩ කටයුතුද සමග රාජ්‍ය ප්‍රදාන සඳහා ප්‍රාග්ධන වියදම රු මිලියන 1,555.097 ක් විය.)

(ඈ) ව්‍යාපෘති සඳහා නිදහස් කර තිබු නිලධාරින් තිදෙනා සම්බන්ධව පහත කරුණු ඉදිරිපත් කරමි.

i) 2012 ජුනි 01දින සිට ව්‍යාපෘති සේවය සඳහා නිදහස් කර තිබු කළමනාකරණ සහකාරවරයාගේ වැටුප් , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් හා දීමනා ව්‍යාපෘතිය මගින් ගෙවීමේ පදනම මත ව්‍යාපෘතිය වෙත නිදහස් කර ඇත 2017 .මැයි 31වන දිනට වසර පහක පූර්ණකාලීනව නිදහස් කළ හැකි කාල සීමාව ඉක්මවා ඇති බැවින් එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු සිදු කරණු ලබන බව කාරුණිකව දන්වමි.

ii) ව්‍යාපෘති සේවය සඳහා නිදහස් කර තිබු පරිගණක වැඩසටහන් සම්පාදකවරිය 2010 අප්‍රේල් 21 දින සිට ව්‍යාපෘතිය වෙත අනුයුක්ත කර ඇත .ඒ අනුව දන්වා ඇති පරිදි විධිමත් පරිදි නිරවුල් කිරීමක් සිදු නොකොට බැවින් වැටුප් මෙම අධිකාරිය මගින් ගෙවීමට කටයුතු කර ඇත .මින් ඉදිරියේදී මෙවැනි ආකාරයට ස්ථාන මාරු වීම් සිදු නොකිරීමට කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

iii) ව්‍යාපෘති සේවය සඳහා නිදහස් කර තිබු ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරිය සතියට දින 02ක් මහවැලි කේද්‍රයේ රාජකාරි ඉටු කළ හැකි පරිදි 2008.08.04 දින ව්‍යාපෘතිය වෙත අනුයුක්ත කර ඇත .ඒ අනුව වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍යතාවයක් නොමැති අතර, 2016.05.02දින සිට ක.සේ.චක්‍ර අංක 2016/01හි (2.3.3b) යටතේ නිදහස් කර ඇති කාලය සඳහා වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එමගින් දැනුවත් කර ඇත .එබැවින් දන්වා ඇති පරිදි 2013 අගෝස්තු මස සිට 2016 මැයි මස දක්වා කාලය සඳහා වැටුප ප්‍රතිපූර්ණය කිරීමක් සිදු කළ යුතු නොවන බව කාරුණිකව දන්වමි.

(ඉ) මෙම අත්තිකාරම් වලින් බොහෝමයක් මේ වන විට නිරවුල් කර ඇත. ඉතිරි මුදලද හැකි ඉක්මනින් පියවා ගැනිමට අවශ්‍ය කටයුතු කර ඇත. ඉදිරියේදි දෙනු ලබන අත්තිකාරම් දින 07 ක් ඇතුලත පියවන ලෙස දැඩි අවධානයෙන් යුක්තව අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් දනුම් දි ඇත.

## 3 මුල්‍ය සමාලෝචනය

3.1 පිළිගනිමි.

3.2 පිළිගනිමි.

3.3 (අ)රාජ්‍ය භාග්‍ය ලැබීම් හා නිවාස කුලි ආදායම 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අඩු වි ඇති බව පිළිගනිමි. එහෙත් රාජ්‍ය භාගය සම්බන්ධ ආදායම විචල්‍ය ආදායමක් වන අතර, එය එම වර්ෂය තුල නිකුත් කරන ලද වැලි, කළුගල් ,හුණුගල්, පස් ආදි ඛණිජ ද්‍රව්‍ය ඉවත් කර ගැනිම් සම්බන්ධ නිතුක් කරන ලද බලපත්‍ර ප්‍රමාණය හා ඉවත් කර ගනු ලබන ඛණිජ ද්‍රව්‍ය ප්‍රමාණය මත රදා පවති.ඒ අනුව, වාර්ෂිකව රාජ්‍ය භාගය ලැබිම් සම්බන්ධයෙන් අඩුවිම්/වැඩිවිම් සිදුවිය හැක.

(ආ) පිළිගනිමි.

## 4. මෙහෙයුම් සමාලෝචනය.

4.1 කාර්යසාධනය.

4.1.1 පිළිගනිමි.

2014-2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන චක්‍රලේඛ ප්‍රකාරව අදාල ආයතනය වෙත පිටපත් ඉදිරිපත් කර ඇත. 2019-2023 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්ම, 2030 තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවෙන් නිකුත් කර තිබූ මාර්ගෝපදේශනය අනුව සකස් කර ඇත.

2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව, සකස් කරන ලද කාර්යසාධන වාර්තාව (ප්‍රගති පාලන වාර්තාව) 2018.11.02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

### 4.1.2 ක්‍රියාකාරිත්වය සහ සමාලෝචනය.

(අ) පිළිගනිමි.

(ආ) 2017 වර්ෂය තුළදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදානපත්‍ර 16,855 ලබා දීමට ඉලක්ක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී අත්කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය % |
|---|---|---|---|
| බී | 2110 | 1758 | 83 |
| සී | 5800 | 4984 | 85 |
| ඩී | 205 | 149 | 72 |
| එච් | 550 | 369 | 67 |
| එල් | 1000 | 593 | 59 |
| වික්ටෝරියා | 410 | 335 | 81 |
| හුරුළුවැව | 400 | 334 | 83 |
| මොරගහකන්ද | 750 | 650 | 86 |
| වලව | 5500 | 4943 | 89 |
| රඹකැන්ඔය | 130 | 107 | 82 |
| **එකතුව** | **16855** | **14222** | **84** |

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදාන පත්‍රයක් ලබා ගැනීම සඳහා ඉඩම් ලාභීන් විසින් අදාළ ඉඩම හොඳින් සංවර්ධනය කර තිබිය යුතු අතර එසේ සංවර්ධනය කර ඇති බව ක්ෂේත්‍ර නිළධාරීන් විසින් සනාථ කිරීමෙන් අනතුරුව ඉඩම මැන රේඛා චිත්‍රයක් සකස් කිරීම සිදු කරනු ලබයි.

යම් ඉඩමකට ප්‍රදාන පත්‍රයක් සකස් කිරීම සඳහා ඉහත අවශ්‍යතා දෙකම සපුරා තිබිය යුතු අතර මැණුම් වැඩ සටහන යටතේ බොහෝමයක් ඉඩම්වල රේඛා චිත්‍ර ලැබී තිබුණද අපේක්ෂිත ඉලක්කය ලබා කර ගැනීමට තරම් ප්‍රමාණවත් සිතියම් නොලැබීම හේතුවෙන් 2017 වර්ෂය තුළ සකස් කළ හැකි වූ ප්‍රදානපත්‍ර 14,222 ක් පමණි . එසේ වුවත් සමස්ථයක් ලෙස ගත් කළ එම ප්‍රගතිය 84% ක මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබී තිබුණි.

රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදුකර 340 ක් ලබා දීමට ඉලක්ක කර තිබූ අතර ඉන් බදුකර 266 ක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

දීර්ඝකාලීන බදුකරයක් ලබා දීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද පසු ඉඩම මැන රේඛා චිත්‍රයක් ලබා ගත යුතු අතර ඉන් අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුව ලබා ගත යුතු වේ.

බදු ඉඩමක් මැන මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් රේඛා චිත්‍රයක් ලබා ගැනීම සඳහා අවම වශයෙන් මාස දෙකක පමණ කාලයක් ගත වන අතර එසේ රේඛා චිත්‍රය ලද පසු අදාළ ඉඩම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් යොමු කරනු ලබයි. තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්ථාව ලබා ගැනීම සඳහා බෝහෝ විට මාස 06 ක පමණ කාලයක් ගත වේ.

ඒ අනුව බදුකරයක් සකස් කිරීමේ ක්‍රියාවලියේදී මෙම අධිකාරියෙන් පරිබාහිර ආයතන වල කාර්යන් සඳහා අවම වශයෙන් මාස 08 ක වත් කාළයක් ගත වන බැවින් බදුකර සකස් කිරීම සඳහා අදාළ ආයතන අතර නිරන්තර සම්බන්ධතා පවත්වා ගනිමින් දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වී ඇත.මේ හේතුවෙන් 2017 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අපහසු වී ඇති අතර එසේ වූවත් බදුකර හා නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමේ සමස්ථ ප්‍රගතිය 78% ක මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබී ඇත.

රජයේ ඉඩම් ආඥා පනත යටතේ යම් ඉඩමක් බදු පදනම මත ලබා දීම සඳහා අනුමැතිය ලද පසු දල තක්සේරුවක් මත වාර්ෂික අවසර පත්‍රයක් ලබා දීම සිදු කර ඇති අතර පසුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලබා ගෙන බදු මුදල් ගණනය කිරීම සිදු කර ඇත.

එහිදී බොහෝමයක් අවස්ථාවල තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන තක්සේරු අගයන්ට වඩා බෙහෙවින් අඩු අගයක් ලෙස දල තක්සේරුව ගණනය කර තිබීම හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලද පසු ඒ අනුව බදු ගෙවන ලෙස බදුකරුවන් වෙත දැනුම් දුන් පසු බදු මුදල ඉහල අගයක් ගන්නා බව පවසමින් බොහෝ අවස්ථාවලදී බදු ගෙවීම පැහැර හැරීමට ක්‍රියා කරනු ලබයි.

එයට පිළියමක් ලෙස 2016 වර්ෂයේ සිට දල තක්සේරුව මත වාර්ෂික අවසරපත්‍ර ලබා දීම අත්හිටුවීමට ක්‍රියා කළ අතර තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත දීර්ඝකාළීන බදුකර ලබා දීම සිදු කරනු ලබයි.

මීට අමතරව බදු ආදායම රැස් කිරීම සඳහා බදු සති පැවැත්වීම ආදී විවිධ වැඩසටහන් කලාප මට්ටමින් පවත්වා බදු ආදායම රැස් කර ගැනීම සඳහා උපරිම උත්සාහය දරනු ලබන අතර 2017 වර්ෂයේදී පහත පරිදි ප්‍රගතිය වාර්ථා කිරීමට හැකියාව ලැබී ඇත.

| කාරණය | ඉලක්කය (රු) | ප්‍රගතිය (රු) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| පවත්නා වර්ෂයේ බදු ආදායම | 136,797,010.00 | 119,049,600.00 | 87 |
| **හිඟ බදු ආදායම** | **79,998,110.00** | **70,034,690.00** | **88** |

ඒ අනුව 2017 වර්ෂයට අදාල බදු ආදායමෙන් 87% ප්‍රතිශතයක්ද හිග බදු ආදායමෙන් 88% ප්‍රතිශතයක්ද එක් රැස් කර ගැනිමට හැකියාව ලැබි ඇත.

(ඇ) (i).

| අනු අංක | කලාපය | ඉලක්කය | ලබාදුන් පැටවුන් ප්‍රමාණය | මූල්‍ය ඉලක්කය රු. "000" | මූල්‍ය ප්‍රගතිය රු."000" | භෞතික ප්‍රගතිය අඩුවීමට හේතු |
|---|---|---|---|---|---|---|
| 1. | බී කලාපය | 12000 | 12000 | 1500 | 1500 | - |
| 2. | සී කලාපය | 4786 | 4539 | 225 | 180.08 | ගොවිපල තුල නිෂ්පාදිත පැටවුන් නිකුත්කිරීම සිදුකර ඇත |
| 3. | ඩී කලාපය | 2800 | 2628 | 295 | 281.04 | - |
| 4. | ජී කලාපය | 3000 | 3000 | 105 | 100 | - |
| 5. | එච් කලාපය | 3000 | 771 | 240 | 205.05 | බිත්තර රක්කවනය ක්‍රියාවිරහිත වීමත් මව් පරම්පරාව සඳහා නැවත සතුන් හඳුන්වාදීමත් හේතුවෙන් පැටවුන් නිෂ්පාදනය අඩු වී ඇත. |
| 6. | හුරුළුවැව | 4000 | 1600 | - | - | |
| 7. | වලව කලාපය | 2000 | 2120 | 550 | 318 | - |
| 8. | වික්ටෝරියා | 6430 | 2354 | 150 | 95.14 | පිටතින් මිලදීගැනීම සිදුකරන හෙයින් ප්‍රමුඛතා ලේඛණය අනුව පැටවුන් ලබාගැනීමට සිදුවීම |
| | **එකතුව** | **37716** | **29012** | **3065** | **2679** | |

(ii). තෝරාගත් රක්ෂණ ආයතය සම්බන්ධීකරණයේදී ප්‍රායෝගිකව සිදු වූ ගැටළු හේතුවෙන් ගොවීන්ගේ සතුන් රක්ෂණය සඳහා පෙළඹීම අඩු වීම, මහවැලි දායකත්වය සමඟ ලබාදුන් සතුන් සඳහා රක්ෂණය අදාල ගොවීන් විසින්ම සිදු කිරීම නිසා ප්‍රතිපාදන වැය නොවීම ආදි හේතු බලපා ඇති බව අධ්‍යක්ෂ (කෘෂිකර්ම) විසින් තහවුරු කර ඇත.

(iii). විසිතුරු මසුන් අභිජනන හා එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා මුදල් වෙන් කර තිබුණද ඒ සඳහා මුදල් ගෙවීමට ප්‍රමාණවත් ලෙස අරමුදල් අදාල වර්ෂය තුලදී නොලැබීම හා එම මුදල් 2018 වර්ෂයේදි පියවීමට සිදු විම, තෝරාගත් ගොවිපල සංවර්ධන සැලැස්ම ප්‍රමාද විම, සමහර කලාප වල එක් ගොවිපලක් සඳහා පමණක් ක්‍රියාත්මක කිරිම යනාදි හේතු බලපා ඇති අතර තෝරාගත් ගොවිපල අභිජනනය සඳහා තවදුරටත් සංවර්ධනය කලයුතු බැවින් ඒ සඳහා විධිමත් සැලැස්මක් සැකසීමට මඟ පෙන්වන බව අධ්‍යක්ෂ (කෘෂිකර්ම) දැනුම් දි ඇත.

**(ඇ) ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.**

1,2,3,4 සහ 5.

පිළිගනිමි

ආයෝජන කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ලබාදුන් ඉඩම් සම්බන්ධව පරීක්ෂා කර බලා ඒ සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2016 වර්ෂයේදී මා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) ගේ සභාපතීත්වයෙන් යුත් අභ්‍යන්තර කමිටුවක් පත්කර එකී කමිටුව මගින් සංවර්ධනය නොකල ඉඩම්, හිඟ බදු සහිතව පවතින ඉඩම් යනාදිය සම්බන්ධයෙන් නිර්දේශ ලබාගෙන එකී නිර්දේශ ප්‍රකාරව නීතිමය කටයුතු කිරීමත් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉදිරි කටයුතු කිරීමටත් යෝජනා කර තිබේ.

මෙම කමිටුව මගින් සියළුම ආයෝජන ව්‍යාපෘති සමීක්ෂණයක් සිදුකිරීම එම සමීක්ෂණ වාර්තා අනුව, සංවර්ධනය නොකළ සහ බදු නොගෙවීම සම්බන්ධව ඇති ඉඩම් අවලංගු කිරීම වැනි ක්‍රියාමාර්ග සඳහා යොමුවී තිබිණි. ඊට අමතරව 2018 වර්ෂය තුල සියළුම කලාප වල කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව, නැවත අවලංගු කිරීම සඳහා ආයෝජන ව්‍යාපෘති නාම ලේඛනයක් පිළියල කරන ලදි. එසේම සංවර්ධනය නොකළ සහ හිග බදු සිහිත සියළු ආයෝජකයින් මහවැලි කේන්ද්‍රයට කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදි.

ඊට අමතරව මේ වන විට කළාප මට්ටමින් සංවර්ධනය නොකළ, අර්ධ සංවර්ධිත සහ හිඟ බදු සහිත ආයෝජකයින් මාගේ ප්‍රධානත්වයෙන් කළාප මට්ටමින් කැඳවා අදාල හිඟ බදු අයකර ගැනීම, සංවර්ධනය නොකළ ඉඩම් සංවර්ධනය කිරීම සහ ඔවුන්ට තවදුරටත් එම ඉඩම් සම්බන්ධව අවශ්‍යතාවයක් නොමැති නම් නැවත හිඟ බදු මුදල්ද සමග ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාරදීමට කටයුතු කරන ලෙස දැනුවත් කිරීම් සිදුකරගෙන යනු ලබන බව දන්වමි.

**(ඉ) ව්‍යාපාර සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන්.**

**"මහවැලි සවිය" ණය වැඩසටහන.**

අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ණය නිකුත් කිරීමට යොදා නොගත් අරමුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම් වල පොළියට සමාන පොළියක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබාදීම සඳහා ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් ලිඛිතව දැනුම් දී ඇත.

අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ගොවි නොවන පන්තියේ මහවැලි ජනපදිකයන් සහ කාන්තා ව්‍යාවසායකයින් සඳහා මෙම වැඩසටහන තුළින් ණය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඒකක කළමණාකාර,කොට්ඨාශ කළමණාකාර සහ නේවාසික ව්‍යාපාර කළමණාකාරගේ නිර්දේශය මත වේ. ඒ අනුව, වාර්තාවේ සඳහන් කර ඇති ශ්‍රී ලංකා මහවැලි අධකාරියේ සේවකයින් සඳහා ඔවුන් මහවැලි කලාප වල ජනපදිකයින් වීම හේතුවෙන් මෙම ණය මුදල් ලබා දී ඇති බව අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) විසින් දැනුම් දී ඇත.

**"මහවැලි අරුණ" ණය වැඩසටහන.**

අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ණය නිකුත් කිරීමට යොදා නොගත් අරමුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම් වල පොළියට සමාන පොළියක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබාදීම සඳහා ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් ලිඛිතව දැනුම් දී ඇත.

එක් එක් කළාප වල ව්‍යාවසායක ජනපදිකයන් සඳහා ණය නිකුත් කරන ලද ව්‍යාපෘතීන් තුළින් ප්‍රගතිය විමසීම අදාල කළාප වල ව්‍යාපර සංවර්ධන නිලධාරීන් මඟින් සිදුවේ. එසේ නමුත් පසුගිය කාල වකවානුව තුල ඇතැම් කළාප වල ව්‍යාපාර සංවර්ධන නිලධාරීන්ගේ හිඟකම හේතුවෙන් පසු විපරම් කටයුතු නිසියාකාරව සිදුවී නොමැති බව දන්වමි.

**"මහවැලි දිරිය" ණය වැඩසටහන.**

මෙම ණය වැඩසටහන සඳහා ඉලක්කගත කණ්ඩායම වනුයේ සියළුම මහවැලි කලාපවල ගොවි සංවිධානයි. ඒ අනුව එක් එක් කලාපයන්හි ගොවි සංවිධාන සපුරාලිය යුතු සුදුසුකම් අනුව තොග ණය ලබා දෙනු ලබයි. ඒ අනුව විධිමත් හා පිළිගත් නිර්ණායකයන් යටතේ සුදුසු ගොවි සංවිධාන තෝරා ගනු ලබයි.

මෙම ණය වැඩසටහන සඳහා බැංකුව විසින් තොග ණයක්, ගොවි සංවිධානය වෙත ලබා දෙන අතර ගොවි සංවිධානය විසින් උප ණය ව්‍යාපෘතීන් වෙත ලබා දේ. මෙහිදී ලබාදිය යුතු උපරිම ණය ප්‍රමාණය රු.200,000.00 ක් වන අතර ගොවි සංවිධාන විසින් ණය නිසියාකාරව ලබාදීමේ වගකීම පැහැර හැරීමක් සිදු වී ඇති බව පෙනේ.

**"ව්‍යාපාරික අත්වැල" ණය වැඩසටහන.**

මොරගහකන්ද කළු ගඟ නව සංවර්ධන ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්ව ඇති ජනයා නැවත පදිංචි කිරීමේ කටයුතු සැලසුම් කරන ලද අයුරින් නියමිත කලට සිදු කිරීමට නොහැකි විම හේතුවෙන් එම ජනපදිකයින්ට ණය නිකුත් කිරීම සඳහා ප්‍රමාදයන් සිදු වූ බව දන්වමි.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) මේ පිළිබඳ කරුණු සොයා බැලීමේදී මෙම කුඩා පරිමාණ සුළු ජල විදුලි බලාගාර පිහිටි ඉඩම්වලට අදාල ප්‍රදේශයේ, ප්‍රාදේශීය ලේකම්ගේ හිමිකමක්ද තිබෙන බැවින් අදාල ආයෝජකයින් ප්‍රාදේශීය ලේකම් වෙත ද බදු මුදලක් ගෙවන බව වාර්තා වී ඇත. කෙසේ වුවද තවදුරටත් අප ආයතනය මහවැලි ජලය භාවිතා කිරීම සඳහා අදාල ආයෝජකයින්ගෙන් ගාස්තුවක් අය කල යුතු බැවින් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු පිළියෙල කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) වෙත උපදෙස් ලබා දී ඇත. මේ වන විට අදාල පාර්ශව රැස් වී මූලික කටයුතු සිදු කරගෙන යයි.

(ආ) මෙම ඉඩම් මහවැලි අධිකාරිය වෙත පවරා දෙන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2007/1/22, 2007/03/05 හා 2007/03/13 දිනැති ලිපි මගින් ප්‍රාදේශිය ලේකම්, තිඹිරිගස්යාය - ඉඩම් කොමසාරිස් - ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත ඉල්ලීම් කර ඇත. අදාල ආයතන මට්ටමින් මේ දක්වා ප්‍රතිචාර දක්වා නොමැති අතර විදේශ කටයුතු අමාත්‍යශෙයේ ලේකම්ගේ EA/AD/MU/07/12 හා 2017-11-20 දිනැති ලිපිය අනුව අදාල ඉඩම, විදේශ අමාත්‍යාංශය ප්‍රයෝජනය සඳහා ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුව මගින් නිර්දේශ කර ඇති හෙයින් මෙම ඉඩම ශ්‍රී ලංකා මහවැලිය අධිකාරියට පවරා ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදු විය.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පරිපාලිත සමාගම් වල කර තිබූ ආයෝජනයන් සලකා බැලීමේදී එම පරිපාලිත සමාගම් අතරින් සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශය (පුද්ගලික) සමාගම හැර අනෙකුත් සියළුම පරිපාලිත සමාගම් පසුගිය කාලය තුළ අලාභ තත්වයක් වාර්තා කර තිබිණි. ඒ හේතුව, මත එම සමාගම් වලින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලාභාංශ වශයෙන් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශය (පුද්ගලික) සමාගම වෙතින් 2015/2016 වර්ෂ සඳහා ලාභාංශ වශයෙන් පිළිවෙලින් රු.120,000.00ක් ද 2016/2017 වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් රු.585,000.00 ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලැබී තිබිණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) මේ පිලිබදව විමසුම මගින් දක්වා ඇති කරුණු පිලිබදව වැඩිදුර සොයා බලා ඉදිරි කටයුතු කිරිමට සටහන් කර ගතිමි.

(ආ) මෙම නිල නිවාස මීට වසර 30 කට ප්‍රථම ඉදිකර තිබූ නිල නිවාස වන අතර, පසුගිය කාලය තුළ එම ප්‍රදේශයේ පැවති යුධමය වාතාවරණය යටතේ මෙම නිල නිවාස වල පදිංචි වී සිටි පුද්ගලයන් විසින් අදාල කාලය සදහා විදුලි බිල්පත් සදහා මුදල් නොගෙවීම තුල මෙම හිගයට හේතු වි ඇත. ඒ මත මේවන විට එම නිල නිවාස වල විදුලිය විසන්ධි කර ඇත. එහෙත් ප්‍රදේශයේ පැවති යුධමය තත්වය (මායිම් ගම්මාන) මත එම විදුලි බිල්පත් සඳහා වගකිව යුතු පාර්ශව නිශ්චිතව හදුනාගත නොහැකිව පවතී. කෙසේ නමුත් මේ තත්වය පිළිබද විදුලි බල මණ්ඩලය දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල පාර්ශව දැනුවත් කර ඇත.

(ඇ) අදාල ඉඩම මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම වෙත 1989 දීර්ඝ කාලීනව බදු දී ඇති අතර, එම තිස් අවුරුදු කාලය මේ වන විට අවසන් වී ඇත. කෙසේ නමුත් මෙම සමාගම මේ වන විට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන සමාගමක් බැවින් මෙම ක්‍රියාවලියේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික පශු සම්පත් මණ්ඩලය සහ මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම යන ආයතන වල ප්‍රධානීන් මාගේ ප්‍රධානත්වයෙන් යුත් සාකච්ඡාවක් සඳහා කැඳවන ලදි. එහිදී මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර එම සාකච්ඡා තවදුරටත් ඉදිරියටත් සිදුකර මෙම ගැටළුව ආයතනිකමය වශයෙන් විසඳා ගැනීමට කටයුතු කරන බව දන්වමි.

(ඇ) I. මෙම ඉඩම් එක් එක් පුද්ගලයන්ට අක්කර 50 කට අඩුවෙන් ඉඩම් බැහැර කර ඇති අතර එක් පුද්ගලයකුට අක්කර 50 ට වඩා වැඩි ඉඩම් බැහැර කරන්නේනම් මධ්‍යම පරිසර අධිකාරිය මගින් පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ලබයි. එකී ඉඩම්වල පොල් හා සුදු හඳුන් වගා කර ඇති අතර එකී බෝගයන් කෘෂිකාර්මික බෝග වගාවන් වන අතර පරිසර හිතකාමී බෝග වේ. මහවැලි බල ප්‍රදේශ සඳහා ගැසට් කර ඇති ඉඩම් ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ අනුමැතිය ලබා ගැනීම සිදු කරන අතර මූලික වින්‍යාස සැලැස්මට පරිබාහිරව කිසිදු ඉඩමක් බැහැර කිරීම සිදු නොවන අතර මෙම ඉඩම් වන සංරක්ෂණ කලාප ලෙස නම් කර නොමැති බවද දන්වමි.

II. එකී ඉඩම් කැබලි සංවර්ධනය කරන ලෙස BL/TX/SLO/11/16/AS/05,06.07 හා 2018.11.06 දිනැති ලිපි මගින් අදාල බදුකරුවන් දැනුවත් කර ඇත.

III. අදාල ඉඩම් සඳහා අනවශ්‍ය ජලය ලබා ගැනීම වලක්වන ලෙස සියලු කොට්ඨාශ කළමනාකරුවන් දැනුවත් කර ඇති අතර එලෙස ජලය ලබා ගන්නේ නම්, MASL/DDG/(DEV)15 චක්‍රලේඛ ප්‍රකාරව ගාස්තු අය කරන ලෙස දැනුවත් කර ඇත.

IV. අදාල බදුකර උකස් කල දින සිට දින 21 ක් ඇතුලත නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත දැනුවත් කරන ලෙස බී/ඉ/2/2/අ/23,24,25,26 හා බී/ඉ/2/2/සිං/70,71,72,73,74,75,78,79 දරණ 2016.02.26 දිනැති ලිපි මඟින් බදුකරුවන් දැනුවත් කර ඇති අතර ඉන් අනතුරුව නැවත අදාල බදුකරුවන් වෙත එකී උකස් ඔප්පුවල ලියාපදිංචි පිටපත් ලබා දෙන ලෙස දන්වා BL/TX/SLO/11/16/AS/04”05”06”07 හා BL/TX/SLO/11/16/SI/03,04,05,06,07, 08,09,10 දරණ 2018.11.06 දිනැති ලිපි 12 ක් මගින් දැනුම් දි ඇත.

(ඉ) I. සිට VI දක්වා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා ඒකාබද්ධව ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව විසින් මහවැලි බී හා එල් මහවැලි කලාපයේ සවි කිරිමට තිබූ ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 හි වැඩ කටයුතු අවසන් කොට ඒවා නිසියාකාරව ක්‍රියාත්මක තත්වයේ තිබේදැයි පරික්ෂාකර බලා 2019.02.15 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත අංක DNCWS/PD/09/02/-iii හා 2019.02.15 දිනැති ලිපිය මගින් දෙපාර්ශවය විසින් විධිමත් පරිදි භාරදිම්/භාරගැනිම් සිදු කර ඇත.

(ඊ) මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ පවතින බාහිර පාර්ශව වෙත බැහැර කර ඇති ගොඩනැගිලි සහ නිවාස එම ගොඩනැගිලි හා නිවාස බැහැර කර ඇති පුද්ගලයා, එහි දැනට පදිංචිව සිටින පුද්ගලයා, ඒ වෙනුවෙන් ගෙවන කුලී මුදල ආදී තොරතුරු සොයාගැනීමේ අදහසින් මේ සම්බන්ධව සොයා බලා වාර්තා කිරීමට එම අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සිවිල්) ගෙන් සමන්විත අභ්‍යන්තර කමිටුවක් පත්කර එම කමිටු වාර්තාව මේ වන විට ලැබී ඇති අතර, එකී නිර්දේශ ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී .අනෙකුත් කළාප වලද මේ හා සමානව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල පාර්ශ්වයන් දැනුවත් කොට ඇත.

(ඇ) මහවැලි ආරක්ෂක බලකාය සතු කොත්මලේ පිහිටි දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි මුදල් ගෙවීමකින් තොරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා 1989 08.31 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 269 අදාල කර ගත හැකි බවත්, ඒ අනුව කටයුතු කරන ලෙසත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/EE198/9/1 හා 2018.02.05 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව එකී චක්‍රලේඛ ප්‍රකාරව දැනට පවරා දීම් සම්බන්ධව ඉදිරි කටයුතු කරගෙන යයි.

(ඈ) අදාල රාජකාරි ලැයිස්තු පිළියල කිරීමට කටයුතු කරගෙන යයි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) වැලි කැණීම් මංකඩ පරීක්ෂාව

(i) 2015 හා 2016 වර්ෂවලදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, පරිසර අධිකාරිය, වනජීවි සංරක්ෂණ දෙපරේතුමේන්තුව යන ආයතන ඒකාබද්ධව පවත්වනු ලැබූ වැලි මංකඩ පරීක්ෂාවේදි නේවාසික ව්‍යාපාර කළමනාකාර සි කලාපයෙන් ඉදිරිපත් කල ලේඛණයේ සඳහන් අයවලුන්ගේ වැලි මංකඩ ලබා දිම ඒකාබද්ධ පරීක්ෂා අවස්ථාවේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිර්දේශ වූ අතර මංකඩ පරීක්ෂාවේදි ඇතිව තිබූ තාවකාලින හේතුන් මත, වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කල නිලධාරියගේ නිර්දේශ නොලැබිම මත පමණක් නිර්දේශ නොකල මංකඩයන්ය. එහිදි එම මංකඩ ලබා දිම සඳහා සැම තොටුපල හිමියෙකුටම නිවැරදි කර ගත යුතු කොන්දේසි එම අවස්ථාවේදි ලබාදුන් අතර, එම කොන්දේසි ඒකාබද්ධ කේෂේත්‍ර පරික්ෂණ වාර්තාවේ සඳහන් කර ඇති බව නේවාසික ව්‍යාපාර කළමනාකාර (සි කලාපය) විසින් දැනුම් දි ඇත.

ඒ අනුව ඒකාබද්ධ කේෂත්‍ර පරීක්ෂණයෙන් පසු මෙම කොන්දේසි සපුරණ ලද මංකඩ හිමියන් තම වැලි මංකඩ ප්‍රතික්ෂේප විමත් , ඊට ආසන්න හෝ දෙපස එම වනජීවි ,පාරිසරික සංරක්ෂ තත්වයන් මතම පිහිටි වැලි මංකඩ අනුමත විමිත් පිළිබඳව නේවාසික ව්‍යාපෘති කළමණාකාර (සි කලාපය) වෙත පැමිණිලි කර තිබූ අතර වැලි මංකඩ හිමියන්ගේ සංගමය මගින් නේවාසික ව්‍යාපෘති කළමනාකාර වෙතින් මේ පිළිබඳව ඉල්ලිම් සිදු කර ඇත. ඒ අනුව ඒකාබද්ධ පරීක්ෂණයට සහභාගි වු මෙම මංකඩ ඉල්ලුම්කරුවන්ගේ මංකඩ පිළිබඳව වෙන් වෙන් වශයෙන් වනජීවි සංරක්ෂණ දෙපරේතුමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරි නිර්දේශ ලබා ගැනිමට උපදෙස් ලබා දෙන ලද බව නේවාසික ව්‍යාපාර කළමනාකාර ( සි කලාපය) දැනුම් දි ඇත.

ඒ අනුව වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂ (කාලප කාර්යාල රන්ටැඹේ) වෙතින් මෙම සියලු අයවලුන් වෙත වෙන් වෙන් වශයෙන් මෙම ස්ථානයන්හි වැලි මංකඩ පවත්වාගෙ යාමට ඇති හැකියාව පිළිබඳව විරෝධතාවයක් හෝ එකගතාවයක් විමසා ඇත. එම එකගතාවය විමසා සකස් කරන ලද ලිපියේ "අදාල ස්ථානය වැලි තොටුපලක් ලෙස පවත්වාගෙන යාම නිර්දේශ කර ඇත" යනුවෙන් සඳහන් කර ඇත්තේ අප අධිකාරය වැලි මංකඩ සඳහා ඉඩම් කොටස ලබා දිම නිර්දේශ කරන බවට අදහසින් හා එම ලිපියේ දෙවන

ඡේදයේ පැහැදිලිවම වැලි මංකඩ පවත්වාගෙන යාමට විරෝධතාවයක් හෝ එකගතාවයක් ලබා දෙන්නේද යන්න විමසා ඇත.

සාවද්‍ය තොරතුරු ලබා දිමක් ලෙස එම ලිපියේ පෙර සඳහන් කොටස ඔබ වාර්තාව මගින් අදහස් කර ඇති බැවින් ඉදිරියේදි මෙවැනි ලිපියක් සකස් කිරිමේදි වඩාත් සැලකිලිමත් වන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් ලබා දි ඇත. වැලි මංකඩ පවත්වාගෙන යාම සම්බන්ධව වනජිවි දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂ ( මධ්‍යම කලාපය) ගේ විරෝධතාවයන් නොමැති බවට නිර්දේශ තබා දුන් අයට පමණක් කැණිම් බලපත්‍ර ලබා දිමට අවශ්‍ය ඉදිරි කටයුතු නොකල බවට අවධාරණය කරන බව නේවාසික ව්‍යාපාර කළමනාකාර (සි කලාපය) දැනුම් දි ඇත.

සහකාර අධ්‍යක්ෂ ( මධ්‍යම කලාපය) ගේ මගින් වන ජිවි දෙපාර්තමේන්තුව නිර්දේශ ලාබා ගෙන ඇති අතර, අපගේ ඉල්ලිම අනුව ගිරාදුරුකෝට්ටේ වන සත්ව අඩවි ආරක්ෂකගේ නිරික්ෂණය එම සියලු මංකඩ සම්බන්ධව කැදවු බවත් එම යෝජිත ස්ථාන වල වන ජිවි රක්ෂිතයට හෝ ප්‍රේරක කලාපයට අයත් නොවන බවත් වැලි මංකඩ බලපත්‍ර ලබාදිමට විරෝධතාවයක් නොමැති බවත් පැහැදිලිව එම නිර්දේශයේ සඳහන් බව නේවාසික ව්‍යාපාර කළමනාකාර (සි කලාපය) විසින් දැනුම් දි ඇත.

(ii) වැලි මංකඩ බලපත්‍රලාභින් විසින් පවත්වාගෙන යනු ලබන මංකඩ බලපත්‍ර උල්ලංඝනය වන ආකාරයෙන් පවත්වාගෙන යන්නේද පිළිබදව අධික්ෂණ සිදු කිරිමේ වැඩි වගකිමක් භූ විද්‍යා පතල් කැණිම් කාර්යාංශයට අයත් වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැලි මංකඩ සඳහා ඉඩම් කොටස ලබා දිම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් සහභාගි වි සිටි. ඒ අනුව පෙර අවස්ථාවල එම ආයතන මගින් තොටුපල හිමියන් කොන්දේසි කඩ කිරිම සම්බන්ධව අප වෙත දන්වා එවා ඇති අවස්ථාවල ඉඩම් හිමියා ලෙස එම වැලි මංකඩවල නතර කිරිමට පියවර ගෙන ඇත.

ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශයේ මහවැලි ගඟ ආශ්‍රිතව ලෝක පරිසර දින වැඩසටහනට සමගාමිව 2017.06.06 දින මහවැලි ගඟේ වැලි තොටුපල ආශ්‍රිතව පටක රෝපණ උන පැල 1000 ක් රෝපණය කිරිමේ වැඩසටහනක් වැලි මංකඩ හිමියන්ගේ සංගමය, ශ්‍රී ලංකා පොලිසිය, භූ විද්‍යා පතල් කැණිම් කාර්යාංශය හා මධ්‍යම පරිසර අධිකාරය යන ආයතන වල නිලධාරින්ගේ සහ මංකඩ හිමියන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කර මහවැලි ගඟ දෙපස ඉවුරු සංරක්ෂණ කටයුතු සඳහා පියවර ගෙන ඇත.

වැලි මංකඩ හිමියන් පිළිබදව ලේඛනය භූ විද්‍යා හා පතල් කැණිම් කාර්යාංශයට හා මධ්‍යම පරිසර අධිකාරය යන ආයතන වෙත යොමු කර කැණිම් බලපත්‍ර කොන්දේසි කඩ කිරිම් හා පරිසර හෝ වන ජිවි කොන්දේසි උල්ලංඝණය කර ඇති අයගේ බලපත්‍ර අවලංගු කිරිමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සි කලාපයේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ හිගයක් පවතින අතර ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශයේ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින් කිහිපදෙනෙකුගේ බල ප්‍රදේශයේ පිහිටා ඇති 500 කට ආසන්න වැලි මංකඩ ප්‍රමාණයක් නිරන්තර පසු විපරම් කටයුතු

සිදු කිරිමට ඔවුන්ට ප්‍රයෝගික අපහසු කාර්යයකි. එම නිලධාරින්ට ඉඩම් අංශයට අදාල කටයුතු වලට අමතරව අප අධිකාරියේ තාක්ෂණ සේවා අංශය, කෘෂිකාර්මික අංශය, මානව හා ආයතන සංවර්ධන අංශය ආදි සියලුම අංශයන්හි රාජකාරි කටයුතු පැවරි ඇත. එසේ වුවත් වැලිමංකඩ පිළිබඳව පසු විපරම් කටයුතු නිරන්තරව සිදු කරන ලෙස අදාල නිළධාරින්ට මේ වන වට උපදෙස් ලබා දි ඇත.

(iii). **මහවැලි බල ප්‍රදේශවල ඉඩම් වලින් ඉවත් කරනු ලබන ඛණිජ ද්‍රව්‍ය සඳහා ගාස්තු අය කිරිම පිළිබඳව** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍ර ලේඛ අංක DL/1/1 හා 2015-08-24 දිනැති චක්‍රලේඛය අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කිරිමේදි කියුබ් 210 ක වාර්ෂක බලපත්‍ර ලාභියෙකු විසින් වර්ෂයකට කියුබ් 2250 ක් සඳහා ගෙවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තුව රු.1,512,000.00 ක් වේ.

වැලි මංකඩ ලාභින් ස්වල්ප පිරිසක් හැරුණු විට අනෙක් අනෙක් බහුතර පිරිස ධනවත් ව්‍යාපාරිකයන් නොවන අතර ස්වයං රැකියා මාර්ගයක් ලෙස වැලි මංකඩ පවත්වාගෙන යන්නන් වේ. ඒ අතර අඩු ආදායම්ලාභි සමෘද්ධි ලාභින් පහත සඳහන් අපහසුතාවයන්ට මුහුණ පැමට සිදු වු බව නේවාසික ව්‍යාපෘති කළමනාකාර ( සි කලාපය) වෙත නිරීක්ෂනය වි ඇත.

- ඒකාබද්ධ පරීක්ෂණයකට සහභාගි වි , වන ජිවි දෙපරේතමේන්තුව , මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල නිර්දේශ හා සියලු රාජකාරිමය ලිපි ලේඛණ සකස් කර අවසන් වු පසු ශ්‍රී ලංකා මහවැලි අධිකාරය මගින් අවසන් නිර්දේශ බලපත්‍ර ලබා දිම සඳහා භු විද්‍යා හා පතල් කාර්යාංශයට යොමු කිරිමට යාමේදි අනපේක්ෂිත ලෙස රු.1,512,000.00 ක් වැනි විශාල මුදලක් ගෙවිමට සිදු විමෙන් අපහසුතාවයට පත්විම.

- වැලි මංකඩ ඉල්ලුම් කරන අවස්ථාවේ සිට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් අවසන් නිර්දේශය නිකුත් කරන කාලය දක්වා ඉල්ලුම්කරුවන් තම මුදල් ඒ සඳහා වියදම් කර තිබිමත් ලබා ගැනිමට අපේක්ෂිත වැලි මංකඩින් කිසිදු ආදායමක් ඉපයිමට පෙර විශාල මුදලක් ගෙවිමට සිදුවිමෙන් මුදල් සොයා ගැනිමට ඇති අපහසුව.

- භූ විද්‍යා හා පතල් කැණිම් කාර්යාංශය මගින්ද රාජ්‍ය භාගය ලෙස මෙවැනි විශාල මුදලක් මංකඩ හිමිකරුවන්ගෙන් අය කිරිම.

ඒ අනුව ඒකාබද්ධ පරීක්ෂණ අවසන් වි සියලු රාජකාරි කටයුතු නිම වි බලපත්‍ර නිකුත් කිරිමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරය මගින් අවසන් නිර්දේශ යොමු කිරිමට මාස තුන හතරක් පමණ කාලයක් ප්‍රමාද වු අතර එහිදි මංකඩ ඉල්ලුම්කරුවන්ගේ ඇති නොසන්සුන් තත්වය හා ඉල්ලිම මත ඒකාබද්ධ පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහභාගි වු ප්‍රථම අවස්ථාවේ සිට අදාල සංශෝධන කරන තුරු තාවකාලිකව එක් මසකට පමණක් ගාස්තු අයකර අදාල නිර්දේශ ලබා දිමටත් මාසික අදාල ගාස්තු අය කර ගැනිමෙන් පසු භූ විද්‍යා හා පතල් කැණිම් කාර්යාංශයට නිර්දේශ යොමු කල පසු මාසික කැණිම් බලපත්‍රය අලුත් කරවා ගැනිමට කටයතු කරනු ඇත.

මේ අනුව 2013 වර්ෂයේ සිටම අධ්‍යක්ෂ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා පතල් කාර්යාංශය, පළාත් කාර්යාලය - බදුල්ල යන නිලධාරින් වෙත දිගින් දිගටම දැනුවත් කර ඇති බව නේවාසික ව්‍යාපාර කළමණාකාර (සි) කලාපය විසින් මා වෙත දැනුම් දී ඇත. වැලි මංකඩ ඉල්ලුම්කරුවන් නිර්දේශ යොමු කරන සැම අවස්ථාවකම මෙම ගාස්තු අය කිරිම සම්බන්ධව සදහන් කොට යොමු කරනු ලැබුවත් භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය පළාත් කාර්යාලය (බදුල්ල) මගින් ඉල්ලුම්කරුවන් වෙත වර්ෂය පුරාවටම අදාල පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

අවසන් ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු නිම විමෙන් පසු වැලි මංකඩ ඉල්ලුම්කරුවන්ගෙන් ගාස්තු අය කිරිම ඉහත ක්‍රියා පටිපාටියටම සිදු වි ඇති අතර මෙම ගැටළුවට ස්ථිරසාර විසදුමක් මේ වන විටත් නොලැබි ඇති හෙයින් 2017 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සි කලාපය මගින් කිසිදු වැලි කැණීම් බලපත්‍රයක් මුළු ඉඩම් පරිහරණ ගාස්තු මුදලම පියවන තුරු අළුත් කිරිම සදහා නිර්දේශ ලබා දිම අත්හිටුවා ඇති බව නේවාසික ව්‍යාපාර කළමණාකාර (සි) කලාපය විසින් දැනුම් දී ඇත. 2018 වර්ෂය අවසාන වෙත්ම සියලු වැලි කැණීම් බලපත්‍ර අවසන් වන අතර මේ වන විට මුළු වැලි මංකඩ බලපත්‍ර ලාභින් 443 දෙනෙක්ගෙන් සක්‍රියව පවතිනුයේ 60 ක පමණ ප්‍රමාණයක් පමණක් බවද නේවාසික ව්‍යාපාර කළමණාකාර (සි කලාපය ) විසින් දැනුම් දී ඇත.

(ආ) කැනීම් කර ඇති කියුබ් ප්‍රමාණය නිවැරදි වන අතර ,අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011-06-30 දිනැති ලිපිය මගින් කියුබ් 01ට රු 300.00 .ක සේවා ගාස්තුවක් අය කරන ලෙස දන්වා ඇත . ඒ අනුව අයවිය යුතු හිඟ සේවා ගාස්තුව රු. 9,505,200.00 ක් වේ .මේ වන විටත් එයින් රු . 2,854,580.00 ක් ගෙවා ඇති අතර , තවදුරටත් අයකරගත යුතුව ඇත්තේ රු . 6,650,620.00 ක මුදලකි .මේ වන විට නඩු පැවරීම සඳහා අවශ්‍ය ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ඇ) ඒ සම්බන්ධව පහත කරුණු ඉදිරිපත් කරමි.

(I) විදුලි රැහැන් පද්ධතිය වෙනුවෙන් ආයෝජකයා දරණ ලද වියදමින් රු. මි.75 ක් අධිකාරිය විසින් දරා ඇත්තේ 2013-10-25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තිරණ අංක 2013/247/3688 අනුකූලවය.

(II) මේ සම්බන්ධයෙන් මහවැලි අධිකාරිය ආයෝජකයා සහ විදුලි බල මණ්ඩලය අතර ත්‍රෛයි පාර්ශවික ගිවිසුම අනුව විදුලි බල මණ්ඩලය විසින් රු. මි.75 ක මුදල මහවැලි අධිකාරිය වෙත විදුලිය ඉපයීම වෙනුවෙන් ලැබිය යුතු මුදලින් ආයෝජකයා වෙත ගෙවීමට එකඟතාවය පළ කර ඇත.

(III) ජල විදුලි බලාගාරයක විදුලි උත්පාදනය ,ජල කඳේ උස සහ මුදාහරිනු ලබන ජල ධාරිතාවය මත රඳා පවතී. කමිටු වාර්තාවේ සඳහන් රු. 131,157,653.00 ක අපේක්ෂිත වාර්ෂික ආදායම මෙම වකවානුවේ පසුගිය අවුරුදුවල තත්ත්වයන් අනුව ඇස්තමේන්තු කරන ලද්දකි. එසේ වුවද අදාල

කාලය තුළ පැවති ජලය මුදා හැරීමේ අඩු වීම ඇතුළු භෞතික තත්ත්වයන් මත විදුලි උත්පාදනය කිරිම අඩු වී ආදායම රු. 62,865,408.00ක් ලෙස වෙනස් වී ඇත.

(IV) මාදුරුඔය 01 බලාගාරයේ විදුලි මීටරයේ දෝෂයක් හේතුවෙන් 2015 දෙසැම්බර් 12 සිට 2016 ජනවාරි 06 කාලය තුළ අඩුවෙන් ගණනය කර ඇති විදුලි ඒකක ප්‍රමාණය වෙනුවෙන් අය විය යුතු රු. 4, 128,992.00 ක මුදල් ගෙවන ලෙස 2016-05-20 දින විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් නැවත සිහි කැඳවීමක් කර අදාළ මුදල ලබා ගැනිමට කටයුතු කරමි.

(ඈ) දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම සතුන් තොගය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත භාර ගත් බවට මෙම ආයතනයේ සාමාන්‍යාධිකාරිගේ අංක NLDB/GM/21 හා 2019.05.31 දිනැති ලිපිය මගින් ලබා දී ඇති තහවුරුව අනුව මෙම සත්ව තොගය ඔවුන්ගේ ගබඩා ලේඛණ වලට ඇතුලත් කර ඇති බව තහවුරු වේ .ඒ අනුව මෙම සත්න්ගේ වටිනාකම ජෛව වත්කම් ලේඛණ වලින් හා ගිණුම් පොත් පත් වලින් ඉවත් කිරිම සඳහා මූලික අනුමැතිය ලබා ගැනිම අධ්‍යක්ෂ මණ්ඩලය සංදේශයක් ඉදිරිපත් කිරිමට යෝජිතව ඇත.

(ඉ) අ.ග.පි 377දරණ පිඹුරේ කැබලි අංක 68 හි හෙක් 17.942 .දරණ ඉඩම් කොටස 1992 අප්‍රේල් මස 09 වන දින අත්සන් තබන ලද ගිවිසුමකින් අවුරුදු 30 ක කාලයක් සඳහා රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාව බදු දී ඇති අතර මෙම ඉඩමේ පොස්පේට් නිෂ්පාදානාගාරයක් පවත්වාගෙන යනු ලබයි .එමෙන්ම අ.ග.පි 377 .කැ.අ 67 හි පෙන්නුම් කරන හෙක් 09.ක බිම් කොටස පොස්පේට් සමාගම විසින් ඇපටයිට් කැණීම් සිදු කරනු ලබයි.

උක්ත ඉඩම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරාගෙන ඇති නමුත් 2015වර්ෂය දක්වා විධිමත්ව ක්‍රියාත්මක කර නොමැති බව දන්වමි.

උක්ත අ.ග.පි 377 .කැ.අ 68 .දරණ පොස්පේට් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යන ඉඩම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් 1992.04.09දින 88/14/410දරණ දීර්ඝකාලීන බදුකරය ලබා දී බදු අයකරගෙන ඇති අතර මේ පිළිබඳව මහවැලි අධිකාරිය විසින් දැනගැනීමෙන් පසු නේවාසික ව්‍යාපාර කළමණාකාර විසින් මෙම ඉඩම මහවැලි අධිකාරියට පවරාගෙන ඇති බැවින් බදු අය කිරීම තමන්ට ලබා දෙන පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් ඉල්ලා ඇත .එයට පිළිතුරු වශයෙන් අතිගරු ජනාධිපතිතුමා අත්සන් කර ඇති දීර්ඝකාලීන බදුකරයක් ඇති බැවින් එය අභිබවා යා හැකි ගිවිසුමක් ඉදිරිපත් කරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් විසින් දන්වා ඇත . කෙසේ නමුත් මේ වන විට පහත ක්‍රියාමාර්ග සඳහා අවතිරණය වි ඇත.

I. උක්ත ඉඩම් සඳහා බදු අය කර ගැනීමට අදාල නිතිමය උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරමි.

II. ඉඩම් පරිහරණ ගාස්තු ලෙස 2016 හා 2017 වර්ෂ සඳහා පිළිවෙළින් රු. 1,803,300.00 ක් හා රු. 1,809,738.00 ක් ගෙවා ඇත.

III. මේ සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් සකස් කර දෙපාර්ශවය අත්සන් කිරිමට යෝජිතව පවති.

IV. 2018-09-11 දින සිට කැණීම් බලපත්‍රය අලුත් කර ඇත.

V. මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරාවිද්‍යා දෙපරේතුමේන්තුව වෙතින් අදාල අනුමැතිය ලබා ගෙන ඇත.

VI. අදාල ඉඩම විධිමත් පරිදි ලබා දීම සඳහා මේ වන විට ඉඩම් මැනුම් කර ඇත. අදාල සිතියම් ලැබීමෙන් පසු තක්සේරු වාර්තා ලබාගෙන විධිමත් දීර්ඝකාලීන බදුකරයක් ලබා දිය හැකි බව ද දන්වමි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

2002 වර්ෂයේදි ඌව සංවර්ධන බැංකුව සහ රජරට සංවර්ධන බැංකුව වෙත ලබාදි ඇති රු.මිලියන 44.00 ක මුදලෙහි වර්තමාන ශේෂය වන රු.මිලියන 88.00 ක මුදල නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා ගැනිමට 2019.01.31 දින පැවති 304 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්විමේදි අනුමැතිය ලැබි ඇත. එම මුදල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස් කරන ලෙස මාගේ අංක MASL/ENT.DEV/71 හා 2019.03.29 දිනැති ලිපිය මගින් සාමාන්‍යාධිකාරි ප්‍රාදේශිය සංවර්ධන බැංකුව වෙත දැනුම් දි ඒ සම්බන්ධ සාකච්චා මේ වන විට දෙපාර්ශවය අතර සිදු කරමින් පවති.

## 4.6 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කලාප / අංශ කාර්යාලවල භාවිතා කරන ලද ගොඩනැගිලි 551 ක් භාවිතා නොකර පැවති බව පිලිගනිමි. ඊට මූලිකම හේතුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල යටතේ 1998 වර්ෂයේ සේවකයන් 8000 ක් පමණ වන්දි ලබා ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත් වීමයි.

මෙලෙස නිල නිවාස හා ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් නිෂ්කාර්යව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන ලෙස 2017.07.03 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පැවති රැස්වීමකදී විෂයභාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් උපදෙස් දෙන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු කලාප / අංශ / ව්‍යාපෘති කාර්යාලවල පවතින භාවිතා කළ හැකි එහෙත් භාවිතා නොකරන නිල නිවාස හා ගොඩනැගිලි, මධ්‍යම රජය හෝ පළාත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සඳහා ලබාදීම අරමුණු කර ගෙන “භාවිතා කළ හැකි එහෙත් භාවිතා නොකරන නිල නිවාස හා ගොඩනැගිලි රාජ්‍ය ආයතන වෙත මුදාහැරීම” යන මැයෙන් වැඩසටහනක් ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට අදාලව මාගේ උපදෙස් පරිදි 2017.09.27 දින සියලු කලාප / අංශ සහ ව්‍යාපෘති කාර්යාලවලින් භාවිතා කළ හැකි එහෙත් භාවිතා නොකරන නිල නිවාස හා ගොඩනැගිලි පිළිබඳව තොරතුරු කැඳවන ලදි.

ඒ අනුව ඉහත වැඩසටහන පිළිබඳව 2017 ජූනි මාසයේ පැවති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්මන්ත්‍රණයේදී පැමිණි සියලු දිසාපතිවරුන් (මහනුවර / කුරුණෑගල / රත්නපුර / අම්පාර / පොළොන්නරුව / අනුරාධපුරය) වාචිකව දැනුවත් කර ඇති අතර 2017.11.16 / 17 දිනවල මෙම සියලු දිසාපතිවරුන් වෙත ලිපි යොමු කර ඇත.

තවද රැස් කර ගත් තොරතුරු මත පදනම්ව ඉහත වැඩසටහන පිළිබඳව දැනුවත් කරමින් 2018.03.19 සහ 2018.05.10 දිනවල පහත සඳහන් ආයතන වෙත ලිපි යොමු කරන ලදි.

1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - සබරගමුව පළාත, රත්නපුර / නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය / උතුරුමැද පළාත, අනුරාධපුරය

2. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ - සබරගමුව පළාත, රත්නපුර / නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය / උතුරුමැද පළාත, අනුරාධපුරය

ඉහත දැනුවත් කිරීම් අනුව ආයතන කිහිපයකින් ප්‍රතිචාර ලද අතර එම ප්‍රතිචාර ප්‍රමාණවත් නොවූ බැවින් 2019.01.09 දින නැවත ඉහත සියලු දිසාපතිවරුන් සහ පළාත් සෞඛ්‍ය හා අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත සිහිකැඳවීම් කරන ලදි. එහිදී නිල නිවාස හා ගොඩනැගිලි පිළිබඳ තවදුරටත් අවශ්‍යතාවයක් පවතින්නේ නම් 2019.01.28 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වා යවන ලදි.

එම ආයතනවලින් දැනට ලැබී ඇති ප්‍රතිචාර පහත සඳහන් පරිදි වේ.

| | **භාවිතා නොවන නිල නිවාස ඉල්ලා ඇති ආයතනය** | **ඉල්ලා ඇති ගණන** |
|---|---|---|
| 1 | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල (16+2) | 18 |
| 2 | ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ සේවා කාර්යාල (2+63) | 65 |
| 3 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල | 12 |
| 4 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 1 |
| 5 | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය | 1 |
| 6 | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | 1 |
| 7 | ගොවි සංවිධාන | 1 |
| | | **99** |

දැනටමත් මෙම නිල නිවාස හා ගොඩනැගිලිවලින් ගොඩනැගිලි කිහිපයක් පහත සඳහන් ආයතනය වෙත ලබා දී ඇත.

**01.** සී කලාපයේ ගිරාදුරුකෝට්ට කොට්ඨාශයේ එක් ගොඩනැගිල්ලක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට අනුමැතිය ලබා දී ඇත.

**02.** බී කලාපය, වැලිකන්ද පිහිටි අරලගංවිල MRTC මධ්‍යස්ථානය පොලිස් අභ්‍යාස ආයතනයක් පිහිටුවීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට

2018.01.26 දින පැවති 292 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ අංක 2018/292/4352 මඟින් අනුමැතිය ප්‍රකාරව මූලික පැවරීම් කටයුතු සිදු කර ඇත.

"භාවිතා කළ හැකි එහෙත් භාවිතා නොකරන නිල නිවාස හා ගොඩනැගිලි රාජ්‍ය ආයතන වෙත පවරා දීම" යන මැයෙන් ආරම්භ කරන ලද වැඩසටහනට අදාලව රාජ්‍ය ආයතන වෙතින් ලද ඉල්ලීම ප්‍රමාණය සීමිත බැවින් ඉල්ලීම් ලද රාජ්‍ය ආයතන වෙත අදාල නිල නිවාස හා ගොඩනැගිලි පවරා දීමටත් ඉන්පසුද ඉතිරි වන නිල නිවාස හා ගොඩනැගිලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ආදායම් ඉපැයීමේ අරමුණින් පෞද්ගලික අංශය වෙත කුලී පදනම මත ලබාදීමටත් අනුමැතිය ඉල්ලා 2019.03.11 දින පැවති 305 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි. එහි තීරණය වූයේ (තීරණ අංක 2019/305/4575) තවදුරටත් පහත සඳහන් ආයතන මේ සම්බන්ධව දැනුවත් කරන ලෙසයි. ඒ අනුව 2019.03.19 සහ 2019.03.25 යන දෙදින පහත ආයතන වෙත ලිපි යවන ලදි.

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
2. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
5. කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

විෂයභාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019.05.27 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයේදි පැවති මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදි ඉහතින් සඳහන් භාවිතා කල හැකි එහෙත් භාවිතා නොකරන ගොඩනැගිලි කඩිනමින් කඩා ඉවත් කරන ලෙසට උපදෙස් ලබා දි ඇත. ඒ අනුව එකි කරුණුද සමග 2019.06.16 දින පැවති අධිකාරියේ 308 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රුස්විම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඉහතින් සඳහන් ගොඩනැගිලි සඳහා ඉල්ලුම් කරන ලෙස රාජ්‍ය ආයතන වෙත දැනට දැනුම් දි ඇති බැවින් ඉදිරි මාස 3 ක කාලයක් ඒ සඳහා ඉල්ලිම් ඉදිරිපත් කිරිමට තවදුරටත් අවස්ථාව ලබා දි එවිටද ඉල්ලුම් නොකරන නිල නිවාස සහ ගොඩනැගිලි විධිමත් අපහරණ හා ගබඩා පිළිවෙත් අනුගමනය කර කඩා ඉවත් කරන ලෙසට තිරණය කර ඇත. ඒ අනුව එහි ප්‍රගතිය මත ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.

මහවැලි අධිකාරිය විසින් භාවිතා කරන ලද එම ගොඩනැගිලි 293 ක් මේ වන විට භාවිතා කල නොහැකි මට්ටමක පැවතීම නිසා සහ අලුත්වැඩියා කිරීම සඳහා අධික වියදමක් වැය වන බැවින් පහත සඳහන් කලාප /අංශ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන විනාශ කරන ලදි. එම ගොඩනැගිලිවලින් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හැකි ගොඩනැගිලි කිහිපයක් බාහිර ආයතනවලට හා බාහිර පුද්ගලයන්ට ලබා දී ඇත.

විමසුම මගින් දක්වා ඇති කලාපවලින් කුලි පදනම මත ලබා දී ඇති නිවාස හා ගොඩනැගිලි සඳහා එම ආයතනවලින් අඩු කුලි මුදලක් අය කරන බව පිලිගනිමි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛ අනුව මෙම කුලි මුදල අය කරනු ලබයි. නිවාස /ගොඩනැගිලි ප්‍රධාන තක්සේරුකරු වෙතින් තක්සේරු කර ගැනිම සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත. එම තක්සේරු වාර්තාව ලද වහාම අදාල පරිදි එම නිල නිවාස /ගොඩනැගිලි වල කුලි මුදල් සංශෝධනය කරන බව දන්වමි.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු භාවිතයෙන් ඉවත් කිරිමට යෝජිත වාහන පිලිබඳ තොරතුරු 2018 වර්ෂයට අදාළව සහකාර අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් සකස් කරමින් පවතින අතර නිරාවිය ගොවිපලට අයත් විමසුමේ සඳහන් වාහන ද ඊට ඇතුලත්ව ඇත. ඒ අනුව ඉදිරියේදී සිදු කරන අපහරණ ක්‍රියාවලිය මගින් එම වාහන අපහරණය කිරිමට කටයුතු සූදානම් කර ඇත. කුකුළු කොටු සඳහා විදුලිය සැපයීමට කටයුතු කරමින් පවතී. ඉන් අනතුරුව ප්‍රයෝජනයට ගෙන සත්ත්ව නිෂ්පාදන යළි ඇරඹීමට කටයුතු යොදා ඇත.

ඌරන්, එළුවන්, කුකුළු කොටුවල සිටි සතුන් ඉවත් කිරිම නිසා මෙම තත්ත්වය පැන නැගී ඇත. යළි (NLDB) පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ලබා ගත් සතුන්ගේ වටිනාකමට උසස් වර්ගයේ සතුන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර,එසේ ලබා ගත් පසු උක්ත ගොඩනැගිලි පරිශ්‍රය යළි භාවිතයට ගැනෙන බව කාරුණිකව සඳහන් කරමි.

(ඇ) මෙම භාණ්ඩ අතුරින් දැනට භාවිතයට ගත හැකි භාණ්ඩ හඳුනා ගෙන ඒවා ඵලදායී ලෙස අදාළ අංශ / කලාප වෙත නිකුත් කිරිමට ත් එසේ නොවන භාණ්ඩ විධිමත් අපහරණ ක්‍රමවේදය භාවිතා කර අපහරණය කිරිමටත් අවශ්‍ය උපදෙස් ලබා දී එය දැනට ක්‍රියාත්මකව පවතී.

(ඈ) නිරාවිය ගොවිපලේ ඉදිකරන ලද ජල පොම්පාගාර 02ට ජල පොම්ප සපයා නොතිබීම හේතුවෙන් නිෂ්ක්‍රියව පවතී .මේ වන විට පොම්පාගාර වෙත විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය විදුලි රැහැන් ඇදීමේ කටයුතු විදුලිබල මණ්ඩලය මගින් සිදු කර ඇත .වෙළඳපල මගින් විදුලි ජල පොම්ප ,PVC ජල නළ හා උපාංග වෙනුවෙන් දළ වශයෙන් රු .මි 10 .ක පමණ මුදලක් අවශ්‍ය වන අතර 2018 වර්ෂය තුළ ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති විම නිසා ජල පොම්ප සවි කිරීමට නොහැකි වි ඇත .

## 4.7 වෙනත් ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

(අ) එක් එක් නිලධාරියා නිදහස් කල දින සිට වැටුප් ,අතිකාල, සංයුක්ත දිමනා හා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාල අයතන වෙත දන්වා ඇත. අදාල ආයතන වෙත නිරන්තරයෙන් එම මුදල් ප්‍රතිපුරණය කරන ලෙස දැනුම් දීම් සිදු කර ඇත. ආරක්ෂක අමාත්‍යශය වෙන නිදහස් කර ඇති සේවකයන් 07 දෙනාගේ 2016 වර්ෂයේ අතිකාල හා සංයුක්ත දිමනා වෙනුවෙන් වු මුදල් මේ වන විට ප්‍රතිපූර්ණය කර ඇත.

එක් එක් නිලධාරියා නිදහස් කල දින සිට වැටුප් ,අතිකාල සංයුක්ත දිමනා හා ගමන් වියදම් වෙනුවෙන් වු මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාල ආයතන වෙත දැනුම් දි ඔවුන් නිදහස් කිරිමටත් ,මින් ඉදිරියේදී සිදුකරණු ලබන මෙවැනි නිදහස් කිරීම් වලදි නිවැරදිව කටයුතු කිරිමට සටහන් කරගත් බව කාරුණිකව දන්වමි.

(ආ) බාහිර ආයතන සඳහා ලබාදුන් වාහන ආපසු ලබාගෙන ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්තව ඇති අංක 65-2516 හා 65-2514 දරණ වාහන අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කෙරමින් පවතී.

(ඇ) දේශගුණික අව බලපෑම් අවම කිරිමේ ව්‍යාපෘතිය (CRIP) වෙත පූර්ණකාලීනව නිදහස් කර ඇති හූ සම්පත් ඉංජිනේරුවරු 03 හා රියදුරු 03ට අදාල 2015 මාර්තු මස සිට 2018 ජූලි මස දක්වා වැටුප් වෙන්වෙන් ගෙවා තිබූ මුදල ,ව්‍යාපෘති අධ්‍යක්ෂ (CRIP) ගේ අංක CRIP/FIN/MASL/ 2018.11.13 දිනැති ලිපිය සමග චෙක්පත් අංක 567248 හා 567261 පිළිවෙලින් 2018.11.09 හා 11.12 දිනැති චෙක්පත් මගින් ප්‍රතිපූර්ණය වී ඇති බව දන්වමි.

ඉහළ ඇළ ව්‍යාපෘතියට නිදහස් කර ඇති නිලධාරින්ගේ 2015,2016 හා 2017 වර්ෂය සඳහා වන ගෙවා තිබූ වැටුප් වෙනුවෙන් වූ මුදල ප්‍රතිපූර්ණය වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් 2019 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පියවීම් කරන බව වැඩසටහන් අධ්‍යක්ෂකගේ අංක MMDE/MWSIP/PMU/ACC/69 හා 2018.09.12 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර 2018 ජනවාරි මස සිට 2018 ජූලි මස දක්වා වැටුප් වෙනුවෙන් ගෙවූ මුදල සඳහා චෙක්පත් අංක 439994 හා 547504 මගින් මුදල් ප්‍රතිපූර්ණය කර ඇති බව දන්වමි.

රේඛිය අමාත්‍යාංශයට හා වෙනත් රාජ්‍ය ආයතන වලට නිදහස් කල නිලධාරින් හා සේවකයින් වෙනුවෙන් ගෙවා තිබූ වැටුප් ,අතිකාල හා ගමන් වියදම් වෙනුවෙන් වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස නිරන්තරවම අදාල ආයතන වෙත ලිඛිත දැනුම් දීම් සිදු කර ඇත.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2017 12.31.දින වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු පහත සඳහන් පරිදි විය.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ (පිරිස් හා පාලන)

අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය)

අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්)

අධ්‍යක්ෂ (ඉඩම්)

අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (හුරුළුවැව)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (සී කලාපය)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (බී කලාපය)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඩී කලාපය)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (මොරගහකන්ද කලාපය)

නේවාසික ව්‍යාපාර කළමනාකාර (රඹකැන්ඔය කලාපය)

ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ HM 1-1 සේවා ගණයේ අධ්‍යක්ෂ හා නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුරු සඳහා විටින් විට පුරප්පාඩු පවතින අවස්ථාවලදී අභ්‍යන්තර හා පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින් බාහිර සඳහා අයදුම්පත් කැඳවූ අතර ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරීන් විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීමක් සිදු නොවීම මත මෙම තනතුරු පුරප්පාඩුව පැවතුනි.

2013-06-12 දින දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය අනුව විටින් විට ඒ සඳහා සංශෝධන ඉදිරිපත් වීම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013.10.31 දින ලබා දෙන ලද උපදෙස් පරිදි බඳවා ගැනීමේ පරිපාටිය නැවත සංශෝධනය වීම හේතුවෙන් හා අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) තනතුර සඳහා බඳවා ගැනීමට නියමිතව තිබූ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳව ඇතිවූ සේවක ඉල්ලීම් සලකා බලා එම යෝජනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමත කර ගැනීමට කාලයක් ගතවීම හේතුවෙන් ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමට ප්‍රමාද වීම වැනි කරුණු මත මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය .මේ හේතුව මත අභ්‍යන්තර පරිපාලන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පවතින ප්‍රතිපාදන මත ද්විතීයන පදනම මත නිලධාරීන් අනුයුක්ත කර ගැනිමට හා අභ්‍යන්තර නිලධාරීන් මගින් එකී තනතුරුවල වැඩ බැලීමට හා රාජකාරී ආවරණය සඳහා අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත.

2017.12.31 දින වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මධ්‍යම කළමනාකාර මට්මට (MM 1-1) සේවා ගණයේ තත්‍ය සේවක සංඛ්‍යාව 347 ක් හා කණිෂ්ඨ කළමනාකාර මට්ටම (JM 1-1) තත්‍ය සේවක සංඛ්‍යාව 321 වශයෙන් පැවතිය .ඒ අනුව මෙම සේවා ගණයන්හි සම්පූර්ණ සේවක මණ්ඩලය 668 වන අතර එම සේවා ගණයන්හි පුරප්පාඩු 141 වේ. මධ්‍යම කළමනාකරණ මට්ටම (MM 1-1) සේවා ගණයේ නිලධාරීන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී බොහෝමයක් තනතුරු (ඉංජිනේරු ,සංඛ්‍යාලේඛනඥ ,භූවිද්‍යාඥ ,සමාජවිද්‍යාඥ ,මිනින්දෝරු , පශුවෛද්‍ය වැනි තනතුරු) වෘත්තීය මට්ටමින්, බාහිරව බඳවා ගැනීමට සිදුවන බැවින් හා ඔවුන් මෙම ආයතනයේ රඳවා තබා ගැනීමේ අපහසුතා මත (වැටුප හා දීමනා ප්‍රමාණවත් නොවීම ) පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමේ හැකියාව අඩු වී ඇත .කෙසේ නමුත් මෙම තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අභ්‍යන්තර හා බාහිර වශයෙන් බඳවා ගැනීම් සඳහා අවස්ථා කිහිපයකදීම කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.

එසේම කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණය (JM 1-1) පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී අභ්‍යන්තර හා බාහිර බඳවා ගැනීම සඳහා ප්‍රතිශතයක් ලෙස කටයුතු කිරීමට 2013.10.31 දින දරණ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය තුල ප්‍රතිපාදන දක්වා ඇත .එසේම බොහෝ තනතුරු බාහිර බඳවා ගැනීම් ලෙස දන්වා තිබීම මත (භූගෝලීය තොරතුරු පද්ධති නිලධාරීන් ,ජල තත්ව නිළධාරීන් ,පටක රෝපන ශිල්පීන් ,විශේෂ අධ්‍යන නිලධාරීන් ,නගර හා ග්‍රාම නිර්මාණ සැලසුම්කරු වැනි තනතුරු) පුවත් පත් දැන්වීම් පල කිරීම තුලින් පමණක් බඳවා ගැනීම් සිදු කල යුතු වේ .අනෙකුත් නිළධාරීන් බොහෝමයක් නව බඳවා ගැනීම් පරිපාටිය අනුමත වීමට පෙර පැවති පැරණි බඳවා ගැනීම් පරිපාටියේ සුදුසුකම් මත බඳවා ගත් නිලධාරීන් බැවින් ඔවුන්

අනුමත නව බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති උපාධිය හෝ ඊට අදාල වෘත්තීමය සුදුසුකම් සපුරා නොමැති වීම මත සේවා කාලය පදනම් කර ගනිමින් පමණක් උසස්වීම් ලබා ගැනීමට සිදුවීම මත ඔවුනට කණිෂ්ඨ කලමනාකාර මට්ටමට පැමිණීමේ හැකියාව සීමා වීම හේතුවෙන් අභ්‍යන්තර සේවකයින් හට උසස්වීම් ලබා ගැනීම ද සීමා සහිත වී ඇත .තවද කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් කළමණාකාර (MM 1-1) සේවා ගණයේ තනතුරුවලට උසස්වීම් සිදු කරනු ලබන බැවින් සෑම අවස්තාවකදීම අභ්‍යන්තර උසස්වීම් වලදී ඔවුන් සේවය කරණ තනතුරේ පුරප්පාඩුව ඇතිවීම සාමාන්‍ය තත්වයකි.

2017.12.31 දින වන විට ප්‍රථමික මට්ටමේ (MA 3 සිට PL- 1 දක්වා ) අනුමත කාර්ය මණ්ඩලය 4017වන අතර තත්‍ය සේවක මණ්ඩලය 3708ක් වේ .ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 309කි .මෙම සේවා ගණයන්හී බොහෝමයක් තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම ලෙස ජාතික වෘත්තීය නිපුණතා මට්ටම (NVQ) දක්වා තිබීම හා එම මට්ටමේ පාඨමාලා, තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කර නොතිබීම මත මෙම තනතුර සඳහා බඳවා ගැනීමේදී නොයෙකුත් ගැටළු සහගත තත්වයන්ට මුහුණ පෑමට සිදුව ඇත විශේෂයෙන් සැලසුම් ශිල්පී ,පොත් තබන්නා ,පටක රෝපණ තාක්ෂණ ශිල්පී ,ක්‍රීඩා සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමේදී ජාතික වෘත්තීය නිපුණතා මට්ටමේ පාඨමාලා නොතිබීම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නිතර නිතර යොමු කර උපදෙස් හා එකඟතා ලබා ගනිමින් කටයුතු කිරීමට සිදු වීම හේතුවෙන් උසස්වීම් ලබා දීම හා බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම මත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ප්‍රමාදයන් සිදුවී ඇත .දැනට මෙම තත්වය නිරාකරණය කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාදී ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.

(ආ) “අ” යටතේ දැක්වූ හේතූන්ද බලපා ඇති අතර එකී තනතුරු වල රාජකාරී අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා හා ආයතනය තුල පවතින සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන ද්විතීය පදනමින් අනුයුක්ත කරන ලද නිලධාරීන්ගෙන් හා අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන , අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) වැනි තනතුරු අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ඉටු කර ගැනීමට කටයුතු කර ඇත .මේ වන විට නියොජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), අධ්‍යක්ෂ (ඉඩම්) ,අධ්‍යක්ෂ (පිරිස් හා පාල) , අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) වැනි තනතුරු සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවා ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) හා අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) යන තනතුරු සඳහා අභ්‍යන්තරින් අයදුම්පත් කැඳවා විධිමත් සම්මුඛ පරීක්ෂණ තුලින් සුදුසුසන් තෝරා මෙම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද පියවර ගෙන ඇත.

එසේම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුරට අදාල සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය අනුමතවී ඇති 2016.03.09දින වන විට ඒ සඳහා සුදුසුකම් ලද නිලධාරීන් අභ්‍යන්තරයේ නොසිටීන ලදී.

එහෙත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුරේ කාර්ය භාරය තුල ඉඩම් ,කෘෂිකර්ම , ව්‍යාපාර සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයන්හී සියලුම කාර්යයන් ඇතුළත් වී ඇති අතර විශේෂයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ විෂයභාර අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපති තුමා විසින් මහවැලි කලාප තුල පරිදිංචි කිරීම සිදු කර ඇති සියලුම ජන පදිකයින් සඳහා ඔවුන්ගේ ඉඩම් හිමිකම් ප්‍රධාන පත්‍ර ලබා දීම සඳහා ඉලක්ක ගත වැඩ සටහන් පැවැත්වීමත් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙමින් ජාතික

නිෂ්පාදනයට මහවැලි දායකත්වය වැඩිකිරීම සඳහා යොමු කිරීමත් ජනපදිකයන්ගේ සමාජ , ආර්ථිකමය සංවර්ධනයක් ඇති කිරීම උදෙසාත් මෙම තනතුරු සඳහා නිලධාරියෙකු පත් කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් වීමත් මත ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයේ අධ්‍යක්ෂ වරයකු ලෙස වසර ගණනාවක් ලබා ගත් අත්දැකීම් හා ක්ෂේත්‍ර පලපුරුද්ද අනුව අධ්‍යක්ෂ(ව්‍යාපාර සංවර්ධන) ලෙස කටයුතු කළ නිලධාරියා විශ්‍රාමයාමෙන් අනතුරුව එම නිලධාරි මහතා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද නමුත් දැනට එම නිලධාරී මහතා එම තනතුරින් ඉවත් වී විශේෂ ව්‍යාපෘතියක් වෙත අනුයුක්තව රාජකාරී ඉටු කරන ලබයි.

මේ හේතුව මත පුරප්පාඩු වී ඇති තනතුර සඳහා අභ්‍යන්තර නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවා ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.

නේවාසික ව්‍යාපාර කළමනාකරන තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා විටින් විට අභ්‍යන්තරින් හා බාහිරව අයදුම්පත් කැඳවන ලදි .නමුත් සුදුසුකම් ලත් නිලධාරීන් ඒ සඳහා අයදුම් කර නොතිබුණි .එසේම සමාලෝචිත වර්ෂය තුල නේවාසික ව්‍යාපාර කළමණාකාර තුන්දෙනෙකු වැඩ තහනමට ලක්වී ඇති අතර ඔවුන් සඳහා විධිමත් විනය පරීක්ෂණ පවත්වමින් සිටී .ඒ අනුව එම තනතුරු 03 සම්පූර්ණ කිරීමට නොහැකි අතර ඒ සඳහා අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වැඩ බැලීම සඳහා යොදවා ගනිමින් කලාප කාර්යාල තුළ පවතින ඉඩම් ,වාරිමාර්ග,කෘෂිකර්ම ,හා ආයතන සංවර්ධන කටයුතු වැනි අත්‍යවශ්‍ය වූ රාජකාරීන් ජනපදිකයින්ට අපහසුතාවයකින් තොරව ඉටු කරලීම සඳහා යොදවා ගෙන ඇත . එසේම සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියේ ප්‍රතිපාදන මත දීප ව්‍යාප්ත නිලධාරීන්ටද අවස්ථාව සලසා ඇති බැවින් මහවැලි බී හා සී කලාප සඳහා ද්විතීය පදනම මත නිලධාරීන් දෙදෙනකු නේවාසික ව්‍යාපාර කලමණාකාර තනතුරේ රාජකාරී ඉටු කර ගැනීම සඳහා යොදවා ගෙන ඇති බව කාරුණිකව දන්වමි.

## 4.9 වාහන උපයෝජනය

මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු ඒකකය මගින් අපහරණය සඳහා යොමු කරන ලද වාහන අතරින් 50-2641, 36-3573, 42-0889 යන වාහන 2017 වර්ෂයේදී අපහරණය කර ඇත. අනිකුත් වාහන ලියාපදිංචි හිමිකම හා ලියාපදිංචි විස්තර සමඟ නොගැලපීම හේතුවෙන් 2017 වසරේදී අපහරණය කිරීමට නොහැකි විය. එම වාහන ලියාපදංචි වී ඇත්තේ උපදේශක සේවා සපයන ලද ආයතන IAZAMATODA – SKANSKA නම් වලිනි. දැනට මෙම ආයතන ද ශ්‍රී ලංකාව තුළ නොමැති හෙයින් මුදල් අමාත්‍යාංශය තුළ සංස්ථාපනය කර ඇති කොන්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හරහා ක්‍රියාත්මක වෙමින් උක්ත වාහන අපහරණය කිරිමට කටයුතු කරන බව දන්වමි.

## 5.1 තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සියලු රාජ්‍ය ආයතන කටයුතු කළ යුතු වුව ද ඒ පිළිබඳව නිසි ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දැනුවත් කිරීමට අදාල ආයතන කටයුතු කර නොතිබුණි .එබැවින් මේ පිළිබඳ අන්තර්ජාලය හරහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දැනුවත් වූ බව දන්වමි.ඒ අනුව අදාල ප්‍රශ්ණාවලිය සඳහා පිළිතුරු ලබා දිය නොහැකි විය.

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2018 මාර්තු 12 වන දින PED/2017/SDG/05 දරණ ලිපිය මගින් තොරතුරු කැඳවීම සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරනු ලැබුව ද ඉහත (1)මගින් දැනුම් දුන් පරිදි ඒ පිළිබඳව දැනුවත් නොකිරීම මත නිශ්චිත කාලය තුල ඒ සඳහා පිළිතුරු දිය නොහැකි වුවද 2018 ඔක්තෝම්බර් මස 05වන දින අදාල ප්‍රශ්නාවලිය අප වෙත ලැබීමෙන් පසු ඒ සඳහා අදාල අංශ සමඟ සාකච්ඡා කර පිලිතුරු සකස් කර ඇත.

2030 න්‍යාය පත්‍රය පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අන්තර්ජාල මාර්ගයෙන් දැනුවත් වීමෙන් පසු අප ආයතනයට ගැළපෙන පරිදි තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කයන් සහ දර්ශකයන් සකස් කර අදාල අංශ දැනුවත් කර සකස් කර ඇත.

තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සකස් කර එම ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාල කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් ද ඇතුලත් කර 2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

පිළිගනිමි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අවසන් ගිණුම කලාප කාර්යාල 10 ක ප්‍රධාන අංශ දෙකක් හා තවත් සෙසු අංශ කිහිපයක විමධ්‍යගත වූ ගිණුම් ක්‍රමවේදය යටතේ පරිගණක ගත ගිණුම් පද්ධතියක් භාවිතා නොකර හස්ත ක්‍රමය (Manual System) භාවිතා කර ගිණුම් පිළියෙල කිරිම හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන මහවැලි සමාගම් වල ගිණුම්ද ඒකාබද්ධ කිරිමේදි අදාල අංශ /කලාප හා සමාගම් වල පවතින ගිණුම්මය දෝෂයන් හටගෙන පැවතුන බැවින් එවා නිවැරදි කිරිමට සිදුවිමත් ද ශේෂ පත්‍රයේ ලි බඩු සවි කිරිම් ක්ෂය කර අවසන් විම මත 2018 වර්ෂයේදි ඒවා නැවත අගයකර (Revaluation) ගිණුම් පොත්වල ගැලපිම් කිරිමට සිදුවිමත් හේතුවෙන් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරිමට ප්‍රමාදයක් සිදු විය.

### 6.2 අභ්‍යන්තර විගණන

මේ වන විට අධ්‍යක්ෂ (අභ්‍යතර විගණන ) තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරිණියක පත්කර ඇත.

### 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය.

(අ) කොන්ත්‍රාත්තුව අදාල අවසන් කාලය දීර්ඝ කිරිම වන 2018 ජුලි මස 02 දිනෙන් පසුව කොන්ත්‍රාත් පාර්ශවය විසින් කාලය දිර්ඝ කිරිමක් ඉල්ලා නොතිබු බැවින් 2018.08.15 දින කොන්ත්‍රාත් වැඩ අවසන් බවට සහතික කර බිල්පත් සමග ඉදිරිපත් කල ලිපි අනුව අවසන් කාලය දීර්ඝ කිරිමේ සිට. 2018 අගෝස්තු 15 වන දින දක්වා ප්‍රමාද ගාස්තු වශයෙන් රු 103,336.31. ක මුදලක් පළමු සහ අවසන් බිල් පතෙහි අයකර ගෙන ඇත.

ඇස්තමේන්තුව සකස් කිරිමේදි මුර කුටිය පොළොව මත ඉදිකිරිම සඳහා අදාල අයිතමයන් ඇතුලත් කර ඇස්තමේන්තුව අනුමත කර ගන්නා ලදි .නමුත් ආරක්ෂක අංශයේ එම ස්ථානයේ

සේවය කරන නිලධාරින් විසින් මෑත කාලයේ වන අලින් නිතර නිතර පැමිණීම සහ ඔවුනගේ ආරක්ෂාව සඳහා මුර කුටිය උස් ස්ථානයක ඉදි කර දෙන ලෙස ඉල්ලීමක් කිරිමෙන් අනතුරුව අනුමත ඇස්තමේන්තුවට නව අයිතමයන් එක් කිරිමෙන් සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කළ බව නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාර (තාක්ෂණ සේවා) විසින් තහවුරු කර ඇත .

ප්‍රධාන කාර්යාලයට සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අනුමත කර ගැනිමට කටයුතු කර ඇති බවත් ,ඇස්තමේන්තුව සකස් කිරිමේදි මුර කුටිය පොළව මත ඉදිකිරිම සඳහා අදාල අයිතමයන් ඇතුලත් කර ඇස්තමේන්තුව අනුමත කර ගන්නා ලදි .නමුත් ආරක්ෂක අංශයයේ එම ස්ථානයේ සේවය කරන නිලධාරින් විසින් මෑත කාලයේ වන අලින් නිතර නිතර පැමිණීම සහ ඔවුනට අලි වෙඩි වත් ලබා නොදෙන නිසා මුර කුටිය උස් ස්ථානයක ඉදි කර දෙන ලෙස ඉල්ලීමක් කිරිමෙන් අනතුරුව අනුමත ඇස්තමේන්තුව නව අයිතමයන් එක් කිරිමෙන් සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කරන ලදි .තවද කලාපයේ සිටින තාක්ෂණික නිලධාරින්ගේ පවතින පුරප්පාඩු සහ එම නිලධාරින් අවම පහසුකම් මධ්‍යයේ රාජකාරි කටයුතු වල නියෙලෙන බැවින් ඇතැම් විට නියමිත කාලයන්හි අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමට අපොහොසත් වේ .බොහෝ අවස්ථා වලට අවශ්‍ය ප්‍රගතිය ලබා ගැනිම සඳහා අත්‍යවශ්‍ය රාජකාරියක් සේ සලකා බලා නියෝජ්‍ය නේවාසික කළමණාකාර (ඉංජිනේරු) වරයාද නිලධාරින් සමග ක්ෂේත්‍රෙය් මිනුම් ගැනිම් වල නිරත විමට සිදුව ඇත.

දැනට සියලුම ඉදිකිරිම් සඳහා තත්ව පාලන වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක කරමින් පවතින අතර ඉදිකිරිම් ක්ෂ්ත්‍රයේ සිදුවන වැරදි අවම කර ගැනිම සඳහා කටයුතු කරන බව වැඩි දුරටත් අවධානය යොමු කරන බව නේවාසික ව්‍යාපාර කළමණාකර (තාක්ෂණ සේවා) තහවුරු කර ඇති බව නේවාසික ව්‍යාපාර කළමනාකරන (බි කලාපය) විසින් දැනුම් දි ඇති බව කාරුණිකව දන්වමි.

(ආ) රුහුණුකෙත සංචාරක බංගලාවේ මෙම ඉදිකිරීම් සිදු කෙරෙන අවස්ථාව වන විට අලින්ගෙන් හානි වාර්තා වී නොමැති බැවින් සාමාන්‍ය වැටක් ඉදිකර ඇත .මෙම ප්‍රදේශයේ අලින්ගේ හානි පිළිබඳව එහි නිළධාරීන්ට මනා පළපුරුද්දක් ඇති බැවින් එසේ අලි පැමිණෙන බව නිරීක්ෂණය වී තිබුණේ නම් ඒ සඳහා ඔවුන් විසින් පිළියම් යොදනු ඇත .කෙසේ වෙතත් මෙවැනි තත්ත්වයන් ඉදිරියට ඇති නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ සියළු පාර්ශවයන් දැනුවත් කිරිම සුදුසු වේ.

(ඇ) SYH/FD/37 ඉහළ තලාව වැව බෙදුම් ඇල -

මෙම කොන්ත්‍රාත්තුව 2017-10-13 වන දින ප්‍රදානය කර ඇති අතර කොන්ත්‍රාත් කාල සීමාව දින 90 ක් ද කාර්යසාධන ඇපකරය 2018-02-23 වන දින අවසන් වි ඇත .එහෙත් එම කාලය මේ වන විට 2018/2017 මහ කන්නයෙහි ජලය නිකුත් කිරීම සිදු කෙරෙමින් පැවතිණි .එච් කලාපයේ වාරි ජලය නිකුත් කරන කාල වකවානුවේ දින 07 ක ජල මුර හෝ දින 08 ක ජල මුර ක්‍රියාත්මක වන නමුදු ඉහළතලාව වැවෙහි ප්‍රධාන වශයෙන්ම ජල පාලන කටයුතු සිදු කරනුයේ

වැවට අදාල ගොවි සංවිධාන මගින් බව නේවාසික ව්‍යාපාර කළමණාකාර )එච් කලාපය (විසින් දැනුම් දී ඇත.

බොහෝ විට මෙම දින 04 ක ජල මුර ලබාගෙන දින 03ක ජල මුර නිකුත් කිරීම සිදු නොකරයි . නමුත් මෙය නිශ්චිත වශයෙන් සිදු නොවූ අතර .යම් යම් වෙනස්වීම මත කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත දිනට කිරීමට නොහැකි වී ඇත. කොන්ත්‍රාත්කරුගේ 2018-02-26 වන දින, 2018-09-25, 2018-10-01 ලිපි මඟින් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලුම් කර ඇත .කාර්යසාධන ඇපකර කාලය 2018-09-30 දක්වා ඉදිරිපත් කර එය නැවත වරක් 2018-10-31 දක්වා කාර්ය සාධන ඇපය දීර්ඝ කර ගැනීමට ලංකා බැංකුව වෙත ලිපි භාර දී ඇති බව දැනුම් දී ඇත. මෙම කොන්ත්‍රාත්තුව හුදෙක්ම ප්‍රමාද වීමට හේතු වූයේ බෙදුම් ඇල තුළ නිරන්තර ජල සැපයුම පැවතිම නිසා නේවාසික ව්‍යාපාර කළමණාකරන (එච් කලාපය) විසින් වැඩිදුරටත් දැනුම් දී ඇත.

- **නොච්චියාගම පහල මීල්ලෑව වැව -**

  මෙහි කාර්යසාධන බැඳුම්කරය 2018 පෙබරවාරි 20 වන දින අවසන් බව සත්‍යය වේ .මෙහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කිරිමට සිදු වූයේ 2018/2017 මහ කන්නය සඳහා ජලය නිකුත් කිරීම හේතුවෙන් බව නේවාසික ව්‍යාපාර කළමනාකාර) එච් කලාපය (විසින් තහවුරු කර ඇති අතර 2018/2017 ,මහ කන්නය ජලය නිකුත් කිරීම මාර්තු මස අග දක්වාම පැවතුණු අතර 2018 අප්‍රේල් අග සහ මැයි මස යල මස පුරා වර්ෂාපතනය සිදු වීම නිසා ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත 2018 .මැයි මස යල කන්නය සඳහා ජලය නිකුත් කිරීම මත ද ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත .මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නිම වූයේ 2018 අගෝස්තු මස වන අතර මෙම කාල සීමාව දක්වා ම කොන්ත්‍රාත් කාලය දිගු කිරීමට මෙම සාධක ප්‍රමාණවත් වේ .කොන්ත්‍රාත්කරු අවසන් බිල්පත් මේ වන තුරු නිම කර නොමැති අතර අවසන් බිල්පත ලබා ගැනීමට පෙර කාර්යසාධන බැඳුම්කරය ඉදිරිපත් කළ යුතුවේ.

- **පාළුගම ඇල -**

  මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යසාධන බැඳුම්කරය 2018-05-26 අවසන් වන අතර ඒ වන විට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය 90% ක ට වඩා සහ ප්‍රධාන අයිතමයන් සියල්ලම නිම කර පැවතුනි .නිර්මිත වටා පසු පිරවීම් (Back filling) හා අවට ඉදිකිරීම් අබලි ද්‍රව්‍ය පිරිසිදු කිරීම පමණක් ඒ වන විට ඉතිරිව තිබිණි .ඒ අනුව ඉහත කොන්ත්‍රාත්තුව සඳහා 2018-05-28 වන දින විට කොන්ත්‍රාත්තුව ප්‍රමාණවත් ලෙස නිම කිරීමේ සහතිකයක් ලබා දීමට කටයුතු යොදා ඇත.

  ඉහත දක්වා ඇති කරුණු මත කොන්ත්‍රාත්තුව සඳහා කාලය දීර්ඝ කිරීම සාධාරණ බැවින් ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු නොකල බව නේවාසික ව්‍යාපාර කළමණාකාර (එච් කලාපය) විසින් දැනුම් දී ඇත.

## 6.4 අයවැය ලේඛණමය පාලනය

(අ) පිළිගනිමි.
ඒ ඒ වැය විෂය යටතේ වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමා තුල කටයුතු කරන ලෙස සියළු අංශ ප්‍රධානින් දැනවුත් කරන ද අතර 2019 වර්ෂයේදි වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුල කටයුතු කිරිමට සටහන් කර ගන්නා ලදි.

(ආ) පිළිගනිමි.
2018 වර්ෂයේ ප්‍රතිපාදන ඒ ඒ කලාප /අංශ වෙත බෙදා වෙන් කිරිම සම්බන්ධයෙන් කලාප/අංශ දැනුවත් කිරිමේදි ප්‍රතිපාදන සලසා නොමැතිව කිසිම වියදමක් නොකරන ලෙස සියළුම අංශ ප්‍රධානින් වෙත ලිඛිතව දැනුම් දෙන ලදි. ඒ ඒ වැය විෂය යටතේ වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමා තුල කටයුතු කරන ලෙස සියළු අංශ ප්‍රධානින් දැනුවත් කරන ද අතර 2018 වර්ෂයේදි මෙන්ම 2019 වර්ෂයේදී ද වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුල කටයුතු කිරිමට සටහන් කර ගන්නා ලදි.

මෙම අයිතමය සඳහා අරමුදල් භාණ්ඩාගාරය වෙතින් නොලැබිම නිසා කිසිදු වියදමක් දැරිමට නොහැකි වු බව කාරුණිකව දන්වමි.

## 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරිම

ප්‍රමාදයක් සිදු වි ඇති බව පිලිගනිමි. ඉදිරියේදි මෙම තත්වය නිවැරදි කර ගැනිමට කටයුතු කරන බව දන්වමි.

## 6.7 නොවිසදි ඇති විගණන ජේද

(අ)(ආ) මේ පිලිබදව ඉදිරි ක්‍රියාමාර්ග සටහන් කර ගන්නා ලදි.

(ඇ) මේ පිළිබදව අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වි නොමැත.අධිකරණ තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කරමි.

(ඈ) මෙම සිද්ධියට සම්බන්ධ නිලධාරින් තිදෙනෙකුගේ වැඩ තහනම් කර ඇති අතර ඒ පිළිබදව විධිමත් විනය පරීක්ෂණ මේ වන විට සිදු කරගෙන යයි.නිතිමය ක්‍රියාමර්ග සඳහා මේ වන විට යොමු කර ඇත.

(ඉ) මෙම ගොඩනැගිලිවල වටිනාකම ගිණුම් පොත්වලට ගැනීමට පෙර එය තක්සේරු කල යුතු නිසා තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත. අදාල තක්සේරුව ලද විගස අදාල වටිනාකම පොත්වලට ගැනීමට කටයුතු කරමි.

## 7. පද්ධති හා පාලනයක්

අ සිට ඌ දක්වා ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.



ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

| | | | |
|---|---|---|---|
| පිටපත - | ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| | ලේකම්- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| | අධ්‍යක්ෂ- (අභ්‍යන්තර විගණන) | - | දැ.ගැ.පි. සහ අ.ක.ස |

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යසාධන වාර්තාව ආයෝජන සැලැස්ම 2017

# 1. 2017 වසර තුළ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

## 1.1 සමුච්චිත මූල්‍ය ප්‍රගතිය

2017 වර්ෂය සඳහා මූල්‍යගත මුළු ප්‍රාග්ධන ආයෝජනය රු.මි. 3,385.40.කි. 2017 වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රගතිය පහතින් දක්වා ඇත.

රු. මිලි

| විස්තරය | අය වැය ප්‍රතිපාදන | මුදා හරින ලද මුදල (2017 දෙසැම්බර් අග වන තුරු) | වියදම (2017 දෙසැම්බර් අග වන තුරු)) |
|---|---|---|---|
| **මහවැලි ව්‍යාපෘති** | **1,810.00** | **1,422.85** | **1,422.85** |
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (ඒ.අ ) | 500.00 | 433.00 | 433.00 |
| බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 150.00 | 109.00 | 109.00 |
| රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 110.00 | 79.90 | 79.90 |
| රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 115.00 | 92.68 | 92.68 |
| වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - එල් කලාපය (ඒ.අ ) | 400.00 | 316.42 | 316.42 |
| මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂා කිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම (ඒ.අ ) | 16.50 | 15.50 | 15.50 |
| හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම (ඒ.අ ) | 273.50 | 180.67 | 180.67 |
| කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 220.00 | 179.55 | 179.55 |
| කිවුල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 25.00 | 16.13 | 16.13 |
| **පරිපාලන හා නඩත්තු (ඒ.අ )** | **1,575.40** | **1,560.77** | **1,339.00** |
| **එකතුව** | **3,385.40** | **2,983.62** | **2,761.85** |

## 1.2 මහවැලි ව්‍යාපෘති

### 1.2.1 මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි 4,910 (සංශෝධිත අයවැය)

ව්‍යාපෘති කාලසීමාව : 2007-2018

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි .ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතට 1982,1986 කාලයේ ඉදිකරන ලද වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. (අ) මාදුරුඔය දකුණු ඉවුර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ යටතේ කි .මී 52 .ක් වන ප්‍රධාන ඇල , කි .මී 65 .ක් වන ශාඛා ඇලවල් ,කි .මී 459 .ක් වන බෙදාහැරීමේ ඇලවල්, කි .මි. 1,138 ක් වන කෙත් ඇලවල්, කි .මී. 54 ක් වන පරිවහන ඇලවල්, කි .මී. 80 ක් වන ග්‍රාමීය මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු, හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1986 – 1981 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය කිරීම. (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැපයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සහය ලබා දීම මෙන්ම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා (ඇ) යෝග්‍ය පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 500 න් රු. මි. 433 ක් පමණක් මහා භාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එම සම්පූර්ණ මුදලම භාවිත කර ඇත. තවද රු.මි 61.57 ක මුදලක් බැරකම් වශයෙන් පවතී.

| අංකය. | විස්තරය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 13 km |
| 02 | කෙත් ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 103 km |
| 03 | ග්‍රාමීය වැව් වැඩි දියුණු කිරීම | 05 |
| 04 | ශාඛා ඇල මාර්ග ප්‍රතිසංසකරණය (LBR1) | 2.5 km |
| 05 | පරිවහන ඇලවල් ප්‍රතිසංසකරණය/සංවර්ධනය | 42 km |
| 06 | අරලගන්විල නව රෝහල් වාට්ටු සංකීර්ණ මාර්ගයේ කොන්ක්‍රීට් ගල් ඇතිරීම. | 0.14 km |
| 07 | ගොඩනැගිලි අළුත්වැඩියාව | 10 |
| 08 | අරලගන්විල බීජ ගොවිපලේ මාළු පොකුණ නවීකරණය කිරීම | 01 |





### 1.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.935.49

ව්‍යාපෘති කාලසීමාව : 2014-2018

පොලොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයන්හි මහවැලි බී කලාපය ආවරණය කරන සිංහපුර ඉහළ කොටසේ මහවැලිතැන්න සහ මල්වැන්න මහවැලි කලාප පිහිටා ඇති අතර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලැබේ. මෙම ප්‍රදේශයන්හි ඉකුත් දශක කිහිපයේ පැවති අභ්‍යන්තර අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් නැවත පදිංචිකරුවන් බොහෝමයක් අභ්‍යන්තරික වශයෙන් අවතැන් විය. එහි ප්‍රතිපලයක් ලෙස දල වශයෙන් නැවත පදිංචි කරවූ පවුල් 1200 ක් පමණ නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වෙත ගියහ.

අර්බුදකාරී වාතාවරණය සමනය වීමත් සමගම 2014 වර්ෂයේදී මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859 ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය කිරීමට යෝජනා විය . ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) අවතැන් වූ පවුල් 859 ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය නැවත ස්ථාපිත කිරීම (ආ) දැනට පවත්නා වාරි පදනම් වූ හෙක්ටයාර 521 ක් කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම හා හෙක්ටයාර 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය කිරීම සහ (ඇ) මහවැලිතැන්න වැව හා අනෙකුත් වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත.

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 500 න් රු. මි. 109 ක් පමණක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එම සම්පූර්ණ මුදලම භාවිත කර ඇත. තවද රු.මි 28.04 ක මුදලක් බැරකම් වශයෙන් පවතී.

| අංකය. | විස්තරය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංසකරණය | 1.5 km |
| 02 | කෙත් ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංසකරණය | 7.7 km |
| 03 | වෙළඳපොළ හා ගම්මාන මාර්ග ඉදි කිරීම | 2.62 km |
| 04 | මාර්ගයේ කොන්ක්‍රීට් ගල් ඇතිරීම. | 1.16 km |
| 05 | දියමංකඩ පිවිසුම් මාර්ගය පිළිසකර කිරීම | 111 m |
| 06 | පරිවහන ඇලවල් සංවර්ධනය/හැරීම | 7.5 km |
| 07 | ග්‍රාමීය මාර්ග | 12 km |





### 1.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.1,100

ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මෙම ප්‍රදේශයේ වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කෙරේ.

2017 *වර්ෂය* සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 110 න් රු. මි. 79.90 ක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 වර්ෂය තුළදී සම්පූර්ණ මුදලම භාවිත කර ඇත. තවද රු.මි 14.48 ක මුදලක් බැරකම් වශයෙන් පවතී.

| අංකය. | විස්තරය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 2.7 km |
| 02 | වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | 3 km |
| 03 | කෘෂි ළිං සකස් කිරීම | 19 |
| 04 | පානීය ජල ළිං සකස් කිරීම | 65 |
| 05 | පුහුණු වැඩසටහන් | 11 |





### 1.2.4 රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි. 1,086

ව්‍යාපෘති කාලසීමාව : 2012-2019

**රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය සහ පදියතලාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජලාශ සහ වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ මූලික අවධානය යොමු කෙරේ.මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වනුයේ (අ ) කුඩා හා මධ්‍යම වැව් හා අමුණු පුනරුත්ථාපනය කිරීම (ආ) ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම (ඇ ) කෘෂිකාර්මික නිෂ්පාදනය 50% වැඩි කිරීම (ඈ ) පානීය ජල ළිං ඉදි කිරීම තුළින් ජල සැපයුම ( ඉ ) ළිං සහ සනීපාරක්ෂක සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙල (වැසිකිළි ඉදිකිරීම ).**

2017 *වර්ෂය* සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 115 න් රු. මි. 92.86 ක් භාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ එම මුදලම භාවිත කර ඇත. තවද රු.මි 22.32 ක මුදලක් බැරකම් වශයෙන් පවතී.

| අංකය. | විස්තරය | **2017.12.31 දිනට භෞතික ප්‍රගතිය** |
|---|---|---|
| 01 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 1.65 km |
| 02 | වැව් සහ අමුණු පිළිසකර කිරීම | 3 |
| 03 | කෘෂි ළිං සකස් කිරීම | 5 |
| 04 | පානීය ජල ළිං සකස් කිරීම | 33 |
| 05 | සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 121 |
| 06 | අලි වැටවල් ඉදි කිරීම | 2 Km |





### 1.2.5 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - එල් කලාපය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.3,957

ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

අනුරාධපුරය , වව්නියාව,මුලතිව් හා ත්‍රිකුණාමලය යන පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මහවැලි කලාපයේ සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. අවතැන් පවුල් 6,788 ක් සඳහා ගෙවතු වගාව, වාරි ඉඩම් හා අවශ්‍ය භෞතික හා සමාජ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මේ යටතේ (අ ) ගම්මාන 11 ක් තුල ගොවි පවුල් 6,788 ක් නැවත පදිංචි කරවීම (ආ ) හෙ.4,187 කෘෂිකාර්ම ඉඩම් සංවර්ධනය කිරීම (ඇ ) වෙළඳපොල හා ගම්මාන මාර්ග ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම ( ඈ ) සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

2017 *වර්ෂය* සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 400 න් රු. මි. 316.42 ක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ එම මුදල 100% මහාවිත කර ඇත. තවද රු.මි 28.50 ක මුදලක් බැරකම් වශයෙන් පවතී.

| අංකය. | විස්තරය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | ඉඩම් ලකුණු කිරීම හා මැනීම | කට්ටි 2040 |
| 02 | වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 3.5 km |
| 03 | වැසිකිළි ඉදි කිරීම | 300 |
| 04 | මහා මාර්ග ඉදි කිරීම | 25 Km |
| 05 | නළ ළිං ඉදි කිරීම | 41 |
| 06 | විසිතුරු මසුන් නිෂ්පාදනය | ටැංකි 15 |
| 07 | ගොඩනැගලි ඉදි කිරීම | 8 |





### 1.2.6 මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂා කිරීමේ වැඩසටහන

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.698.97 (සංශෝධිත)

ව්‍යාපෘති කාලසීමාව : 2013-2017

2013 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ පේරාදෙනිය ගැටඹේ ප්‍රදේශයේ ගංගා ඉවුර ආශ්‍රිතව පැවති දැඩි පාංශු ඛාදනය හේතු කොට ගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ සිට මහින්ද රාජපක්ෂ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පරිශ්‍රය දක්වා මී. 15 ක උසින් යුත් මීටර 499 දිගට ගේබියන් බැම්මක් ඉදි කිරීම මූලිකව අරමුණු කෙරේ.

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 16.5 න් රු. මි. 15.50 ක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 වර්ෂය අවසාන වන විට එම සම්පූර්ණ මුදලම භාවිත කර ඇත. තවද රු.මි 1.0 ක මුදලක් බැරකම් වශයෙන් පවතී. උද්ගත වූ පාරිසරික ගැටළු හේතුවෙන් ඉදි කිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇති අතර පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කෙරෙමින් පවතී.

### 1.2.7 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.825

ව්‍යාපෘති කාලසීමාව : 2015-2018

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන හුරුලුවැව, උඩවලව, මහවැලි කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර මාර්ග ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 273.5 න් රු. මි. 181 ක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 වර්ෂය අවසාන වන විට එම සම්පූර්ණ මුදලම භාවිත කර ඇත. තවද රු.මි 80.09 ක මුදලක් බැරකම් වශයෙන් පවතී

| අංකය. | විස්තරය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 01 | ප්‍රධාන ජලාශවලට අදාළ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය | ප්‍රධාන ජලාශ 8 න් 95% |
| 01 | 2017 වර්ෂය සඳහා පහළ යටිතල වාරි පහසුකම් ප්‍රතිසංස්කරණය | 90% |

## 1.2.8 කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.220

ව්‍යාපෘති කාලසීමාව : වාර්ෂික (01.01.2017 - 31.12.2017 )

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දේශීය කෘෂි ආනයනය අඩු කිරීමට හේතු වන දේශීය ආහාර බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පාදනය පූර්ණ වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

2017 වර්ෂය සඳහා කෘෂිකාර්මික ප්‍රමුඛතා වනුයේ බෝග විවිධාංගිකරණය, මහවැලි එල් කලාපය සඳහා සුදුසු මිරිස් වර්ග හඳුනාගැනීම, ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා වැඩසටහන්, පළතුරු ගස් සඳහා පුනරුත්ථාපන වැඩසටහන්, කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, නියඟ සහිත කාලගුණයට ඔරොත්තු දීමට කෘෂිකාර්මික ළිං ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, දේශීය ආර්ථික සංවර්ධනය සඳහා වන වැඩසටහන සහ ජල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වේ. වැඩි දියුණු කරන ලද පශු සංවර්ධන වැඩපිළිවෙල, දියර කිරි නිෂ්පාදනය, කුකුළු නිෂ්පාදන, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 220 න් රු. මි. 179.55 ක් මහභාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති අතර 2017 වර්ෂය අවසාන වන විට එම මුදල 100% භාවිත කර ඇත. තවද රු.මි 33.52 ක මුදලක් බැරකම් වශයෙන් පවතී

**කෘෂිකාර්මික භෝග වගාව**

2016 / 2017 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 56,310 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දල වශයෙන් මෙ. ටො. 290,816 ක් විය. මෙම වර්ෂයේදි මහවැලි කලාපවල සාමාන්‍යය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ. ටො.5.13 ක් වී ඇත.( ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේනතුවේ අස්වනු නෙලීමේ වාර්තා අනුව) 2017 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්. 42,621 වන අතර වාරතා වන වී නිෂ්පාදනය මෙ. ටො. 217,011 වේ. 2016 / 2017 මහ සහ 2017 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ. ටො. 507,828 වේ.

අනෙකුත් බෝග වගා කිරීම ( අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පළතුරු,එළවළු සහ නිත්‍ය භෝග) හෙක්. 43,414 ක් වූ අතර එය සෝයා බෝංචි හෙක්. 5,960 ක්ද, බඩ ඉරිඟු හෙක්. 3,369 ක්ද, ලොකු ළූණු හෙක්. 1,204 ක්ද මිරිස් හෙක්. 588 ක්ද, කළු කව්පි හෙක්. 1,572 ක්ද, කව්පි හෙක්. 593 ක් සහ රට කජු හෙක්. 629 වශයෙන් සමන්විත විය. තවද, හෙ. 13,130 ක් පලතුරු ද හෙ. 6,322 නිත්‍ය භෝග ද වගා කොට ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මෙම කාලය තුළදී වී අස්වැන්න 21% සෝයා බෝංචි 95.4%, ලොකු ළූණු 50% හා කළු කව්පි 31 % ආදී වශයෙන් දේශීය කෘෂී නිෂපාදන හා සංවර්ධනය කාර්යයන් හිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඉතා ඉහළ දායකත්වයක් දරයි.

**කිරිගව සංවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ .මහවැලි කලාපවල කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශයේ වගකීම වේ .

2017 වර්ෂය මෙම කාලය තුළදී මහවැලි ප්‍රදේශවල 110,830 ක මුළු ගව ගහනයක් වාර්තා වූ අතර එම කාලය තුළ දල වශයෙන් කිරි ලීටර් මිලියන 29.4 ක් පමණ නිෂ්පාදනය කර ඇත.

මෙම කාලපරිච්ඡේදය තුළදී ගව ගාල් 157 ක් ඉදි කරන ලද තවද සත්ව අභිජනන හැකියාව වැඩිදියුණු කිරීම යටතේ අභිජනනන මධ්‍යස්ථාන 23 ස්ථාපනය කරන ලදී. තවදුරටත් ආදර්ශ ගොවිපළ සඳහා ජංගම කිරි දෙවීමේ යන්ත්‍ර 22 ක් බෙදා දී අවසන් අතර සත්ව සායන හා එන්නත් වැඩසටහන් 66 ක් පවත්වා ඇත.

නැවුම් කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා "කිරි සතිය" වැඩසටහන් 21 ක් මෙම වර්ෂය තුළ පවත්වා ඇති අතර පාසල් ළමුන්, ගොවීන් හා නිලධාරීන් සඳහා පුද්ගල සංවර්ධන වැඩසටහන් 82 පවත්වා ඇත.

**මිරිදිය මත්ස්‍ය කර්මාන්තය හා විසිතුරු මත්ස්‍ය රෝපණය**

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්වය නැංවීමෙහි ලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. 2017 වර්ෂය තුළදී මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො. 15,102 ක් ලෙස වාර්තා විය. මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම සඳහා මාළු ටැංකි 657,000 ක් ද අභිජනන මධ්‍යස්ථාන 04 ක් ඉදිකර ඇති අතර ධීවර අම්පන්න කට්ටල 75 ක් ද ස්ථාපනය කර ඇත.. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අදාළ කාල පරිච්ඡේදය තුළ සඳහා මඩ පොකුණු 82 ක් හා සිමෙන්ති ටැංකි 18 ක් ඉදි කර ඇත. තවදුරටත් ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම සඳහා ගොවි සමිති 11 ක් 2017 ජනවාරි සිට දෙසැම්බර් කාලපරිච්ඡේදය තුළ ස්ථාපනය කර ඇත.

## 1.3 නඩත්තු සහ සංවර්ධනය

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළ හෙක්. 106,876 ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 479 කින් සමන්විත කි.මී. 10,021 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර පවුල් 300,000 කට වැඩි ප්‍රතිලාභ සපයනු වස් මහවැලි මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ උන්නතිය උදෙසා සඵලදායී අයුරින් ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු මෙන්ම මහවැලි ජනපද ප්‍රදේශවල ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා 2017 වසරට අය වැය ප්‍රතිපාදන රු.මි. 1,575.40 ක් වන අතර මෙම වර්ෂය තුළදී එයින් රු. මි. 1339 (85%) ඵලදායී ලෙස යොදවා ඇත.

### 1.3.1 වාරිමාර්ග පද්ධතිය නඩත්තුව

දෙවනි වර කැලෑ එළි කිරීම, වාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු යටතට ගැනේ. 2017 වසර සඳහා රු.මි. 370.81ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉන් රු.මි. 285.81 (77%) ක් ඵලදායී අයුරින් වැය කර ඇත.

මහවැලි කලාප තුළ ගොවි සංවිධාන 1,036 ක් ක්‍රියාත්මකව පවතින අතර බෙදා හැරීමේ ඇළ පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු ඉහළ ක්‍රියාශීලීත්වයකින් යුත් ගොවි සංවිධාන 10 ක් වෙත පවරා දීම 2017 වර්ෂය තුළදී සිදු කර ඇත. තවද, ආයතනික සංවර්ධන අංශයේ උපදෙස් මත 2017 වර්ෂයේදී ගොවි සංවිධාන10 ක් වාණිජ මට්ටමට ඉහළ නංවන ලදී.

### 1.3.2 ඉඩම් ප්‍රදානය

ඉඩම් ඔප්පු 1,000,000 වැඩසටහනේ ප්‍රගතිය

| කලාපය | ඉලක්කය | 2017.12.31 දිනය ප්‍රගතිය ප්‍රදාන පත්‍ර/බලපත්‍ර/ දීර්ඝකාලීන බදු |
|---|---|---|
| බී | 25,600 | 25,533 |
| සී | 17,700 | 26,360 |
| ඩී | 2,800 | 444 |
| එච් | 12,500 | 8,729 |
| එල් | 8,600 | 7,816 |
| මොරගහකන්ද | 3,600 | 3,522 |
| වික්ටෝරියා | 2,800 | 3,299 |
| හුරුළුවැව | 4,100 | 2,119 |
| වලව | 18,500 | 19,683 |
| රඹකැන්ඔය | 3,800 | 2,568 |
| **එකතුව** | **100,000** | **100,073** |

### 1.3.3 ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය, ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජනපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචිකරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව, පදිංචි කරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදි.

ඒ අනුව 2017 ජනවාරි සිට දෙසැම්බර් කාල පරිච්ඡේදය තුළ ආයතනික සංවර්ධන වැඩසටහන් 4,406, ප්‍රජා සංවර්ධන වැඩසටහන් 572, කාන්තා අභිවෘද්ධියට අදාළ වැඩසටහන් 82 ක් පැවැත්වීමට හැකියාව ලැබිණි.

### 1.3.4 වනාන්තර හා පරිසරය

**වනාන්තර හා පරිසර සංරක්ෂණය**

පාරිසරික අංශය විසින් මහවැලි ප්‍රදේශ වල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය අඛණ්ඩව සිදු කරනු ලබයි. ජාතික පාරිසරික වැඩසටහන යටතේ වන "පුනරුදය" තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රමුඛතා ලබා දෙමින් පරිසර අමාත්‍යාංශය මහවැලි ප්‍රදේශ තුළ හරිත සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටියි. වනාන්තර හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා වන වාර්ෂික ප්‍රතිපාදන රු.මි. 30.12 ක් වන අතර ඉන් රු.මි. 30.2 (100%) ක් 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැය කර ඇත.

ස්වාභාවික සම්පත් සංරක්ෂණය යටතේ වගා පස් 1400 *m* ක් සංරක්ෂණය කරන ලදී. පැල තවාන් කළමනාකරණය හා පැල නිෂ්පාදන වැඩසටහන යටතේ පැල 485,765 ක් නිෂ්පාදනය කරන ලද අතර ප්‍රදේශයේ වන ඝණත්වය ඉහළ නැංවීමේ අරමුණින් පැල 106,736 ක් රෝපණය කරන ලදී. ජලයේ ගුණාත්මකභාවය මැනීමට හා වැඩි දියුණු කිරීමට මෙම වර්ෂය තුළදී ජලයේ ගුණාත්මකභාවය මැනීමේ මධ්‍යස්ථාන 19 ක් හා රොන් මඩ මැනීමේ මධ්‍යස්ථාන 07 ක් ස්ථාපනය කරන ලදී.

පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 87 ක් පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් මෙම කාලය තුළදී පවත්වා ඇති අතර මහවැලි ප්‍රදේශවල දැඩි ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීමට හා කළමණාකරණය කිරීමට වැව් 22 ක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මහවැලි ප්‍රදේශවල අලි මිනිස් ගැටුම පාලනය කරනු වස් 2017 වර්ෂය තුළදී කි.මී. 31 ක අලි වැටක් ඉදි කරන ලද අතර කි.මී 75 ක අලි වැටක නඩත්තු කටයුතු සිදු කරන ලදී.

### පුනර්ජනනීය බල ශක්ති නිෂ්පාදනය වැඩි කිරීම (කුඩා ජල විදුලිබල ව්‍යාපෘති)

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 20 ක් ඉදි කිරීම තුළින් මෙ.වො.53.93 ක් සමස්ථ ජල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදන කිරීමට අපේක්ෂිත කෙරේ. මෙයින් ව්‍යාපෘතීන් 16 ක් සඳහා පාරිසරික තක්සේරු වාර්තා අනුමැතිය ලබාදී ඇති අතර 2017 වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 11 ක් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර ඒවායේ ධාරිතාවය මෙ.වො. 33.4 කි.

### 1.3.5 ව්‍යාපාර සංවර්ධනය

නවීන ගෘහ භාණ්ඩ සහිතව සංචාරක බංගලා 07 ක නවීකරණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර අන්තර්ජාලය හරහා නවාතැන් පහසුකම් වෙන් කර ගැනීම සඳහා සංචාරක බංගලා 14 මේ වන විටත් තිබේ.





කොත්මලේ රුහුණුකෙත පොල්ගොල්ල

**මහවැලි කලාපයන්හි පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවස්ථා**

2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මහවැලි කලාපයේ නව ආයෝජන සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් 20ක් සඳහා අනුමැතිය ලබාදී ඇත.

| | |
|---|---|
| ආයෝජන ව්‍යාපෘති | 13 |
| පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය (සූරිය/ජෛව ස්කන්ධ) | 7 |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගයෙන් සංවිධානය කරන ලද "මහවැලි සවිය" ණය වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් මගින් කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් 181 දෙනෙක් සඳහා රු. මි. 36.65 ක් ලබාදී ඇත. 2017 වර්ෂය තුළදී "මහවැලි දිරිය" විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ගොවි සංවිධාන 11 කට ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහා රු. මි. 15.4 ක් ලබා දීමට හැකියාව ලැබිණ.

### 1.3.6 සුදුසු රාජකාරි පරිසරයක් සඳහා පහසුකම් සැලසීම

#### I. මානව සම්පත් සංවර්ධනය/නව බඳවා ගැනීම්/කාර්ය මණ්ඩල උසස් වීම්

කාර්යක්ෂම මෙන්ම ඵලදායී සේවාවක් සැපයීම සඳහා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටිවලට අනුව නව බඳවා ගැනීම් බොහෝමයක් ඉටු කර ගැනීමට අධිකාරියට හැකියාව ලැබී ඇත.

| | |
|---|---|
| අනුමත කාර්යය මණ්ඩලය | 4,624 |
| 2017.12.31 දක්වා පුරප්පාඩු සංඛ්‍යාව | 434 |
| 2017 වර්ෂය තුළ බඳවා ගැනීම් | 268 |
| 2017 වර්ෂය තුළ අභ්‍යන්තර උසස් වීම් | 212 |

**ii. පුහුණු වැඩසටහන්**

සේවකයන්ගේ හැකියාවන් හා දැනුම් මට්ටම ඉහළ තලයකට ගෙන එමින් ශක්තීන් වැඩි දියුණු කිරීම සඳහා අධිකාරියේ පුහුණු අංශය මගින් විවිධ විෂයයන් යටතේ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

| | සහභගී වූ සංඛ්‍යාව |
|---|---|
| විවිධ විෂයයන්ට අදාළ වූ පුහුණු වැඩ සටහන් (21) | 87 |

## 1.3.7 නෛතික බලාත්මක කිරීම

2017 වර්ෂය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් යටතේ නිති අංශය මගින් නඩු 93 ක් සම්බන්ධ කටයුතුවල නිරත වූ අතර වැඩ මූලික වශයෙන් නඩු වාර 14 ක් සඳහා සහභාගි විය. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පවත්නා ඇතැම් නඩු විසඳීම සඳහා නීති සාකච්ඡා වට 03 ක් පවත්වා ඇත. තවද, අළුතින් නඩු 04 පනවා ඇති අතර නඩු 02 ක කටයුතු අවසන් කර ඇත.

## 1.3.8 ජල කළමනාකරණය

ලං.වි.ම, ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමග අවශය සම්බන්ධීකරණය කටයුතු කරමින් කෘෂි කර්මාන්තය, ජල විදුලිය හා පානීය මෙන්ම අනෙකුත් ජල අවශ්‍යතා සඳහා මහවැලි ජලාශවල ජල සම්පත් ඵලදායී අයුරින් භාවිත කරන බවට ජල කළමනාකරණ ලේකම් කාර්යාලය සහතික වේ. එමෙන්ම ජල කළමනාකරණ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ජල කළමනාකරණ ලේකම් කාර්යාලය ඒ සඳහා තොරතුරු හා නිර්දේශ ලබා දේ.

මහවැලි ජලාශවල ජලය ගබඩා කර තැබීමේ ධාරිතාව

| ජලාශ | උපරිම ධාරිතා මට්ටම (ස.මී.මි) 2017 |
|---|---|
| කොත්මලේ | 139 |
| පොල්ගොල්ල | |
| වික්ටෝරියා | 551.3 |
| රන්දෙනිගල | 680.9 |
| රන්ටැඹේ | 5.2 |
| බෝවතැන්න | 11 |
| උඩ වලව | 233.3 |
| දඹුලු ඔය | 10.3 |
| කණ්ඩලම | 23.2 |
| කලාවැව | 78.6 |
| උල්හිටිය/රත්කිඳ | 130.3 |
| මාදුරුඔය | 371.7 |
| **එකතුව** | **2,234.8** |

### 1.3.9 අභ්‍යන්තර විගනණය

අධිකාරියේ කාර්යයන් සමබන්ධයෙන් කාර්යක්ෂමතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර විගනණ අංශය මගින් මෙම වර්ෂය තුළදී විගනණ වාර්තා 17 ක් හා විගනණ විමසුම් වාර්තා 21 ක් නිකුත් කර ඇත

## 2. මහවැලි ජලාශවල බල ශක්ති උත්පාදන ධාරිතාව

| **ජලාශය** | **මුළු ධාරිතාව *(දල වශයෙන්)* (*MCM*)** | **මුළු බල ශක්ති ධාරිතාව (*MW*)** | **බල ශක්ති උත්පාදනය *2017* ජන. – දෙසැම්බර් *(GWh)*** |
|---|---|---|---|
| කොත්මලේ | 174 | 201 | 300.48 |
| පොල්ගොල්ල | 4 | - | |
| වික්ටෝරියා | 722 | 210 | 287.952 |
| රන්දෙනිගල | 860 | 126 | 141.713 |
| රන්ටැඹේ | 7 | 49 | 84.20189 |
| උල්හිටිය/රත්කිඳ | 146 | - | |
| මාදුරුඔය | 596 | - | |
| බෝවතැන්න | 23 | 40 | 66.093 |
| උඩවලව | 268 | 6 | 3.23712 |
| උකුවෙල (විදුල බලාගාරය පමණි) | | 40 | 154.782 |
| **එකතුව** | **2,800** | **672** | **1,038.46** |

## 3. 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ

| ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය හා දිනය | | මාතෘකාව | අමාත්‍ය මණ්ඩල තීරණය |
|---|---|---|---|
| අංකය | දිනය | | |
| 24/11/2017 | අංක.043/704/2494/17 | කරල්ලියද්ද නගර සංවර්ධන සැලැස්ම යටතේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම- මහනුවර දිස්ත්‍රික්කය | අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 වන ඡේදයේ 3.1, 3.1 හා 3.3 නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීමට තීරණය විය. |
| | අංක.2017/40 | මහවැලි ඊ කලාපය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විශේෂ කලාපයක් ලෙස ප්‍රකාශයට ලත් කිරීම | |
| 05/07/2017 | අංක.-009/704/1298/17I | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන මගින් පාලනය වන ඉඩම්වලින් රජයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යවන ගල්, වැලි, පස් සහ බොරළු සපයා ගැනීම. | **i.** අමාත්‍ය මණ්ඩල සංදේශ අංක. 17/0530/704/009 සඳහා 2017.03.31 ලබා දුන් අනුමැතිය තාවකාලිකව අත් හිටුවීමට අනුමැතිය ලබා දුන් අතර අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් වූ පරිදි එතෙක් අදාළ කටයුතු සිදු කර ගෙන යාම සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශය යටතේ පවතින තාක්ෂණික සේවා ආයතනය සියලු ආකාරයෙන් සන්නද්ධ කිරීමට හා<br>**ii.** ඉහත (i) තීරණය සම්බන්ධයෙන් අදාළ අධිකාරයන් සහ අනෙකුත් පාර්ශව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැනීමට |